ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சு
Ministry of National Policies and Economic Affairs

# 2016

# වාර්ෂික වාර්තාව
# ஆண்ட றிக்கை
# Annual Report

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதியச் சபை
Employees' Trust Fund Board

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
தெசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சு
Ministry of National Policies and Economic Affairs

# වාර්ෂික වාර්තාව
# 2016

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதியச் சபை
Employees' Trust Fund Board

**සේවා නියුක්තයනගේ භාර අරමුදල් මණ්ඩලය**
වාර්ෂික වාර්තාව 2016

© සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

PRINTEC
ESTABLISHMENT

**# 52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ**
දුරකථන: 0112 815 816
ඊමේල්: sales@printec.lk
වෙබ්: www.printec.lk

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**

**වාර්ෂික වාර්තාව 2016**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
1 වන මහළ, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05
දුරකථන: 011 2581704   ෆැක්ස්: 011 2806832
Email: finance@etfb.lk | Web: www.etfb.lk

# පටුන


**ප්‍රධාන පිටු**
සංස්ථාපිත දළ විශ්ලේෂණය 6 ආයතනික භාරකාරීත්වය 26 මූල්‍ය තොරතුරු 40

**සංස්ථාපිත දළ විශ්ලේෂණය**
මෙම වාර්තාව ගැන 8 අපිව හඳුනාගනිමු 9 අපගේ වටිනාකම් 10-11 ආයතනික සමාලෝචනය 12-14
ප්‍රධාන මූල්‍ය තොරතුරු 15-17 වසර 2016 සංක්ෂිප්ත සටහන 18 1981 - 2016 දක්වා විශේෂ අවස්ථා 20-21
පසුබිම් විශ්ලේෂණය 22-24

**ආයතනික භාරකාරීත්වය**
අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය 28 සභාපතිවරයාගේ පණිවිඩය 29-30 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය 31-32 පාලනය පිළිබඳ වාර්තාව 33-37 අවධානම් කළමනාකරන වාර්තාව 38-39

**මූල්‍ය තොරතුරු**
විස්තීරණ ආදායම් ප්‍රකාශනය 43-44 මූල්‍ය තත්ව ප්‍රකාශනය 45 ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය 46-49
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 50 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති 51-82

**විගණකාධිපති වාර්තාව 84-102**

**විගණකාධිපති වාර්තාව 2016 සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම් 104-118**

**සංඛ්‍යාණමය ඇමුණුම් 362-365**

**වෙනත් ඇමුණුම් 367**




# සංස්ථාපිත දළ විශ්ලේෂණය


01 මෙම වාර්තාව ගැන

02 අපිව හඳුනාගනිමු

03 අපගේ වටිනාකම්

04 ආයතනික සමාලෝචනය

05 ප්‍රධාන මූල්‍ය තොරතුරු

06 වසර 2016 සංක්ෂිප්ත සටහන

07 විශේෂ අවස්ථා

08 පසුබිම් විශ්ලේෂණය

01

# මෙම වාර්තාව ගැන



මෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 36 වන වාර්ෂික වාර්තාව වන අතර, ඒ තුලින් 2016 වසරේදි මූලික වශයෙන් තම සාමාජිකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ලබා දුන් ප්‍රතිලාභ පිළිබඳව පුළුල් විග්‍රහයක් සිදුකර ඇත. මෙම වාර්තාව තුළින් ආයතනයේ වටිනා පාර්ශවකරුවන් සඳහා කෙටිකාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන වශයෙන් නිර්වචනය කර ඇති වටිනාකම් පිළිබඳව විග්‍රහයක් කිරීම ඉලක්ක කර ඇත. එසේම, වර්තමානයේදී ආයතනයේ උපාය මාර්ග, යහපාලනය සහ අරමුදල් කළමනාකරනය පිළිබඳ සන්නිවේදනය වන ආකාරය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරනු ලබන අතර, එහි මූල්‍ය ප්‍රගතිය සහ නිර්වචනය වී ඇති සාමාජික පසුබිම පිළිබඳව ඉදිරිපත් කිරීමක් සිදුකර ඇත.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කර ඇත. සේ නි භා අරමුදල් පනත සහ ප්‍රශස්ථ යහපාලන මූලිකාංග මත පිහිටා එම ක්‍රියාවලියට අනුගතවීම සම්බන්ධයෙන් යහපාලනය පිළබද වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දෙආකාරයේම දත්ත ඇතුලත් කර වාර්තාව පිළියෙල කර ඇති අතර, සන්සන්දනාත්මක පැහැදිලි කිරීම් සහ තවදුරටත් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය තැන් වලදී ප්‍රමාණාත්මක දත්ත උපයෝගි කරගෙන ඇත. මූල්‍ය ප්‍රකාශන සහ ආශ්‍රිත සටහන් රජයේ විගණකාධිපතිවරයා විසින් විගණනයට ලක්කර ඇති අතර, විගණන වාර්තාව අපගේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇත.

අපගේ 2016 වාර්ෂික වාර්තාව තුළ 2016 ජනවාරි 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වා ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශිය කාර්යාලවල මෙහෙයුම් තොරතුරු අන්තර්ගත කර ඇති අතර, 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂයේ තොරතුරු සමඟ සන්සන්දනාත්මකව ඉදිරිපත් කර ඇත. ආයතනයට සහ එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ප්‍රමාණාත්මක වශයෙන් වැදගත් වන තොරතුරු ඇතුලත් කර මෙම වාර්තාව පිළියෙල කර ඇත.

02

# අපිව හඳුනාගනිමු



සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත මගින් ස්ථාපනය කර ඇති අතර, එහි මෙහෙයුම් කටයුතු 1981 මාර්තු 01 වන දින ආරම්භ විය. මෙම ආයතනය ආරම්භයේදී කම්කරු අමාත්‍යාංශය අධික්ෂණය යටතේ ස්ථාපිත කරන ලද අතර, 1997 වසරේදී මුදල් අමාත්‍යාංශයේ අධික්ෂණය යටතට පත්කල අතර, වර්තමානයේදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සියළුම රාජ්‍ය අංශයේ සේවකයන් සහ සියළු පුද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර, අදාල සේවායෝජකයින් විසින් සේවකයාගේ දළ ඉපයීම් වලින් 3% කට සමාන ප්‍රමාණයක් මාස්පතා මෙම අරමුදලකට බැරකල යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව සේවකයා වෙනුවෙන් සේවායෝජකයා විසින් දායක මුදල් ගෙවන සේවකයා දායකත්වයක් නොවන අරමුදලක් ලෙස ප්‍රතිලාභ ලැබිමට හිමිකම් කියති. ආර්ථිකයට විශාල දායක්තවයක් සපයනු ලබන ස්වයං රැකියා ලාභින් සහ විදෙස්ගත සේවකයින් මෙම අරමුදල් සාමාජිකයින් ලෙස බඳවා ගැනිමට විශේෂ අවධානයක් යොමු කරන ලදි.

**මණ්ඩලයේ අරමුණු:**

(අ) මුල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගී වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රික ප්‍රවර්ධනය කිරීම

(ආ) ව්‍යවසායන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දයක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ

(ඈ) මේ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උපකාරී විය හැකි අන් සියළු ක්‍රියා හෝ දේවල් කිරීම

# 03

# අපගේ වටිනාකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය



## වටිනාකම්

- නිර්මාණශිලි නව්‍යකරණයෙන් සහ කැපවීමෙන් යුතු කාර්ය මණ්ඩලය
- ජනතාවට සුහදශීලී සේවා වටපිටාව
- සහයෝගීතාව සහිත ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්
- විශිෂ්ඨ ක්‍රමවේද සහ ක්‍රියා පිළිවෙත්
- ඉහළ මූල්‍ය ස්ථාවරත්වය සහ
- තෘප්තිමත් පාරිභෝගිකයින්

## දැක්ම


ආයතනික විශිෂ්ඨත්වය තුළින්
සමස්ථ පාර්ශව කරුවන් සඳහාවූ
ක්‍රියාශිලි හා ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම

## මෙහෙවර

සාමාජිකයන් සඳහා වූ පුළුල් පරාසයකවූ මූල්‍ය ප්‍රතිලාභ
හා විශිෂ්ඨ සේවාවක් සලසන සුහදශිලී හා
විචක්ෂණශිලී භාරයක් වීම

04

# ආයතනික **සමාලෝචනය**



භාරකරුවකුගේ හෙවත් ආරක්ෂකයෙකුගේ කාර්ය භාරය සාක්ෂාත් කිරීම සඳහා වූ මනාව සැදුම් ලත් සම්මුතිගත ආයතනික ව්‍යුහයක් ස්වකීය වර්තමාන සේවා සන්දර්භය තුළ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හිමිකර ගනු ලැබ ඇත. මණ්ඩලීය කළමනාකරණයේ අභිලාෂය වනුයේ, මෙම ආයතනය අනාගතයේදී වඩාත් ඵලදායි මූල්‍ය ආයතනයක් වනු පිණිස එම අරමුණ කරා මෙහෙයවීමය. මණ්ඩලයේ සංවිධානමය ව්‍යුහය පිළිබඳව පනත තුළින් නිශ්චිත කිසිවක් ප්‍රකාශ නොවේ. එසේ වුවද, පනතේ 5 වන වගන්තිය යටතේ සඳහන් කරනු ලැබ ඇත්තේ මණ්ඩලයට ස්වකීය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම සඳහා නීතිරීති සම්පාදනය කර ගත හැකි බවය.

අරමුදලේ කටයුතු කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජික සාමාජිකාවන් 9 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් 4 දෙනෙකු අදාළ විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර මුදල් හා වෙළෙඳ යන විෂයන් භාර අමාත්‍ය වරයා විසින් නම් කරනු ලබන එක් අයෙකු බැගින් වූ සාමාජිකයන් දෙදෙනෙකුද, ලංකා හාම්පුතුන්ගේ සංගමය මගින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකුද, සාමාජික සංඛ්‍යාව 100,000 කට වැඩි සේවක පිරිසක් සිටින එක් එක් වෘත්තීය සමිති අතුරින් සාමාජිකයන් දෙදෙනෙකුද තවදුරටත් ඊට ඇතුළත් වේ.

මණ්ඩලයේ සභාපතිවරයා අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි තෝරා ගනු ලබන අතර පනත මගින් විධිවිධාන සලසා ඇති පරිදි ඔහු අදාළ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද කටයුතු කළ යුතු වන්නේ ය.

සේවා යෝජකයන්ගෙන් බහුතර පිරිසක් බස්නාහිර පළාත කේන්ද්‍රකර ගනිමින් සේවය කළ හෙයින් ආරම්භයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මධ්‍යගත ආයතනයක් ලෙස ව්‍යුහගතකොට ක්‍රියාත්මක කෙරිණි. වැඩි සඵලතාවක් සහිත ප්‍රදේශ තුළ ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල විවෘත කිරීමත් සමඟ ප්‍රාදේශීය කාර්යාල සේවා ජාලය ආශ්‍රිත ප්‍රතිව්‍යුහගතකිරීමේ වැඩ සටහන නිම කරනු ලැබීමෙන් පසුව බලාත්මක කිරීමේ කටයුතුවල හා නීතිමය කටයුතුවල සීඝ්‍ර සංවර්ධනයක් සිදු විය. පසු කාලීනව, හිමිකම් ඉල්ලුම්පත් භාර ගැනීම, හිමිකම් ගෙවීම සහ සාමාජික සාමාජිකාවන් දැනුවත් කිරීම ආදී බොහොමයක් සාමාජික කටයුතු විමධ්‍යගත කරන ලදි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කෘත්‍යාත්මක කාර්ය ක්ෂේත්‍රයන්, මෙහෙයුම් කටයුතු සහ සහයක සේවා යනුවෙන් පුළුල් වශයෙන් බෙදිය හැකිය. මෙහෙයුම් කටයුතු හඳුනා ගැනෙනුයේ රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන වශයෙනි. පරිපාලන හා මානව සම්පත්, මුදල්, තොරතුරු තාක්ෂණ සහ අභ්‍යන්තර විගණන කටයුතු සහයක සේවා වශයෙන් හඳුනා ගනු ලැබ තිබේ.

පනතෙහි නිශ්චිතව සඳහන් පරිදි, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කිරීමේ බලය සභාපතිවරයා සතුව ඇත. සාමාන්‍යාධිකාරී වරයා සහ අතිරේක සාමාන්‍යාධිකාරී වරයා ප්‍රධානවිධායක නිලධාරී වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරනු ඇත. එක් එක් කෘත්‍යාත්මක කාර්ය ක්ෂේත්‍රයක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයකුගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. සභාපතිවරයාගේ/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ කටයුතුවලට සහය වනු පිණිස ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් ද ස්ථාපනය කර ඇත.

ඒ අනුව බලන කළ, ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය සහතික කෙරෙනු පිණිස සර්වග්‍රාහී ආයතනික ව්‍යුහයක් සකසනු ලැබ තිබේ.

**මණ්ඩලයේ කොට්ඨාශ/ අංශවල කාර්යභාරය**

### 1. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා කොට්ඨාශය

පෞද්ගලික අංශයේ සියළුම සේවකයින් සහ විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන සියළුම රාජ්‍ය අංශයේ සේවකයන්ගේ දළ ඉපයීම් වලින් 3% කට සමාන ප්‍රමාණයක් දායක මුදල් ලෙස මෙම අරමුදලට ගෙවීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයකි. නියමිත කාලය තුළ දායක මුදල් රැස්කිරීම, අධිභාර අයකර ගැනීම, දායක මුදල් පැහැර හරින්නන් සහ නොගෙවන ආයතන හඳුනා ගැනීම, එවැනි ආයතන වලට එරෙහිව නීතිමය පියවර ගැනීම ආදිය මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්යයන් ලෙස සැලකිය හැකිය. ඒ අනුව, ඉහත සියළුම රැස්කිරීම් ඉලක්ක ඉටුකිරිම රැස්කිරීම් හා සේවායෝජක සබඳතා කොට්ඨාශයේ කාර්ය භාරය ලෙස සැලැකිය හැක.

### 2. ආයෝජන අංශය

ආයතනයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන කොට්ඨාශයක් ලෙස ආයෝජන කොට්ඨාශය සලකනු ලබන අතර, අරමුදලේ ආයෝජන කළඹ ඵලදායි ලෙස කළමනාකරනය කිරිමේ වගකීම මෙම කොට්ඨාශය විසින් දරණු ලබයි. ඒ අනුව ආයෝජන වල සුරක්ෂිත භාවය තහවුරුකර ගනිමින් ප්‍රශස්ථ ප්‍රතිලාභයක් උපයා ගැනීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන අරමුණ ලෙස සලකයි. මෙම ආයෝජන සිදුකිරීමට මාර්ගෝපදේශයක් ලෙස ආයතනය විසින් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයක් හඳුන්වා දී ඇත.

### 3. සාමාජික සේවා කොට්ඨාශය

සාමාජික ගිණුම් පවත්වාගෙන යෑම සහ ඒවා යාවත්කාලීන කිරීම, වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම, සාමාන්‍ය සහ මරණ ප්‍රතිලාභ ගෙවීම් සහ අනෙකුත් ප්‍රතිලාභ ගෙවීම් කඩිනමින් සිදුකිරීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය ලෙස සැලකිය හැක. එසේම මෙම කොට්ඨාශයේ කටයුතු තවත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

### 4. මුදල් කොට්ඨාශය

මාසික සහ වාර්ෂික ගිණුම් පිළියෙල කිරිම, වාර්ෂික අයවැය ලේඛණ පිළියෙල කිරීම, රජයේ බදු ඇතුළුව සේවක වැටුප් සහ අනිකුත් වියදම් ගෙවීම, රජයේ විගණන විමසීම් සම්බන්ධිකරණය කිරිම, ආයතනික සැලැස්ම සහ අනෙකුත් කළමනාකරණ තොරතුරු වාර්තා සැපයිම, මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය යටතට ගැනේ.

### 5. පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශය

වර්තමාන තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුල, නවීන මානව සම්පත් කළමනාකරන ශිල්පීය ක්‍රම වලට අනුගතවීම, කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබේ. සේවා සපයන ආයතනයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කාර්යයන් බොහෝමයක් එහි සේවක මණ්ඩලය මත රඳා පවතී. එමනිසා පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශයේ කාර්යයන් වැඩි දියුණු කිරිම සඳහා ඉතා ඉහළ පුමුඛස්ථානයක් දී කටයුතු කරනු ලබයි. එබැවින් මෙම කොට්ඨාශයේ කටයුතු වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරිම සඳහා විවිධ පියවරයන් ගෙන ඇති අතර, කාර්ය මණ්ඩලයේ පුහුණු කිරිම් සඳහා වැඩි අවධානයක් යොමුකර ඇත.

### 6. තොරතුරු තාක්ෂණ කොට්ඨාශය

සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කිරිම සහ පවත්වා ගෙන

යාම තොරතුරු තාක්ෂණ කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වේ. එම අංශය තවදුරටත් ආයතනයේ විවිධ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීමට හැකි වන පරිදි ප්‍රතිස්ථාපනය (ප්‍රතිව්‍යුහගත) කර ඇත.

### 7. අභ්‍යන්තර විගණන කොට්ඨාශය

ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී ඇති බවටත් සහ ඒවා නියමිත පරිදි ක්‍රියාත්මක වීමක් සහතික කර ගැනීම, අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය ලෙස සලකනු ලැබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) සෘජුවම ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරනු ලබයි. අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ දැනට පවතින පද්ධති හා ක්‍රමවේද පිළිබඳ ප්‍රමානවත්භාවය නැවත සමාලෝචනය කර, එම අංශය ආයතනයේ තීරන ගැනිමේ ක්‍රියාවලිය තුළ ඵලදායි උපකරණයක් ලෙස ශක්තිමත් කිරීමට කළමනාකරණය අදිටන් කරගෙන සිටී.

### 8. නීතී අංශය

මණ්ඩලයේ නීතිමය අවශ්‍යතාවයක් සඳහා උපදේශන සේවා සපයන අංශයක් ලෙස නීති කොට්ඨාශය ක්‍රියාත්මක වේ. ප්‍රාදේශිය කාර්යාල ජාලය පුළුල් කිරීමත් සමගම මෙම අංශයේ කටයුතු ප්‍රාදේශිය මට්ටම දක්වා විමධ්‍යගත කොට ඇත. ඒ අනුව, එක් ප්‍රාදේශිය කාර්යාලයක් ආවරණය කිරීම සඳහා එක් නීති නිලධාරියෙකු බැගින් පත්කර ඇත. නීති අංශය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවායෝජක සබඳතා) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

### 9. සැලැසුම් පර්යේෂණ සහ සංවර්ධන කොට්ඨාශය


සෑම වර්ෂයක් සඳහාම මණ්ඩලයේ ආයතනික සැලැස්ම පිළියෙල කිරීම, අධීක්ෂණය කිරීම, යාවත්කාලීන කිරීම සහ නැවත සමාලෝචනය කිරීම, මාසිකව සහ කාර්තුමය වශයෙන් සහ වාර්ෂිකව මණ්ඩලයේ ක්‍රියාකාරිකම් වල ප්‍රගතිය වාර්තාව කිරීම, පාර්ලිමේන්තුවට, ශ්‍රේඛිය අමාත්‍යාශයට සහ අනිකුත් ආයතන වලට අදාල ව්‍යවස්ථාපිත සහ අනකුත් වාර්තා කලට වේලාවට සැපයීම, මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් සඳහා ඵලදායි හා කාලානුරූප තීරණ ගැනිමට අවශ්‍ය පර්යේෂණ පැවැත්වීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්ය භාරය ලෙස සැලකේ.

### 10. සංඛ්‍යාණ කොට්ඨාශය

ඵලදායි කළමනාකරන තීරණ ගැනීම සඳහා යාවත්කාලින වූ දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම, උපනති විශ්ලේෂණය කිරීම, නියමිත කාලයට අදාලව පුරෝකථන සහ ඇස්තමේන්තු පිළියෙල කිරීම, කළමනාකරණය, නියමිත කාල පරාසය තුළ අවශ්‍ය දැනුවත් කිරීම සිදු කිරීම.


# 05

# ප්‍රධාන මූල්‍ය තොරතුරු 2016




## සාමාජිකයන්ගේ දැක්ම අනුව


## සේවකයන්ගේ දැක්ම අනුව





පොළී හා ලාභාංශ (රු බිලියන)





සමස්ථ සේවක සංඛ්‍යාව





ආදායමට අනුව වියදම් (රු මිලයන)




පුහුණු හා සංවර්ධන වියදම් (රු මිලියන)





ආයෝජන කළඹ (%)





සේවක වියදම් (රු මිලියන)

## රජයේ දැක්ම අනුව





රජයට ගෙවන ලද බදු (රු මිලියන)




රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කල මුදල


## සමාජයේ දැක්ම අනුව




ප්‍රතිලාභ යෝජනා ක්‍රම (රු මිලියන)

06


# වසර 2016 සංක්ෂිප්ත සටහන



මණ්ඩලය 2016 වසරේදී ඉහළ ප්‍රගතියක් වාර්තා කල අතර, සුවිශේෂි ජයග්‍රහන ලඟාකර ගත හැකිවු වසරක් විය. එවැනි සුවිශේෂි අවස්ථා කිහිපයක් පහත දක්වා ඇත.

- මෙම වසරේදී සේවායෝජකයින්ගෙන් අයකර ගත් මුළු දායක මුදල රුපියල් බිලියන 20 ක් වූ අතර, එය පසුගිය වසර හා සසඳන විට 12% ක වැඩිවීමක් විය.
- මෙම වසරේදී උපයන ලද මුළු ආයෝජන අදායම රුපියල් බිලියන 24.0 ක් වූ අතර, එය පසුගිය වසරේදී උපයන ලද රුපියල් බිලියන 21.4 හා සැසඳීමේදී 12% ක වර්ධනයක් පෙන්නුම් කල අතර, සමාලෝචිත වර්ෂාවසානයේදී ආයෝජන කළඹේ වටිනාකම රුපියල් බිලියන 210 සිට රුපියල් බිලියන 229.5 ක් දක්වා වර්ධනය විය.
- පසුගිය වසරේදී උපයන ලද රුපියල් බිලියන 18 ක ශුද්ධ ලාභය හා සැසඳීමේදී සමාලෝචිත වසරේදී රුපියල් බිලියන 20.2 ක ශුද්ධ ලාභයක් ඉපයූ අතර, එම මුළු ලාභයම පොළී හා ලාභාංශ වශයෙන් සාමාජිකයන් අතර, බෙදා හරින ලදි.
- වසර අවසානය වන විට අරමුදලේ ශුද්ධ වත්කම් වල වටිනාකම රුපියල් බිලියන 248 ක් ඉක්මවිය.
- 2016 වසර සඳහා 9% ක මුළු ප්‍රතිලාභ අනුපාතයක් සිය සාමාජිකයන් සඳහා ලබාදීමට මණ්ඩලයට හැකිවිය. රාජ්‍ය බැංකු වලින් ගෙවන ඉතුරුම් පොළී අනුපාතය හා සැසඳිමේදි මෙය ආකර්ෂණීය පොළී අනුපාතයක් විය.
- 2015 වසරේදි මණ්ඩලයේ මෙහෙයුම් වියදම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 7.9% ක් වූ අතර, එය 2016 වසරේදී 7.3% ක් දක්වා අඩුවී තිබිණි. මෙය එම වසරේ මණ්ඩලයේ මෙහෙයුම් කාර්ක්ෂමතාවයේ වර්ධනයක් ලෙස සැලැකිය හැක.
- සමාලෝචිත වසර තුළදි ප්‍රාදේශිය කාර්යාල ජාලයේ වැඩ කටයුතු ඉතාමත් කාර්‍යක්ෂමව පවත්වාගෙන යාමට හැකිවූ අතර, හිඟ දායක මුදල්, අධිභාර සහ නීති මඟින් අයකර ගන්නා ලද මුදල අයකර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදි.
- විමධ්‍යගත කරන ලද ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන ගම්පහ, මහනුවර, මාතර, බදුල්ල සහ කුරුණෑගල යන ප්‍රාදේශිය කාර්යාලවල ඉතා සාර්ථකව සිදුකරගෙන යන අතර, කඩිනම් ප්‍රතිලාභ ගෙවීම මහනුවර සහ කුරුණෑගල යන කාර්යාලවල ආරම්භ කර ඇත.
- සේවායෝජකයින් විසින් චෙක්පතු මගින් ප්‍රධාන කාර්යාලයට ගෙවනු ලබන දායක මුදල් වලට අමතරව අපගේ ප්‍රාදේශිය කාර්යාල ජාලය හරහා සහ ලංකා බැංකුවේ නගර ශාඛාවට ගෙවීම් සිදුකල හැකිය.
- 2010 වසරේදී ආරම්භ කරන ලද යාපනය ප්‍රාදේශිය කාර්යාලයේ කටයුතු වල අඛණ්ඩ ප්‍රගිතයක් වාර්තා කල අතර, මාසික සාමාන්‍ය දායක මුදල රැස්කිරීම් රුපියල් මිලියන10 කට ආසන්නව සහ සේවායෝජකයින් 1600 ක පමණ ප්‍රමාණයක් පවත්වාගෙන යාමට හැකිවිය.





**ව්‍යවසායන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම**

# 07

# 1981 සිට 2016 දක්වා විශේෂ අවස්ථා



## 1986
**මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : උපරිමය රු.100,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය



## 1989
**නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : උපරිමය රු.200,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය



## 1991
**හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු.300,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර



## 1992
**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය : ඇස් දෙකම සඳහා රු. 18,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය



## 1994
**සේ.නි.භා.අ. සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර රු 15,000/= බැගින් ශිෂ්‍යත්ව 9,000 ක් වාර්ෂිකව**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර



## 1997
**ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය රු. 25,000/= බැගින් රු.50,000/= ක උපරිමය මුළු සේවා කාලය තුලදී**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය



## 2002
**"වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
''වියන'' අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය



## 2006
**වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 300,000/=**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
''වියන'' අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර



## 2010
**සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය අපොස (උසස්පෙළ) අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට රු. 12,000/- බැගින් වාර්ෂික මූල්‍යාධාර**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
වියන අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය
වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර



## 2016
**අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය රුපියල් 18,000 සිට රු. 30,000/- දක්වා වැඩි කරන ලදි.** මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර
අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
සේනිභාඅ සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර
ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
වියන අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය වකුගඩු බද්ධ කිරීම් සඳහා මූල්‍යාධාර
සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ
05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය අපොස (උසස්පෙළ) අරමුදලේ
සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට රු. 12,000/- බැගින් වාර්ෂික මූල්‍යාධාර

08

# පසුබිම් විශ්ලේෂණය

## 1. ශක්තීන්, අවස්ථා, දුර්වලතා හා තර්ජන විශ්ලේෂණය

උපකාරක සාධක

හානිකර සාධක

අභ්‍යන්තර සාධක

### ශක්තීන්

- දායක මුදල් රැස්කිරීම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු හා මූල්‍යමය ක්‍රියාවලියන් පහසුවෙන් හා සුමට ලෙස සිදුවීම
- පවතින ශක්තිමත් ප්‍රතිලාභ හේතුවෙන් ආකර්ෂණීය සාමාජිකත්වයක් තිබීම
- ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම
- පනත මඟින් පවරා ඇති අසීමිත බලතල
- වටිනා වත්කම් අත්පත් කර ගැනීමෙන ලැබෙන ආදායම
- අරමුදල කළමනාකරණය සඳහා ස්වාධීනව තීරණ ගැනීමට හැකිවීම
- ක්ෂණිකව මුදල් පරිහරණය කිරීමට පහසුකම් පැවතීම
- සේවකයන් ඇඳබැඳ තබාගැනීමට සුවිශේෂී වූ ඇගයීම් ක්‍රමවේදයක් පැවතීම
- බලාත්මක කිරීම නීතිමය මොඩියුලය (රාමුව) හා ජාලය ඵලදායි ලෙස පැවතීම

### දුර්වලතා

- සඵලදායි මෙහෙයුම් ක්‍රියාවලියන් සඳහා පහසුකම් හිගවීම
- දායක මුදල් රැස්කිරීමට පවතින ආවරණ ප්‍රදේශය සීමාවීම
- තමන්ගේම කාර්යාල සංකීර්ණයක් නොමැතිවීම හා ඒ සඳහා පවතින ස්ථිර ප්‍රදේශ ප්‍රමාණවත්ව වෙන්කර නොතිබීම
- විභජනය නොකරන ලද විශාල ප්‍රමාණයේ සාමාජික දායක මුදල් පැවතීම
- දත්ත අවශ්‍ය පරිදි විශ්ලේෂණය කර සඵල ලෙස තීරණ ගැනීම සඳහා පවතින පරිගණක පද්ධතියේ ඉඩ ප්‍රස්ථාව ප්‍රමාණවත් නොවීම
- යල්පැනගිය පරිගණක පද්ධතිය නිසා සැකසීමේ වේගය අඩුවීම
- ප්‍රමාණවත් නොවන දත්ත ගබඩාව
- තීක්ෂණ දක්ෂතා ඇති වෘත්තිකයන් ආකර්ශනය කර නොගැනීම
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් ප්‍රමාණවත් නොවීම
- කාර්ය මණ්ඩලයේ ඉදිරි පුද්ගල දියුණුවට තිබෙන සීමාවීම
- විධිමත් කාර්ය සාධන ක්‍රමවේදයක් නොතිබීම (පුද්ගල සහ ආයතනික)
- භාෂා මාධ්‍යයේ අසමතුලිතභාවය (විශේෂයෙන් දෙමළ හා ඉංග්‍රිසි)

බාහිර සාධක

### අවස්ථා


- ඉදිරි අවුරුදු 05 තුළ නව රැකියාවන් දස ලක්ෂයක් ලබාදීමේ රජයේ වැඩපිළිවෙල
- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල වැටුප් වැඩිවීම
- ව්‍යවසායකත්වතාවය වැඩිදියුණු කිරීමේ සංස්කෘතියක් ඇති කිරීම
- විදේශ ආයෝජන ප්‍රවණතාව වැඩිවීම
- ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රවණතාව
- ජාතික අවම වේතනය වැඩිවීම
- නව රජයේ සංවර්ධන උපායමාර්ග

### තර්ජන

- ආයෝජන සම්බන්ධව ව්‍යාපාර ලෝකයේ තිබෙන අසීරුතා
- ඉහළ සඵලතාවයක් (ප්‍රතිලාභ) ලබා ගැනීම සඳහා ආයෝජන නොමැතිවීම
- වර්තමානයේ තිබෙන ගෝලීය අර්බුද
- පවතින නීතිරීති වල දෘඪභාවය වැඩිවීම
- රැකියාවලින් විශ්‍රාම යාම
- ලැබෙන පහළ අගයකින් යුතු ලාභාංශ හේතුවෙන් ලබාදිය හැකි පොළී අනුපාතය අඩුවීම




## I. ආර්ථික උපනති විශ්ලේෂණය





කාර්මික හා සේවා අංශයේ ශක්තිමත් ක්‍රියාකාරිත්වය තුළින් ආරක්ෂිත පියවරක් 2016 තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය අත්පත්කරගෙන තිබේ. වසරේ දෙවන කාර්තුවේදී වාර්තාවූ 2.6% වර්ධනයට වඩා සැලකිය යුතු 4.1% ක ප්‍රතිශත වර්ධනයක් තුන්වන කාර්තුවේදී පවතී. මූර්තමය වශයෙන් 2016 පළමුවන කාර්තුව තුළ ආර්ථිකය 3.9% ක වර්ධනයක් හා පෙර වර්ෂයේ එය 5.7% කි. 2016 පළමු කාර්තුව තුළ කාර්මික අංශයේ 7.7% ක වර්ධනයක්ද දෙවන කාර්තුවේදී 2.2% ක පහත වැටීමක් තුළින් දළ දේශිය නිශ්පාදනයේ පහත වැටීමකට හේතුවී ඇත. 2016 ප්‍රථම කාර්තුව තුළ 8.5% ක ප්‍රසංශනීය වර්ධනයක් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවති. වර්ෂයේ මුල් කාර්තුව තුළ දේශිය ආහාර නිශ්පාදන මිළ ගණන් වලට බලපෑම් වන අයහපත් කාලගුණ තත්වය තුළ කෘෂි ක්ෂේත්‍රයේ හැකිලීමක් ඇතිවී ඇත. 4.5% ක් සේවා අංශයේ වර්ධනය සිල්ලර හා තොග වෙළඳාම පුළුල්වීම තුළින් සිදුවී ඇත. 2016 පළමු අර්ධ වර්ෂය තුළ මූල්‍ය සේවා අංශයේ 15.1% ක නොසිතූ ආකාරයේ වර්ධනයක් වාර්තා වී ඇත.

ආයතන වියදම් වර්ධනය හා අපනයන ආදායම් හැකිලීම තුළින් 2016 පළමු මාස 11 තුළදී වෙළඳපොලේ සමුච්චිත හිඟය ඇමරිකානු ඩොලර් බිලියන 8.2 දක්වා වැඩිවී ඇත. එය එම කාලයේ පසුගිය වර්ෂය තුළ ඇමරිකානු ඩොලර් මිලියන





7.6 ක් ව පැවතිනි. සංචාරක ඉපයීම් හා විදේශ ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ තවදුරටත් සමවීම ගෙවුම් ශේෂයට වන අහිතකර බලපෑම සමනය කිරීමට බලපා ඇත සංචාරක ඉපයීම් 14% කින් වැඩිවී ඇමරිකානු ඩොලර් බිලියන 34 ක් දක්වා 2016 වසරේදී වර්ධනය වී ඇති අතර විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ 37% කින් වර්ධනය විය. ඇමරිකානු ඩොලර් බිලියන 72 ක් දක්වා එම වසරේ වැඩවී ඇත. රුපියල් මත පදනම් කරගත් රාජ්‍ය සෘජු විදේශ ආයෝජන ගලා ඒම අපේක්ෂිත මට්ටමකට වඩා පහළ මට්ටමක පවතින අතර, රාජ්‍ය සුරැකුම් වෙළඳපොලෙහි බැහැර මූල්‍ය ප්‍රවාහ තත්වයක් පවතී.





සැපයුම් අංශයේ අවහිරතා හා රජය විසින් හඳුන්වාදුන් මෑත කාලින බදු වල සිදුකල වෙනස්වීම පාරිභෝගික මිල උද්ධමනය තනි අගයක් ගෙන ඇත. අයහපත් කාලගුණ තත්වය කරනකොටගෙන සැපයුම් අංශයේ සිදුවූ අවහිරතා වටිනාකම් එකතුව මත බදු වැඩිකිරීම සහ ජාතිය ගොඩනැගිමේ බදු හා වටිනාකම් එකතු බදුවලින් නිදහස් කිරීම් ඉවත්කිරීම මඟින් උද්ධමනය වැඩවීම වර්ෂයක් පාසා සිදුවී ඇත. දේශිය සැපයුම් තත්වය සාමාන්‍ය අතට හැරීම හා බදු ව්‍යුහයට ඇතිකළ වෙනස්කම් තාවකාලිකව ක්‍රියාත්මක වීම අත්හිටුවීම මඟින් උද්ධමනය අඩුවී ඇත.


මිළ සංචිත අනුපාතය ඉහළ දැමීම මගින් පොළී අනුපාතය පෙබරවාරි මාසයේ හා ජුලී මාසයේ අවස්ථා දෙකකදී නිළ පොළී අනුපාතයන් ඉහළ දැමීමකට ලක් කරන ලදි. මෙම ප්‍රතිපත්ති තුලින් ආනයන දිරිගන්වන ණය ධාරාව අධෛර්‍ය කිරීම හා ප්‍රාග්ධන පිටතට ගලායාම අධෛර්‍ය කිරීම ඇමරිකානු එක්සත් ජනපද මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම හමුවේ සිදුකර ඇත.
2016 වර්ෂය තුළ කොටස් වෙළඳපොළෙහි දර්ශකයන් වෙළඳපොල ප්‍රාග්ධනය හා පිරිවැටුප පහළ වැටීම තුලින් වෙළඳපොල පසුබෑමක් පෙන්නුම් කරයි. පහත පොළී අනුපාතිකයන් පැවතියද




ආයෝජකයින්ගේ අවදානම් වැඩිවීම, දේශපාලන පසුබිමේ වෙනස්වීම්, විදේශ විනිමය අනුපාතයට බලපෑම, පහළ විදේශ මිලදීගැනීම් මගින් අයහපත් බලපෑමක් කොටස් වෙළඳපොලට ඇති කර ඇත.




2016 සමස්ථ මිලදර්ශකය 9.5% කින් පහත බැස ඇත. කෙසේ වෙතත්, S & P 20 දර්ශකයේ අඩුවීම 2.8% ක් පමණ වූ බැවින් එහි කාර්ය සාධනයේ විශාල පහත වැටීමක් නොපෙන්වයි. සමස්ථ මිල දර්ශකය නැගීගෙන එන රටවල කොටස් වෙළඳපොල (MSCI) පිළිඹිබු කරන කැඩපතක් ලෙස ක්‍රියාකරයි. 2016 පළමු අර්ධ වර්ෂය තුළ ශුද්ධ විදේශ ප්‍රමාණය (ශුද්ධ විදේශ මිල දිනාගැනීම්) සෘණ අගයන් ලබාගෙන ඇති අතර එහි සුළු ඉහළ යාමක් ජුලි මාසයේ සිට පෙන්නුම් කරයි.




වෙළඳපොළ පිරිවැටුප විදේශ ආයෝජකයින්ගේ දායකත්ව ප්‍රගතියක් 2016 දී 2015 ට වඩා පෙන්නුම් කර ඇත. එය 2016 42.5% ක් ගත් අතර, 2015 වර්ෂයේදී 34.4% කි. සමස්ථ ශුද්ධ විදේශ ලබා ඒම 2016 තුලදී රු මිලියන 633.5 කි. එය 2015 වර්ෂයේදී රු මිලියන 5,400 ක විදේශ ගලායාමක් (Foreign Outflow) ලෙස 2015 තිබී ඇත. 2016 දී දෛනික පිරිවැටුප රුපියල් මිලියන 730 ක් දක්වා අඩුවීමක් වන අතර, එය 2015 දී රුපියල් මිලියන 1060 කි.



# ආයතනික භාරකාරීත්වය

01 අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

02 සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාගේ පණිවිඩය

03 අධ්‍යක්ෂකවරුන්ගේ පණිවිඩය

04 පාලන වාර්තාව

05 අවධානම් කළමනාකරණ වාර්තාව

## අධ්‍යක්ෂ මණ්ඩලය

2016 වසර අවසානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත සදහන් පරිදි විය.

| | |
|---|---|
| **මහින්ද මඩිහහේවා මහතා**<br>සභාපති / ප්‍රධාන විධායක නිලධාරි<br>ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත | **පී බී මැදගෙදර මහතා**<br>ක්‍රියකාරී අධ්‍යක්‍ෂ<br>ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත |
| **නිහාල් ෆොන්සේකා මහතා**<br>අධ්‍යක්ෂ (2016 අප්‍රේල් මස දක්වා)<br>ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත | **කේ එස් කුරුකුළසිංහ මහතා**<br>අධ්‍යක්ෂ<br>ගරු විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත |
| **චම්පා බාලසූරිය මහත්මිය**<br>අධ්‍යක්ෂ<br>ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත | **ශිතා සේනාරත්න මෙනවිය**<br>අධ්‍යක්ෂ<br>වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය විසින් පත්කල නියෝජිත |
| **සී එල් කේ පී ජයසූරිය මහතා**<br>අධ්‍යක්ෂ (2016 සැප්තැම්බර් මස දක්වා)<br>ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පත්කල නියෝජිත | **ඩබ් එම් කේ එල් වීරසිංහ මහතා**<br>අධ්‍යක්ෂ (2016 ඔක්තොම්බර් මස සිට)<br>ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පත්කල නියෝජිත |
| **පී රණවකආරච්චි මහතා**<br>අධ්‍යක්ෂ<br>වෘත්තීය සමිති නියෝජිත | **ලෙස්ලි දේවේන්ද්‍ර මහතා**<br>අධ්‍යක්ෂ<br>වෘත්තීය සමිති නියෝජිත |

**එච් එම් ඒ ජේ කුමාර මහතා**
මණ්ඩලීය ලේකම්

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

| | |
|---|---|
| **සභාපති/ප්‍රධාන විධායක නිලධාරී**<br>මහින්ද මඩිහහේවා මහතා | **ක්‍රියාකාරී අධ්‍යක්ෂ**<br>පී බී මැදගෙදර මහතා |

**අතිරේක සාමානයාධිකාරී**
ආර් එන් ඥණසේකර මිය

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

| | |
|---|---|
| **ආර් එන් ඥණසේකර මිය** | ආයෝජන |
| **ඩබ්ලිව් එස් දිසානායක මහතා** | සාමාජික සේවා |
| **එල් එච් නිහාල් මහතා** | පරිපාලන හා මානව සම්පත් |
| **කේ එස් වැලිවිට මහතා** | අභ්‍යන්තර විගණන |
| **එන් ඩබ්ලිව් විමලවීර මහතා** | මුදල්/ ආයෝජන |
| **ඒ ජේ එම් එස් ජයසුන්දර මහතා** | දායක මුදල් රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා |

## සහකාර සාමාන්‍යාධිකාරීවරුන්

| | |
|---|---|
| **සී මල්ලිකාරච්චි මහතා** | සාමාජික ගිණුම් |
| **එච් එම් සෙනෙවිරත්න මහතා** | සාමාජික සේවා |
| **එම් එස් දිසානායක මහතා** | ස්වයං රැකියා |
| **එම් ඒ කේ අළුත්ගමගේ මහතා** | මුදල්/ ආයෝජන |
| **එච් ඒ වයි ආර් ප්‍රනාන්දු මෙනවිය** | දයක මුදල් රැස්කිරීම් |
| **ඩබ්ලිව් එස් ධර්මසිරි මහතා** | තොරතුරු තාක්ෂණ |
| **ආර් ඒ එස් රූපසිංහ මිය** | පරිපාලන හා මානව සම්පත් |
| **එස් රාජපතිරණ මිය** | නීති (වැ.බ.) |
| **ජේ කේ පි රංජිත් මයා** | ක්‍රියාත්මක කිරීම්/කළාප 1 |
| **බී ආර් ආරියවංශ මහතා** | ක්‍රියාත්මක කිරීම්/කළාප 11 |



*රටේ ප්‍රධාන සමාජ ආරක්ෂණ අරමුදලක් ලෙස එහි දිගුකාලීන ආයෝජන උපායමාර්ග තුලින් මුල්‍ය වෙළඳ පොලේ පැවති උච්චාවචනයන්ට සාර්ථකව මුහුණ දෙමින් ප්‍රශස්ථ මට්ටමේ පොළී අනුපාතයක් සාමාජිකයන් වෙත ලබාදීමට හැකිවිය. රටේ පවතින ආර්ථික ප්‍රවනතා සැලකිල්ලට ගනිමින් ඉදිරි වසර වලදී අරමුදල තවදුරටත් වර්ධනය කර ගැනිමට අදිටන් කරගෙන සිටී.*



# සභාපතිතුමාගේ පණිවිඩය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2016 වසර සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. 2016 වසරේදී විවිධ බාධක මැද වුවද, ඉතා ඉහළ ප්‍රගතියක් වාර්තා කිරීමට අප අරමුදලට හැකිවිය.

අරමුදලේ මුළු වත්කම් වල වටිනාකම රුපියල් බිලියන 249 ක් හා මුළු ආදායම් රු මිලියන 24.6 ක් ලෙස වාර්තා විය. එය පසුගිය වසර හා සැසඳීමේදි 13% ක වර්ධනයකි. එහි මෙහෙයුම් ප්‍රතිඵලයක් ලෙස වර්ෂ අවසානයේදී ආයෝජන මත 10% ක ඉපයුම් ප්‍රතිලාභයක් ලඟාකර ගත හැකිවිය. 2016 වසරේදී කොටස් වෙළඳපොලේ පැවති අයහපත් වාතාවරණය මත වුවද, නව්‍ය අරමුදල් කළමනාකරණ සහ ආයෝජන ක්‍රමවේද මගින් ඉහළ ප්‍රගතිය ලඟාකර ගැනීමට හැකිවිය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් එහි අතිරික්ත අරමුදල ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කරන අතර, අනුමත සීමාවන් ඇතුලත කොටස් වෙළඳපොලේ සහ ආයතනික ණය සුරැකුම්පත් වල අයෝජනය කිරීම සිදු කරනු ලබයි.

රටේ ප්‍රධාන සමාජ ආරක්ෂණ අරමුදලක් ලෙස එහි දිගුකාලීන ආයෝජන උපායමාර්ග තුලින් මුල්‍ය වෙළඳ පොලේ පැවති උච්චාවචනයන්ට සාර්ථකව මුහුණ දෙමින් ප්‍රශස්ථ මට්ටමේ පොළී අනුපාතයක් සාමාජිකයන් වෙත ලබාදීමට හැකිවිය. රටේ පවතින ආර්ථික ප්‍රවනතා සැලකිල්ලට ගනිමින් ඉදිරි වසර වලදි අරමුදල තවදුරටත් වර්ධනය කර ගැනිමට අදිටන් කරගෙන සිටී.

අරමුදලේ ක්‍රියාකාරි සාමාජිකත්වය තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් සංක්‍රමික හා ස්වයං රැකියා අංශයේ සාමාජිකත්වය පුළුල් කිරීමට අදහස් කර ඇත. අනික් අතට වයස්ගත ජනගහණය වැඩිවීමේ ප්‍රවනතාවයක් සමඟ සාමාජික මුදල නැවත ලබා ගැනීම ඉහළ යාමක් සිදුවිය හැකිය. මුල්‍ය අංශයේ ක්‍රියාකාරි ආයතනයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට එය වර්ධනය කිරීමේ උපායමාර්ග වලට මෙම ප්‍රවනතාවයන්ගේ බලපෑම් කෙරෙහිද අවධානය යොමුකරනු ඇත.

එබැවින්, අරමුදලේ සේවාලාභින් වෙනුවෙන් පවතින ආර්ථික පරිසරය තුළ ලබාගත හැකි උපරිම ප්‍රතිලාභ ලබාදිය හැකි ලෙස අප අරමුදල කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට උපරිම කැපැවීමෙන් කටයුතු කරන බවට දැන්වීමට කැමැත්තෙමි.
සේවායෝජකයන්ගෙන් දායක මුදල රැස්කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කර සාමාජිකයන්හට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය

වැඩසටහන් මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. වසර අවසන් වනවිට අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවායෝජකයින් අතරින් විශාල ප්‍රමාණයක් අරමුදලේ ලියාපදිංචි වී ඇති අතර, ඒ තුළින් සාමාජික ගිණුම් පත්වාගෙන යෑම කාර්ක්ෂම කර සාමාජිකයින්ට වඩා හොඳ සේවාවක් සැලකිමට හැකිවිය.

මණ්ඩලය විසින් ගන්නා ලද තවත් විශාල ඉදිරි පියවරක් ලෙස EISA ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු වල කාර්‍යක්ෂමතාවය වැඩිදියුණු කිරිම තුලින් නව සේවායෝජකයන් බඳවා ගැනීම සහ සේවායෝජිකයින්ගේ ප්‍රධාන ලිපිගොනු යාවත්කාලීන කිරිමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමත් මෙම ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වේ. එමෙන්ම දැනට පහසුකම් සලසා ඇති බැංකු සංඛ්‍යාව වැඩිකිරිම තුළින් ඉලෙක්ට්‍රෝනික බැංකු ක්‍රමය (e-banking) හරහා දායක මුදල් ගෙවන සේවායෝජකයින්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනිමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී. කඩදාසි වලින් තොර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා 2018 වසරේ තුන්වන කාර්තුව වනවිට ආයතනයේ සියළුම කටයුතු ස්වයංක්‍රීයව සිදුකිරීමට අපේක්ෂිතය ලිපිගොනු ස්කෑනින් කිරිමේ ව්‍යාපෘතිය ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කිරිමට නියමිතය. මෙම ව්‍යාපෘතිය මඟින් දැනට පවතින සාමාජික ලිපිගොනු විශාල සංඛ්‍යාවක් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයට පරිවර්තනය කිරිමට බලාපොරොත්තු වේ. මෙම සියළුම ව්‍යාපෘතින් නිමවීමක් සමඟම ආයතනයේ කටයුතු වල ඵලදායිත්වය වැඩිදියුණුවීමක් සිදුවනු ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විවිධ අවශ්‍යතාවයන් මත අනිකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතාවයක් ගොඩනඟාගෙන ඇත. දායක මුදල නොගෙවන අය හඳුනාගැනීම සඳහා සේවක අර්ථසාධක අරමුදල සමඟ හවුල්කාරිත්වයක් යටතේ කටයුතු කරනු ඇත. ස්වයං රැකියා අංශය සඳහා ඵලදායි උපායමාර්ග සැකසීම සඳහා ස්වයං රැකියා අංශයේ විවිධ සංගම්වල සහය ලබාගෙන ඇත.

අවසන් වශයෙන් අපගේ සියළු ජයග්‍රහන හා ප්‍රගතිය වෙනුවෙන් උනන්දු වූ සහ කැපවූ සියළුම සේවක මහත්ම මහත්මීන්ට මාගේ ගෞරවය හා ප්‍රශංසාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම අපගේ ගමන් මඟ සාර්ථක කර ගැනිමෙහිලා අප කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් සියළුම සේවායෝජකයින් සහ සාමාජිකයන්ට මාගේ හදපිරි කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමු.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි
සේවා නියුකත්යන්ගේ භාර අරමුදල් මණ්ඩලය

*රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශමාලාවේ වාර්තා කිරිමේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2016 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව ඇතුලත් 36 වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරිමට හැකිවීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉමහත් සතුටකි.*



# අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

## මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ආයතනයේ මූල්‍ය තත්වය සහ කාර්ය සාධනය සත්‍ය හා සාධාරන ලෙස පිලිඹිබු වන ලෙස පිළියෙල කිරිම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලයේ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ අදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ව ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්විමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ පිටු අංක 51 සිට 82 දක්වා ඇතුලත් කර ඇති ප්‍රධාන ගිණුම්කරන ප්‍රතිපත්ති සහ සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

ඉහත දක්වා ඇති පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත සහ ව්‍යවස්ථාපිත මාර්ගෝපදේශ වලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනියත්වය සාධාරන ලෙස දැක්වෙන පරිදි පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලබති.

## ප්‍රධාන ක්‍රියාකාරකම් සමාලෝචනය

**දායක මුදල් රැස්කිරිම් සහ සාමාජික ගිණුම්**
නව සේවායෝජකයින් 12,892 ක් 2016 වසරේදි දායක මුදල් ගෙවිම් ආරම්භ කල අතර, ඔවුන්ගෙන් 5,832 ක් වසර අවසන් වන විටත් ක්‍රියාකාරි ලෙස දායක මුදල් ගෙවීම කරගෙන යන ලදි. එසේම, 2015 වසරේදී රැස්කර ගත් දායක මුදල් රුපියල් බිලියන 17.9 ට සාපේක්ෂව, 2016 වසරේදී රුපියල් බිලියන 20.0 ක මුදලක් රැස්කිරිමට හැකිවිය. තවද, වසර මුලදී රුපියල් බිලියන 218.5 ක් ව පැවති සාමාජික අරමුදල වසර අවසානයේදි රුපියල් බිලියන 246 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**සාමාජික ප්‍රතිලාභ සහ සුභසාධන ප්‍රතිලාභ**
2016 වසරේදි දායක මුදල් ගෙවිමේ ඉල්ලුම්පත්‍ර 171,809 ක් වෙනුවෙන් රුපියල් බිලියන 13.5 ක් ගෙවා තිබු අතර, 2015 වසරේදි ඉල්ලුම් පත්‍ර 162,983 ක් වෙනුවෙන් රුපියල් බිලියන 11.5 ක් ගෙවා තිබුණි. පෙර වසර තුලදී දායක මුදල් ආපසු ගෙවිමේ සාමාන්‍යය රු70,519 ක් වූ අතර, එය 2016 වසරේදි රුපියල් 78,519 ක් වූ අතර, එය 2016 වසරේදි රුපියල් 78,579 ක් දක්වා වර්ධනය වී තිබුණි. 2016 වසරේදි ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍ර 3,654 ක් සඳහා රුපියල් මිලියන 299.3 ක් ගෙවා තිබූ අතර, ඊට සාපේක්ෂව 2015 වසරේදි ප්‍රතිලාභ

ඉල්ලුම්පත්‍ර 3,481 ක් වෙනුවෙන් රුපියල් මිලියන 180 ක් ගෙවන ලදි. පහවසර ශිෂ්‍යත්ව සමත් සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් 2016 වසරේදි රුපියල් මිලියන 176.74 ක් ගෙවූ අතර, අ.පො.ස. උ.පෙළ සමත් සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට සහය දීමක් වශයෙන් 2016 වසරේදි රුපියල් මිලියන 42.52 ක් ශිෂ්‍යත්ව ලෙස ප්‍රදානය කරන ලදි.

**සාමාජික ගිණුම් පවත්වාගෙන යාම**

වසර අවසානය වනවිට ආසන්න වශයෙන් මිලියන 12.5 ක් සක්‍රිය සහ අක්‍රීය සාමාජික ගිණුම් වශයෙන් පැවතුනි. මෙම සියළුම ගිණුම් සඳහා අරමුදල විසින් සාමාජික ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. එම ගිණුම් වලින් 96% ක ප්‍රමාණයක් 2016 වසර අවසන් වනවිට යාවත්කාලීන කර තිබුණි. මෙම ගිණුම් වලින් මිලියන 10 ක් අක්‍රිය සාමාජික ගිණුම් වූ අතර, මිලියන 25 ක් සක්‍රීය සාමාජික ගිණුම්වූ අතර, එම සක්‍රිය ගිණුම් සඳහා වාර්ෂික ගිණුම් ප්‍රකාශන වසර තුලදී නිකුත් කරන ලදි.

**ආයෝජන**

වසර ආරම්භයේදී රුපියල් බිලියන 210 ක් වූ ආයෝජන කළඹේ වටිනාකම 2016 වසර අවසන් වනවිට රුපියල් බිලියන 229.5 ක් දක්වා වර්ධනය වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 9.3% ක වැඩිවීමක් විය. 2016 වසරේදි මණ්ඩලය විසින් ආයෝජන ප්‍රතිපත්තියේ මාර්ගෝපදේශ දැඩිලෙස අනුගමනය කල අතර, ආයෝජිත ප්‍රාග්ධනය ආරක්ෂා කර ගනිමින් සාධාරන ප්‍රතිලාභයක් උපයා ගැනීමට හැකිවිය. ආයෝජන කළඹේ වටිනාකමින් 84.5% කට සාමානවූ රුපියල් බිලියන 194 ක ඉහළ ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර තිබූ අතර, රුපියල් බිලියන 2.3 ක් හෝ 1% ක් රජයේ සුරක්ෂිත ස්ථාවර ආදායම් සුරැකුම්වලද, රුපියල් බිලියන 12.3 ක් හෝ 5.4% ක් කොටස් වෙළඳ පොළේ සහ රුපියල් බිලියන 5.5 ක් හෝ 2.2% ක් අනිකුත් ආයෝජන ලෙසද අරමුදල් ආයෝජනය කර තිබුණි.

**රැස්කිරීම් සහ සේවායෝජක සබඳතා**

පෙර වර්ෂයට සාපේක්ෂව සියළුම දිස්ත්‍රික්ත ආවරණය කරමින් අපගේ ප්‍රාදේශිය කාර්යාල 17 මගින් කරන ලද පරික්ෂණ සංචාර වල හේතුවෙන් සේවායෝජක සංඛ්‍යාව 77,842 ක් දක්වා වැඩිවිය. මණ්ඩලයේ පරිගණක ජාලයේ සහය මත මෙහෙයුම් කටයුතු සහ අධික්ෂණ කටයුතු සාර්ථකව කරගෙන යාමට හැකිවිය. ඒ අනුව දායක මුදල් රැස්කිරීම් 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදි රුපියල් මිලියන 2,151 කින් වැඩිකර ගැනීමට හැකිවිය.

විද්‍යුත් බැංකුකරණය මගින් දායක මුදල් ගෙවීම සහ සාමාජික තොරතුරු ලබාදීම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකිවූ අතර, එය කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව හරහා ක්‍රියාත්මක කල අතර, මෙම ක්‍රමය මගින් එකතු කරන ලද දායක මුදල් වල අගය මුළු දායක මුදල් රැස්කිරීම් වලින් 45% ක් පමණ විය. තවද, ප්‍රාදේශිය කාර්යාල හරහා කරන ලද දැනවත් කිරීමේ වැඩසටහන් මගින් 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ අනුකූලතා අනුපාතය වැඩිකර ගතහැකිවිය.

2016 වසරේදි පුහුණු වැඩසටහන් සහ වැඩමුළු මගින් කම්කරු නීතිය සහ රෙගුලාසි පිළිබඳව ප්‍රාදේශිය කලමනාකරුවන් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කල අතර, ඒ මගින් ප්‍රාදේශිය කාර්යාලවල සියළුම සේවකයින්ගේ භෞතික දැනුම සහ ප්‍රායෝගික දැනුම වැඩිදියුණු කර ගැනිමට හැකිවනු ඇත. මෙම වාර්ෂික වාර්තාවේ අඩංගු කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමහින් සහතික කරනු ඇත.



**මහින්ද මඩිහහේවා**

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති/
ප්‍රධාන විධායක නිලධාරි විසින් අත්සන් කරන ලදි



# යහපාලනය පිළිබඳ වාර්තාව

අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තම කාර්යභාරය ඉටුකිරීමේදි ශක්තිමත් යහපාලන රාමුවක් තුළ සියළු ව්‍යවස්ථාපිත සහ අනිකුත් රෙගුලාසි වලට අනුකූල වෙමින් සාමාජිකයින් හට ඉතා ඉහළ වටිනාකමක් නිර්මාණය කර දීම තම මූලික වගකීමක් ලෙස සලකනු ලබයි. විනිවිදභාවය සඳහා වන ඉහළ ප්‍රමිතීන්ට කැපවීම, විශ්වාසනීයත්වය සහ අනුකූලතාවය ඉතා ශක්තිමත්ව ස්ථාපනය කරන ලද මාර්ගෝපදේශ ප්‍රතිපත්ති ලෙස සැලකිය හැකිය. මෙම වාර්තාව මගින් ආයතනය ශක්තිමත් යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැපවීම සහ වගකීම පෙන්වා දීමට උත්සාහ දරයි.




**ව්‍යවස්ථාපිත හා නියාමන රාමුව**

- සේ නි භා අරමුදල් පනත
- මූල්‍ය රෙගුලාසි (රජය)
- රාජ්‍ය ව්‍යපාර මාර්ගෝපදේශ (රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)
- ප්‍රශස්ථ ආචාර ධර්ම පද්ධති භාවතය (රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය
- අදාල රජයේ චක්‍රලේඛ (මහා භාණ්ඩාගාරය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

**රීති හා ක්‍රියා පටිපාටි**

- ක්‍රියාවලි අත්පොත සහ මණ්ඩලයේ ප්‍රතිපත්ති


**වෙනත් කමිටු**

- විගණන කමිටු
- කළමනාකරණ කමිටු
- ආයෝජන කමිටු

**පාලනය හා අධීක්ෂණය**

- අභ්‍යන්තර විගණන

# ආයතනික යහපාලන ව්‍යුහය

| යහපාලන මූලිකාංග | | 2016 වසර පිළිබඳ පැහැදිලි කිරීම් |
|---|---|---|
| **1. අධ්‍යක්ෂ මණ්ඩලය** | | |
| 1.1. | මණ්ඩලය | අරමුදලේ පාර්ශවකරුවන් සහ රජයේ නියෝජිතයෙක් ලෙස කටයුතු කිරීමට ව්‍යවස්ථාපිත වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. |
| 1.1.1. | අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම | අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි නව දෙනෙකුගෙන් සමන්විත වේ.<br>• අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් හතර දෙනෙකු<br>• මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු<br>• වෙළෙඳ විෂයය භාර ආමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු<br>• ලංකා සේවායෝජකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු සහ<br>• සාමාජිකයින් 100,000 කට වඩා වැඩි පිරිසක් සිටින වෘත්තීය සමිති වලින් සාමාජිකයන් විසින් තෝරාපත් කරගනු ලබන සේවක සාමාජිකයන් දෙදෙනෙකු |
| 1.1.2. | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වෙන අතර, අවශ්‍යතාවය අනුව අමතර රැස්වීම් පවත්වනු ලබයි. ඒ අනුව මෙම වසර තුලදී රැස්වීම් වාර 13 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාර්ක්ෂමව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සෑම වැඩකරන දින තුනකට කලින් ඔවුන් වෙත ලැබීමට සලස්වනු ලැබේ. 2016 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල සහභාගිත්වය පිළිබඳ සටහනක් පහත දැක්වේ.<br> |
| 1.1.3. | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් | මහජන සම්පත්වල භාරකරුවෙක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තමන්ට පැවරී ඇති බලතල සහ වගකීම් අවංකව සහ යහපත් චේතනාවෙන් ඉටුකල යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය තම වගකීම් පිළිබඳව සෑම විටම සවිංඥාණක විය යුතු අතර, ප්‍රමාණවත් සැලසුම් කිරීමකින් තොරව ගන්නා ලද තීරණ වල අයහපත් ප්‍රතිඵල අවසාන වශයෙන් මහජනතාවට දැරීමට සිදුවනු ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සැලකිල්ලට භාජනය විය යුතු කරුණු සහ සිද්ධි කිහිපයක් පහතින් දක්වා ඇත.<br>• ප්‍රතිපත්ති සකස් කිරීම<br>• අරමුදල් අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචනය<br>• ආයෝජන සහ පරිපාලිත සමාගම් වල ප්‍රගති සමාලෝචනය සහ අධීක්ෂණය<br>• වාර්ෂික ප්‍රගති සමාලෝචනය<br>• කාරක ප්‍රාග්ධනය<br>• වාර්ෂික, කාර්තුමය සහ මාසික ප්‍රගතිය<br>• අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා |



| යහපාලන මූලිකාංග | | 2016 වසර පිළිබඳ පැහැදිලි කිරීම් |
|---|---|---|
| 1.1.4. | මණ්ඩලීය ලේකම් | අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය වන අදාල සහ විශ්වාසනීය තොරතුරු කලට වේලාවට ලබාදෙන නියමිත ක්‍රියාපටිපාටි නීතී, රීතී, රෙගුලාසි සහ එහි අනුකූලතාවයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දිය හැකි වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ලේකම් වරයෙකුගේ සහය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ඇත. |
| 1.1.5. | මණ්ඩලීය ලේකම්ගේ කාර්යභාරය | මණ්ඩලීය ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු නිසි ක්‍රියාපටිපාටි අනුව සිදුවන බවට සහ අදාල නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලව එම තීරණ ගැනීම් සිදුවන බවටත් වගබලා ගත යුතුය. ඊට අමතරව පහත සඳහන් කටයුතුද ලේකම්ගේ කාර්යභාරයට ඇතුලත් වේ.<br>• අධ්‍යක්ෂ මණ්ඩල නිවේදන, තීරණ, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අනිකුත් අදාල ලිපිලේඛණ සමඟ අදාල පාර්ශව වලට ලැබීමට සැලැස්වීම<br>• අධ්‍යක්ෂ මණ්ඩල තිරණ පසු විපරම් කිරීම<br>• අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය අභ්‍යන්තර සහ බාහිර තොරතුරු ලබාගැනීමට සහය වීම |
| 1.1.6. | අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය | විවිධ ක්ෂේත්‍රවල (මූල්‍ය, වාණිජ, සේවායෝජක සංගම් වෘතීය සමිති ආදි) නිරත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් එහි කටයුතු සමබර ලෙස පවත්වාගෙන ගනු ලබයි. සෑම කරුණක් සම්බන්ධයෙන් ස්වාධීන මතයක් ලබා දෙනු ලබයි. |
| 1.1.7. | එලදායි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් කාලය | අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැයවූ සාමාන්‍ය කාලය ආසන්න වශයෙන් පැය 03 කි. |
| **1.2.** | **සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී** | |
| 1.2.1. | සභාපතිවරයා පත්කිරීම | මණ්ඩලයේ සභාපති/ ප්‍රධන විධායක නිලධාරී පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබයි |
| 1.2.2. | සභාපතිවරයාගේ වගකීම | සභාපති/ප්‍රධාන විධායක නිලධාරී විසින් ආයතනයේ සම්පූර්ණ යහපාලන ව්‍යුහය තුළ සේවක මණ්ඩලය සහ ආයතනය නිවැරදි දිශාවට ගමන් කරවීම සඳහා නායකත්වය සපයනු ලබයි. ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ පූර්ව නිගමනය කරන ලද ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ඔහුගේ ප්‍රධාන වගකීම් ලෙස සැලකේ. |
| **2.වගකිම් සහ විගණනය** | | |
| **2.1.** | **මූල්‍ය වාර්තාකරණය** | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට සහ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනතට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත. |
| 2.1.1. | ව්‍යාවස්ථාපිත සහ නියාමන වාර්තාකරණය | ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තියට අනුකූලව සියළුම රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය විගණකාධිපතිවරයා විසින් සිදුකල යුතුය. විගණකාධිපතිවරයා විසින් ඔහුගේ අධීක්ෂණය සහ පාලනයට යටත්ව වෙනත් සුදුසුකම් ලත් විගණයෙකුගේ සේවාව ලබාගැනීමට අවකාශ ඇත. |
| 2.1.2. | මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකිම | විගණකාධිපති වාර්තාවට යොමු වන්න. |
| 2.1.3. | වාර්ෂික වාර්තාවේ ඇතුලත් අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනයට යොමුවන්න. |
| 2.1.4. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශණය | අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනයට යොමුවන්න |
| 2.1.5. | කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ | කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණයට යොමු වන්න |

| යහපාලන මූලිකාංග | | 2016 වසර පිළිබඳ පැහැදිලි කිරීම් |
|---|---|---|
| 2.2. | **අභ්‍යන්තර පාලනය** | |
| 2.2.1. | අභ්‍යන්තර විගණක කාර්යභාරය | සේ නි භාර අරමුදල් මණ්ඩලය සඳහා වෙනමම විගණන කොට්ඨාශයක් පිහිටුවා ඇත |
| 2.2.2. | අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය පිළිබඳ විගණන කමිටු සමාලෝචනය | අභ්‍යන්තර විගණන කොට්ඨාශය විසින් නිරන්තරයෙන් මූල්‍ය වාර්තාකරණය ඇතුලත්ව අභ්‍යන්තර පාලනය, ඵලදායිතාවය පිළිබඳ විගණන කමිටුවට වාර්තා කරනු ලබයි. |

## අනු කමිටු

මණ්ඩලයේ ඵලදායි මෙහෙයුම් කටයුතු සම්බන්ධ තීරණ ගැනීම නිසි අවධානයකින් පසුව සිදුකර ඇති බවට තහවුරු කර ගැනීම සඳහා එම කටයුතු වලින් මණ්ඩලයට ප්‍රමාණාත්මක බලපෑමක් සහිත කරුණු සම්බන්ධව විමසා බැලීම සඳහා සුදුසු පුද්ගලයින්ගෙන් සමන්විත කමිටු පිහිටුවීම කළමාකරණයේ වගකීමක් ලෙස සලකා පහත සඳහන් අනු කමිටු ස්ථාපිත කර ඇත :-

### I. විගණන කමිටුව

මෙම කමිටුව සඳහා අඩු වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 03 දෙනෙකු ඇතුලත් විය යුතු අතර, මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජිකයා විසින් හා මූල්‍ය කළමනාකරණය පිළිබඳව ප්‍රමාණවත් නිපුනත්වයක් ඇති පුද්ගලයෙකු විසින් එහි සභාපතිත්වය දරණු ලබයි. එම කමිටුව අඩු වශයෙන් මාස තුනකට 03 වරක් රැස්විය යුතු අතර, ප්‍රධාන අභ්‍යන්තර විගණක එහි කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. මෙම කමිටුවේ නිරීක්ෂණ සහ අදාල නිර්දේශ සම්බන්ධ වාර්තාවක් සුදුසු ක්‍රියාමාර්ග ගැනිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වෙත යොමුකල යුතුය.

පහත සඳහන් කරුණු මෙම කමිටුවේ විෂය පථය යටතට ඇතුලත්වේ.

- අභ්‍යන්තර විගණනයේ වගකීම් නියමනය කිරීම සහ වාර්ෂික විගනන සැලැස්ම සමාලෝචනය කිරීම
- ආයතනයේ සියළුම ක්‍රියාකාරකම් සම්බන්ධව අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ ඇගයීම
- නිශ්චිත කාල පරාස තුළ ප්‍රගතිය සමාලෝචනය කිරීම
- බාහිර විගණක සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සහ විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් අවධානය යොමුකර සුදුසු පියවර ගැනීමට මඟ පෙන්වීම
- ව්‍යාවස්ථාපිත අවශ්‍යතාවයන්ට, නීතීරීති, රෙගුලාසි සහ චක්‍රලේඛ වලට අනුකූලවීම පිළිබඳව සොයා බැලීම
- මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවීම පිළිබඳව සමාලෝචනය කිරීම
- අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සුදුසු පියවර ගැනීම සඳහා සමාලෝචනය කිරීම
- රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ අනුකමිටුව විසින් නිර්දේශණ/විධාන කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනය කිරීම
- වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා විගණන කමිටු වාර්තාවක් පිළියෙල කිරීම

#### විගණන කමිටුවේ නියෝජනය


- **චම්පා බාලසූරිය මහත්මිය**
  විගණන කමිටුවේ සභාපති/ අධ්‍යක්ෂ
  ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත
- **ශිතා සේනාරත්න මෙනවිය**
  අතිරේක ලේකම්/අධ්‍යක්ෂ
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- **පී රණවකආරච්චි මහතා**
  අධ්‍යක්ෂ / වෘත්තීය සමිති නියෝජිත
- අතිරේක සාමාන්‍යාධිකාරී
- සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු සහ සහකාර සාමාන්‍යාධිකාරීවරු

### II. කළමනාකරණ කමිටු

අරමුදලේ මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ ක්‍රියාත්මත කිරීමේ වගකීම ඔවුන් සතු වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලයට වඩාත් නිවැරදි තිරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් සභාපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් ලබාදෙනු ලැබේ. ඔවුන් විසින් ඵලදායි කළමනාකරණය තුලින් මණ්ඩලයේ අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙහෙයුම් සැලසුම්, අයවැය ලේඛණ සහ පද්ධති හා පාලන ක්‍රමවේද සකස් කිරීම සිදුකරනු ලබයි.

එමනිසා, මණ්ඩලයේ ප්‍රගති සමාලෝචනයේදි සහ අධීක්ෂණයේදී කළමනාකරන කමිටුව ඉතා වැදගත් කළමනාකරණ උපකරණයක් ලෙස ක්‍රියාකරනු ලබයි. මෙම කමිටුව විසින් විශේෂ අවධානය යොමුකල විශේෂ කරුණු කිහිපයක් පහතින් දක්වා ඇත.

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ
- සත්‍ය සහ ඉලක්කගත ප්‍රගතිය සමාලෝචනය කිරීම වෙනස්කම් සඳහා හේතු සොයා අවශ්‍ය පිළියම් යොදම්
- මුදල් ප්‍රවාහ සහ ඉදිරි කාර්තුවේ ඉලක්ගත අවශ්‍යතා ගැඹුරින් සමාලෝචනය කිරීම
- ණය සහ මුදල් කළමනාකරණය
- හදිසි මිලදී ගැනිම් වලින් වැලකීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදවීමේ පිළබඳව පසුවිපරම් කිරීම
- සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ බදු ආදී ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත කාලයට කිරීම පිළිබද තහවුරු කර ගැනීම
- මණ්ඩලයේ තීරණ ගැනිමේ ක්‍රියාවලිය පහසුකරලීම සඳහා උසස් තොරතුරු තාක්ෂණ දැනුම ලබාගැනීම
- පාරිතෝෂිත සේවා පිළිබඳ අදහස් සහ පැමිණිලි පිළිබඳ පසුවිපරම් කර ඒවා දියුණු කිරීමට අවසාන පියවර ගැනීම
- නව යෝජනා ආයතනික සැලැස්මට ඇතුලත් කිරීම
- සියළු ආයතනික සහ පරිපාලනමය කටයුතු
- අනිකුත් සියළුම එදිනෙදා මෙහෙයුම් කටයුතු




### III. ආයෝජන කමිටුව

මණ්ඩලයේ අරමුදල් ආයෝජනය කිරීමේ මූලික පරමාර්ථය ලෙස සලකනු ලබන්නේ ආයෝජිත මූලික මුදල ආරක්ෂා කර ගනිමින් මණ්ඩලයේ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ද්‍රවශීලතාවයද කළමනාකරණය කර ගනිමින් අනුමත ආයෝජන මත ප්‍රශස්ත ප්‍රතිලාභයක් ලබාදීමයි. ඒ අනුව ආයෝජන කමිටුව විසින් මෙම අරමුණු 03 සාක්ෂාත් කර ගැනීමට

- ආරක්ෂාව (Safety)
  මණ්ඩලයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ ආයෝජිත ප්‍රාග්ධනයේ ආරක්ෂාවයි. ඒ අනුව ප්‍රාග්ධනයේ ආරක්ෂාව තහවුරු වනු පිණිස මුළු ආයෝජනයෙන් විශාල කොටසක් රජයේ ආරක්ෂිත සුරැකුම්පත් වල ආයෝජනය කර ඇත.
- ද්‍රවශීලතාවය (Liquidity)
  ආයතනයේ මෙහෙයුම් අවශ්‍යතා වෙනුවෙන් සාධාරන ලෙස පුරෝකථනය කලහැකි ප්‍රමාණයක් ද්‍රවශීලතා අවශ්‍යතාවයට සරිලන පරිදි ආයෝජන පවත්වාගෙන යාම මින් අදහස් කෙරේ.
- ආයෝජන මත ප්‍රතිලාභ (Return on Investment)
  අනුමත අයෝජන තුලින් ප්‍රශස්ථ ප්‍රතිලාභයක් ලැබෙන ලෙස ආයෝජන සංයුතිය නිර්මානය කර තිබීම මින් බලාපොරොත්තු වේ.

## අනුකමිටු වල විධායක සාරාංශය

| අනු කමිටුව | ආවරණය | සංයුතිය |
|---|---|---|
| I. විගණන කමිටු | • අභ්‍යන්තර පාලන සමාලෝචනය<br>• අභ්‍යන්තර විගණනයේ සමාලෝචනය<br>• බාහිර විගණනයේ සමාලෝචනය<br>• මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය | • අධ්‍යක්ෂවරු තිදෙනෙක්<br>• සියළුම නියෝජ්‍ය සහ සහකාර සාමාන්‍යාධිකාරීවරු |
| II. කළමනාකරණ කමිටු | • මෙහෙයුම් කටයුතු සමාලෝචනය<br>• ප්‍රගති සමාලෝචනය | • සභාපති<br>• ක්‍රියාකාරී අධ්‍යක්ෂක<br>• ජ්‍යෙෂ්ඨ කළමනාකරනය |
| III. ආයෝජන කමිටු | • මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්තිය<br>• ආයෝජන කළඹ සහ එහි ප්‍රගතිය<br>• නවතම පාරිසරික සාධක සමාලෝචනය | **භාණ්ඩාගාර නියෝජිත**<br>• රේඛීය අමාත්‍යාංශ නියෝජිත<br>• අතිරේක සාමාන්‍යාධිකාරී<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන)<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) - නීරීක්ෂක<br>**ආයෝජන කමිටුව**<br>• සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)<br>• මුදල් අංශයේ මූල්‍ය කළමණාකරුවන් දෙදෙනෙක්<br>• ආයෝජන විශ්ලේෂකයන් තිදෙනෙක් |

# අවදානම් කළමනාකරණ වාර්තාව



## අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකාව ප්‍රමුඛතම සමාජ ආරක්ෂණ අරමුදලක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පුද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ දිගුකාලීන ඉතුරුම් කළමනාකරනය කරන අතර, ඔවුන්ගේ සාමාජික අරමුදල් වල ආරක්ෂාව තහවුරු කරමින් උපරිම විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමක් සිදුකරනු ලබයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල මුල්‍ය අංශය තුළ කටයුතු කරන ප්‍රධානතම ආයතනයක් ලෙස රජයේ සුරැකුම්පත් වල විශාල වශයෙන් ආයෝජන කර ඇති අතර, කොළඹ කොටස් හුවමාරුව තුළ වෙළඳපොල ප්‍රාග්ධන අගයෙන් 0.3% කට ආසන්න ප්‍රතිශතයක් හිමිකරගෙන සිටී. එම නිසා කළමනාකරණය විසින් අරමුදල සම්බන්ධිත අවදානම් කළමනාකරනය පිළිබඳව ඉහළ අවධානයක් යොමු කර ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සම්බන්ධයෙන් පවතින ප්‍රධානතම අවදානම් ණය අවදානම, වෙළඳපොල අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් අවදානම ලෙස හඳුනාගෙන ඇත.

## ණය අවදානම

ණය අවදානම යනු කිසියම් අවස්ථාවක ණයකරු විසින් අදාල ණය මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් පැන නඟින අවදානමයි. අරමුදලේ ආයෝජන වලින් 84.5 ක පමණ ප්‍රතිශතයක් (2016 දෙසැම්බර් 31 දිනට) අවදානම් රහිත රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කර ඇති බැවින් අරමුදලේ ණය අවදානම අවම මට්ටමක පැවතුනි. මුළු ආයෝජන වලින් 1% ක් පමණ ආයතනික ණයකර වල ආයෝජනය කර ඇති අතර, එම ණයකර වල ශ්‍රේණිගත මට්ටම සහ අනෙකුත් අවදානම් සාධක සලකා බැලීමෙන් පසුව පමණක් මෙවැනි ආයෝජන සිදුකරනු ලබයි. මීට අමතරව මුළු ආයෝජන වලින් 0.3% කට ආසන්න ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත් වලින් සුරක්ෂිත කරන ලද ප්‍රති මිලදී ගැණුම් වල ආයෝජනය කර ඇත. මේ අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ණය අවදානම ඉතා පහළ මට්ටමක පැවතුනි.

## වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම ලෙස සලකනු ලබන්නේ මුල්‍ය වෙළඳපොලේ ඇතිවන උච්චාවචනයන් සමඟ ඇතිවන අවදානමයි.

වර්තමානයේදී වෙළඳපොල අවදානම තුලින් පැන නඟින පොළී අනුපාත අවදානම සහ ස්කන්ධ අවදානම තුලින් අරමුදලට සෘජු බලපෑමක් සිදුකරනු ලැබේ. වෙළඳපොල පොළී අනුපාත වැඩිවන විට භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන වල අගයේ පිරිහීමක් (මිළ අවදානම) සිදුවන අතර, පොළී අනුපාත අඩුවන අවස්ථාවක අරමුදල් අඩු පොළී අනුපාත යටතේ නැවත ආයෝජනය කිරීමට සිදුවේ. (නැවත ආයෝජන අවදානම) කෙසේ වුවද, විවිධ පරිනත කාලසීමාවන් සහ ඵලදා අනුපාත යටතේ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන තෝරා ගැනිම තුළින් මෙම අවදානම කාලානුරූපව කළමනාකරණය කර ඇත. කිසියම් ආයෝජන කළඹක ඇතුලත් කොටස් ආයෝජන ප්‍රමාණය අනුව ස්කන්ධ අවදානම තීරණය කෙරේ. වෙළඳපොළේ කොටස් වල මිල අඩුවීමත් සමඟම මෙම තත්වය ඇතිවිය හැකිය. ආයෝජන කළඹ සඳහන් සීමාවන් පැනවීම මගින් සහ විවිධ ක්ෂේත්‍ර වලට විවිධාංගීකරණය කිරීම තුළින් මෙම අවදානම අවම කර ගත හැක. (එනම් බැංකු, මුල්‍ය සහ රක්ෂණ, විවිධාංගීකරනය වු සමාගම් නිශ්පාදන බලශක්ති සහ ආහාරපාන) මෙම මුලික නිර්නායකයන්ට අමතරව ආයෝජනයට පෙර අදාල සමාගම්, වල කළමනාකරණයේ තත්වය ඇගයීමකට ලක්කරනු ලැබේ. මුළු ආයෝජන වල ප්‍රතිශතයක් ලෙස කොටස් වෙළඳපොල ආයෝජනය සියයට 5.4 ක් පමණ වන බැවින් සමස්ථයක් වශයෙන් එහි අවදානම අවම මට්මක පැවතුනි.

## ද්‍රවශීලතා අවදානම

කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගැනිමට නොහැකි වීමේ අවදානම ද්‍රවශීලතා අවදානම ලෙස සැලකේ. කිසියම් ආයෝජනයක් සඳහා ඇතිවිය හැකි අලාභයක් වලකා ගැනිමට හෝ අවම කර ගැනීමට එවැනි ආයෝජන මිලදී ගැනිමට හෝ විකිණීමට වෙළඳපොල තත්වයක් නොමැති වීම තුලින් මෙවැනි තත්වයක් උදාවිය හැකිය. සාමාජික මුදල ආපසු ගෙවීමෙන් පසුව එළඹෙන මාසික සාමාන්‍ය ශුද්ධ දායක මුදල රුපියල් මිලියන 548 ක් පමණවූ අතර, ඒ තුලින් අරමුදලේ ද්‍රවශීලතාවය ඉහළ මට්ටමකින් පවත්වා ගැනිමට හැකිවිය. අනෙකුත් මුදල් ප්‍රවාහ එනම්, ආයෝජන ආදායම්, ආයෝජන පරිනත වීමෙන් ලැබෙන මුදල් ආදියද සැලකිල්ලට ගත්විට 2016 වසර අවසානය වන විට මුළු අරමුදල් ලැබීම් හා සැසඳීමේදී දායක මුදල් ආපසු ගෙවීම් වල ප්‍රතිශතය 67% ක් පමණ විය. මීට අමතරව ඉතා ඉහළ ද්‍රවශීලතාවයක් සහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජන පවතින බැවින්, එය ද්‍රවශීලතා ගැටළු මගහරවා ගැනීමට අමතර වාසියක් සලසනු ලැබේ. ද්‍රවශීලතා කළමනාකරණ උපාංගයක් ලෙස ප්‍රතිමිලදී ගැනිම් (REPO) වල ආයෝජනය කර දිනපතා අවශ්‍ය වන අරමුදල් සම්පාදනය කර ගන්නා අතරම සාධාරණ පොළී ආදායමක්ද උපයා ගනු ලැබේ. එබැවින් අරමුදලට සම්බන්ධිත ද්‍රවශීලතා අවදානමද අවම මට්ටමකින් පවත්වා ගැනිමට හැකිවී ඇත.

## මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ආයතනයේ මෙහෙයුම් කටයුතු වල පවතින ආවේනික අවදානමයි. එය මූල්‍ය අවදානම සහ ක්‍රමානුකූල අවදානම නිගමනය කිරීමෙන් පසුව ඇතිවන ඉතිරිවූ අවදානම වන අතර, අභ්‍යන්තර ක්‍රමවේද කාර්ය මණ්ඩලය සහ පද්ධති වල දුර්වලතාද මේ තුලට ඇතුලත් වේ. තොරතුරු තාක්ෂණය සම්බන්ධව අවදානම මිනිසුන් අතින් සිදුවන වැරදි, මැදිහත්වීම් සහ ස්වභාවික ආපදාවන් මෙහෙයුම් අවදානමේ ප්‍රධාන මූලාශ්‍රයන් අතරට ඇතුලත් වේ. මෙම අවදානම අවමකර ගැනීම සඳහා අරමුදල මගින් ඉතා ඉහළ මට්ටමේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත. මෙහෙයුම් කටයුතු අභ්‍යන්තර විගණක විසින් ස්වාධිනව විගණනය කරන අතර, විගණන නිරීක්ෂණ වලින් හඳුනාගන්නා ලද දුර්වලතා සහ වෙනස්වීම් සඳහා නිසි අවධානයක් යොමුකරනු ලැබේ.

# මූල්‍ය
# තොරතුරු

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සහ
වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

# මූල්‍ය ප්‍රකාශන 2016

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභාලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| | | සමූහය | | සමාගම/ මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **මුළු අදායම** | | | | | |
| පොළී ආදායම | 5 | 23,530,300 | 20,277,559 | 23,492,350 | 20,274,204 |
| (-) පොළී වියදම - 3% සේනිහා අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව | | (6,759,768) | (6,013,817) | (6,759,768) | (6,013,817) |
| ශුද්ධ ලාභ/(අලාභ) | 6 | 1,114,228 | (78,146) | - | - |
| ලාභාංශ ආදායම | 7 | 486,194 | 360,582 | 486,194 | 360,582 |
| ලාභ/ අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැලපීමෙන් ලද ලාභ/අලාභ | 8 | 68,592 | 833,850 | 68,592 | 833,850 |
| වෙනත් ආදායම් | 9 | 540,511 | 332,623 | 531,650 | 320,139 |
| | | **18,980,056** | **15,712,651** | **17,819,018** | **15,774,958** |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | | | |
| සේවක මණ්ඩල වියදම් | 10 | 1,059,412 | 1,048,211 | 985,963 | 994,389 |
| පරිපාලන වියදම් | 11 | 161,514 | 147,519 | 140,819 | 132,608 |
| මූල්‍ය වියදම් | 12 | 7,967 | 14,336 | 2,904 | 1,988 |
| සාමාජික වියදම් | 13 | 454,466 | 429,610 | 454,466 | 429,610 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | 14 | 40,660 | 43,515 | 15,290 | 16,896 |
| ප්‍රවර්ථන වර්ෂයේ ගෙවන ලද පොළී | | 173,630 | 148,737 | 173,630 | 148,737 |
| සක්න්ධ අයෝජනයන්හි වත්කම් හානිකරණය | 19 | 283 | - | 283 | - |
| | | **1,897,931** | **1,831,929** | **1,773,355** | **1,724,228** |
| **ආදායම් බදු වලට පෙර ලාභය** | | **17,082,125** | **13,880,722** | **16,045,663** | **14,050,730** |
| ආදායම් බදු වියදම | 15 | (2,733,111) | (2,007,460) | (2,394,498) | (2,060,646) |
| **ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැලපුම** | | **14,349,014** | **11,873,262** | **13,651,165** | **11,990,084** |
| **විභජනය කළහැකි ලාභය** | | | | | |
| සමාගම් කොටස් හිමියන් | | 14,279,229 | 11,884,945 | 13,651,165 | 11,990,084 |
| පාලනයට ප්‍රයෝජනවත් නොවන අයිතින් | | 69,785 | (11,682) | - | - |
| **ගලපන ලද වර්ෂයේ ලාභය** | | **14,349,014** | **11,873,262** | **13,651,165** | **11,990,084** |
| **ඉ/ගෙ. රඳවාගත් ලාභය** | | **3,317,869** | **18,090** | **3,317,869** | **18,090** |
| විසර්ජනය සඳහා වූ ලාභය | | 14,349,014 | 15,082,088 | 13,651,165 | 15,327,413 |
| **විසර්ජනය සඳහා වූ මුළු ලාභය** | | **17,666,883** | **15,100,178** | **16,969,034** | **15,345,503** |
| අඩුකලා: යෝජිත විභජනය - ලාභාංශ 6% | | 13,519,536 | 12,027,634 | 13,519,536 | 12,027,634 |
| අඩුකලා: ලාභාංශ - ලංකා ලුණු සමාගම | | 180,000 | 7,875 | - | - |
| **විසර්ජනයට පසු ලාභය** | | **3,967,347** | **3,064,669** | **3,449,498** | **3,317,869** |

පිටු අංක 51 සිට 82 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ. මෙම අවසාන ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
නිවැරදි බවට සහතික කළේ,

..................................................
**එම් ඒ වී කුමුදිනි**
මූල්‍ය කළමනාකාරිනි

..................................................
**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන ලදි.

..................................................
**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභාලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| | | සමූහය | | සමාගම/ මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | | | |
| **වස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ප්‍රතිවර්ගීකරණය කල හෝ කලහැකි අයිතම** | | | | | |
| විකිණීම පිණිස ඇති මූල්‍ය උපකරණ සංචිතයට මාරු කිරීම | | (964,030) | 60,425 | (964,030) | 60,425 |
| විකිණීම සඳහා ඇති සංචිත (ඒකක) | | (3,846) | - | (3,846) | - |
| **වස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ප්‍රතිවර්ගීකරණය නොකල අයිතම** | | | | | |
| ආයුගණන ලාභය / (අලාභය) | | 500 | (29,794) | 500 | (29,794) |
| වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම) සඳහා ආදායම් බදු | | - | - | - | - |
| **වර්ෂය සඳහාවූ බදු පසු වෙනත් විස්තීර්ණ ආදායම** | | **(967,376)** | **30,631** | **(967,376)** | **30,631** |
| **වර්ෂය සඳහාවූ බදු පසු විස්තීර්ණ ආදායම** | | **13,381,638** | **11,903,893** | **12,683,789** | **12,020,715** |
| **විභජනය කළහැකි මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| සමාගමේ ස්කන්ධ හිමියන් | | 13,311,853 | 11,915,576 | 12,683,789 | 12,020,715 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන් | | 69,785 | (11,682) | - | - |
| **බදුවලට පසු වර්ෂය සඳහාවූ මුළු ශුද්ධ විස්තීර්ණ ආදායම** | | **13,381,638** | **11,903,893** | **12,683,789** | **12,020,715** |

පිටු අංක 51 සිට 82 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සදහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ. මෙම අවසාන ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
නිවැරදි බවට සහතික කළේ,

**එම් ඒ වී කුමුදිනි**
මූල්‍ය කළමනාකාරිනි

**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන ලදි.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | සමූහය | | සමාගම/ මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 748,033 | 863,226 | 614,332 | 841,949 |
| විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම් | | 1,955,837 | 1,494,287 | 1,955,837 | 1,494,287 |
| පරිපාලිතයන්හි ආයෝජන | 17 | - | - | 470,961 | 470,961 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 18 | 9,209,233 | 8,837,699 | 9,209,233 | 8,837,699 |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන | 19 | 223,110,604 | 198,376,078 | 222,454,509 | 198,305,886 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය ආයෝජන | 20 | 1,357,817 | 1,364,362 | 1,343,876 | 1,336,538 |
| අනෙකුත් වත්කම් | 21 | 9,591,507 | 8,213,782 | 9,214,010 | 8,053,014 |
| දේපළ, පිරියත සහ උපකරණ | 22 | 1,101,719 | 896,635 | 176,379 | 173,144 |
| කල්බදු දේපල | 23 | 5,576 | 6,273 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 24 | 192 | 266 | 192 | 266 |
| ආයෝජන දේපළ | 25 | 3,400,000 | 3,200,000 | 3,400,000 | 3,200,000 |
| **මුළු වත්කම්** | | **250,480,519** | **223,252,608** | **248,839,330** | **222,713,744** |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | | | |
| **බැරකම්** | | | | | |
| පොළියට යටත්වූ ණය | 26 | 227,124 | 53,667 | - | - |
| ප්‍රදාන සහ සහනාධාර | 27 | 38,041 | 41,258 | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ බැරකම | 28 | 401,707 | 356,924 | 202,603 | 193,085 |
| ප්‍රවර්තන බදු බැරකම | | 270,909 | 33,582 | 81,082 | 33,582 |
| අනෙකුත් බැරකම් | 29 | 507,483 | 355,606 | 101,501 | 158,766 |
| ප්‍රතිපාදන | 30 | 87,841 | 213,754 | 87,841 | 213,754 |
| **මුළු බැරකම්** | | **1,533,106** | **1,054,790** | **473,027** | **599,187** |
| ස්කන්ධ | | 248,842,206 | 222,142,396 | 248,366,304 | 222,114,558 |
| පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන් | | 105,207 | 55,422 | - | - |
| **මුළු ස්කන්ධය** | | **248,947,413** | **222,197,818** | **248,366,304** | **222,114,558** |
| **මුළු බැරකම් හා ස්කන්ධය** | | **250,480,519** | **223,252,608** | **248,839,330** | **222,713,744** |

පිටු අංක 51 සිට 82 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ සදහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ. මෙම අවසාන ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.
නිවැරදි බවට සහතික කළේ,

**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**එම් ඒ වී කුමුදිනි**
මූල්‍ය කළමනාකාරිනි

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කරන ලදි.

**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිළධාරී

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ**
**ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**

| සමූහය | ආයතනයේ ස්කන්ධ හිමිකරුවන් වෙත ආරෝපනය කළ හැකි | | | | | | | | | | පාලනයට ප්‍රමාණවත් නොවන අයිතිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික අරමුදල | | | | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා ඇති මූල්‍ය සංචිතය | වෙනත් සංචිතය | ලාභාංශ තුළන සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | පෙර අත්පත් කරගත් සංචිතය | | |
| | දායක මුදල | පොළිය | ලාභාංශ | සාමාජික අරමුදල | | | | | | | | |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | | | | **193,868,676** | **18,090** | **1,468,737** | | **142,000** | **3,155,730** | **140,853** | **67,979** | **198,862,065** |
| නැවත ප්‍රකාශිත බදු වත්කම් | | | | | 128,503 | | | | | | | 128,503 |
| පෙර වර්ෂ ගැලපුම් - බදු | | | | | 30,073 | | | | | | | 30,073 |
| පෙර වර්ෂයේ ගැලපුම් - බදුවියදම 2015 | | | | | (30,073) | | | | | | | (30,073) |
| භාණ්ඩාගාර බැඳුම්කර ගැලපීම | | | | | 74,995 | | | | | | | 74,995 |
| උපලබ්ධිවූ ප්‍රාග්ධන ලාභ - කොටස් | | | | | | (475,070) | | | | | | (475,070) |
| මිළ ප්‍රකාශිත කොටස් ආයෝජන (දිගු කාලීන) | | | | | | (871,627) | | | | | | (871,627) |
| පෙර වර්ෂයේ දායක මුදල් ගැලපීම | | | | (2,815) | | | | | | | | (2,815) |
| දායක මුදල් ලැබීම් | 18,087,249 | | | 18,087,249 | | | | | | | | 18,087,249 |
| ආපසු ගෙවීම් | (11,492,543) | | | (11,492,543) | | | | | | | | (11,492,543) |
| සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | | 6,013,817 | | 6,013,817 | (6,013,817) | | | | | | | - |
| ලාභාංශ 7.0% | | | 12,027,634 | 12,027,634 | (12,027,634) | | | | | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 18,003,901 | | | | | | (11,682) | 17,992,219 |
| පරිපාලිතය මගින් ගෙවූ ලාභාංශ | | | | | | | | | | | (875) | (875) |
| පරිපාලිතයෙහි ස්කන්ධයන්හි වෙනස්වීම් | | | | | | | | | | (113,015) | | (113,015) |
| විකිණීම පිණිස ඇති සංචිතය | | | | | | 60,425 | | | | | | 60,425 |
| අසම්භාව්‍ය වගකීම් වෙන්කිරීම් | | | | | | | (21,900) | | | | | (21,900) |
| තැන්පතු - සමර්විල් සහ සමාගම | | | | | (21,900) | | 21,900 | | | | | - |
| ආයුගණන ලාභය / (අලාභය) | | | | | | | (29,794) | | | | | (29,794) |
| පෙර හඳුනාගත් ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ මාරුකිරීම | | | | | 3,155,730 | | | | (3,155,730) | | | - |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,594,705** | **6,013,817** | **12,027,634** | **218,502,017** | **3,317,869** | **182,466** | **(29,794)** | **142,000** | **-** | **27,838** | **55,422** | **222,197,818** |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | | | | **218,502,017** | **3,317,869** | **182,466** | **(29,794)** | **142,000** | **-** | **27,838** | **55,422** | **222,197,818** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ**
**ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය**

| සමූහය | ආයතනයේ ස්කන්ධ හිමිකරුවන් වෙත ආරෝපනය කළ හැකි | | | | | | | | | | පාලනයට ප්‍රමාණවත් නොවන අයිතිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික අරමුදල | | | | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා ඇති මූල්‍ය සංචිතය | වෙනත් සංචිතය | ලාභාංශ තුළන සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | පෙර අත්පත් කරගත් සංචිතය | | |
| | දායක මුදල | පොළිය | ලාභාංශ | සාමාජික අරමුදල | | | | | | | | |
| පෙර වර්ෂ ගැලපුම් - බදු | | | | | 30,376 | | | | | | | 30,376 |
| පෙර වර්ෂයේ ගැලපුම් - බදුවියදම 2016 | | | | | (30,376) | | | | | | | (30,376) |
| උපලබ්ධිවූ ප්‍රාග්ධන ලාභ කොටස් - කොටස් සංචිත ගිණුම | | | | | | (15,395) | | | | | | (15,395) |
| පෙර වර්ෂයේ දායක මුදල් ගැලපීම | | | | (16,607) | | | | | | | | (16,607) |
| දායක මුදල් ලැබීම් | 20,318,193 | | | 20,318,193 | | | | | | | | 20,318,193 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (13,478,002) | | | (13,478,002) | | | | | | | | (13,478,002) |
| සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | | 6,759,768 | | 6,759,768 | (6,759,768) | | | | | | | - |
| ලාභාංශ 6.0% | | | 13,519,536 | 13,519,536 | (13,519,536) | | | | | | | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | | | | | 20,410,933 | | | | | | 69,785 | 20,480,718 |
| පරිපාලිතය මගින් ගෙවූ ලාභාංශ | | | | | | | | | | | (20,000) | (20,000) |
| පරිපාලිතයෙහි ස්කන්ධයන්හි වෙනස්වීම් | | | | | | | | | | 448,064 | | 448,064 |
| විකිණීම පිණිස ඇති සංචිතය | | | | | | (173,479) | | | | | | (173,479) |
| විකිණීම පිණිස ඇති සංචිතය (කොටස්) | | | | | | (3,846) | | | | | | (3,846) |
| පරිපාලිතයන්හි ආයෝජන වල සාධාරන වටිනාකම පෙරපරදි තත්වයට ගෙනඒම | | | | | | (790,551) | | | | | | (790,551) |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | | | | | 200,000 | | | 200,000 |
| ආයුගණන ලාභය / (අලාභය) | | | | | | | 500 | | | | | 500 |
| ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ මාරුකිරීම් | | | | | | | | | (200,000) | | | (200,000) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,840,190** | **6,759,768** | **13,519,536** | **245,604,905** | **3,449,498** | **(800,805)** | **(29,295)** | **142,000** | **-** | **475,902** | **105,207** | **248,947,413** |

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ
## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

| සමූහය | ආයතනයේ ස්කන්ධ හිමිකරුවන් වෙත ආරෝපනය කළ හැකි | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික අරමුදල | | | | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා ඇති මූල්‍ය සංචිතය | වෙනත් සංචිතය | ලාභාංශ තුළන සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
| | දායක මුදල | පොළිය | ලාභාංශ | සාමාජික අරමුදල | | | | | | |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | **-** | **-** | **-** | **193,868,676** | **18,090** | **1,468,737** | **-** | **142,000** | **3,155,730** | **198,653,233** |
| නැවත ප්‍රකාශිත බදු වත්කම් | - | - | - | - | 128,503 | - | - | - | - | 128,503 |
| පෙර වර්ෂ ගැලපුම් - බදු | - | - | - | - | 30,073 | - | - | - | - | 30,073 |
| පෙර වර්ෂයේ ගැලපුම් - බදුවියදම 2015 | - | - | - | - | (30,073) | - | - | - | - | (30,073) |
| භාණ්ඩාගාර බැඳුම්කර ගැලපීම | | | | | 74,995 | | | | | 74,995 |
| උපලබ්ධිවූ ප්‍රාග්ධන ලාභ - කොටස් | - | - | - | - | - | (475,070) | - | - | - | (475,070) |
| මිළ ප්‍රකාශිත කොටස් ආයෝජන (දිගු කාලීන) | - | - | - | - | - | (871,627) | - | - | - | (871,627) |
| පෙර වර්ෂයේ දායක මුදල් ගැලපීම | - | - | - | (2,815) | - | - | - | - | - | (2,815) |
| දායක මුදල් ලැබීම් | 18,087,249 | - | - | 18,087,249 | - | - | - | - | - | 18,087,249 |
| ආපසු ගෙවීම් | (11,492,543) | - | - | (11,492,543) | - | - | - | - | - | (11,492,543) |
| සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | - | 6,013,817 | - | 6,013,817 | (6,013,817) | - | - | - | - | - |
| ලාභාංශ 6.0% | - | - | 12,027,634 | 12,027,634 | (12,027,634) | - | - | - | - | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | - | - | - | - | 18,003,901 | - | - | - | - | 18,003,901 |
| විකිණිම පිණිස ඇති සංචිතය | - | - | - | - | - | 60,425 | - | - | - | 60,425 |
| අසම්භාවය වගකීම් වෙන්කිරීම් | - | - | - | - | - | - | (21,900) | - | - | (21,900) |
| තැන්පතු - සමර්චිල් සහ සමාගම | - | - | - | - | (21,900) | - | 21,900 | - | - | - |
| ආයුගණන ලාභය / (අලාභය) | - | - | - | - | - | - | (29,794) | - | - | (29,794) |
| පෙර හඳුනාගත් ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ මාරුකිරීම | - | - | - | - | 3,155,730 | - | - | - | (3,155,730) | - |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,594,705** | **6,013,817** | **12,027,634** | **218,502,017** | **3,317,869** | **182,466** | **(29,794)** | **142,000** | **-** | **222,114,558** |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | **-** | **-** | **-** | **218,502,017** | **3,317,869** | **182,466** | **(29,794)** | **142,000** | **-** | **222,114,558** |



## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ
## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

| සමූහය | ආයතනයේ ස්කන්ධ හිමිකරුවන් වෙත ආරෝපනය කළ හැකි | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සාමාජික අරමුදල | | | | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා ඇති මූල්‍ය සංචිතය | වෙනත් සංචිතය | ලාභාංශ තුළන සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
| | දායක මුදල | පොළිය | ලාභාංශ | සාමාජික අරමුදල | | | | | | |
| පෙර වර්ෂ ගැලපුම් - බදු | - | - | - | - | 30,376 | - | - | - | - | 30,376 |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | - | - | - | - | (30,376) | - | - | - | - | (30,376) |
| උපලබ්ධිවූ ප්‍රාග්ධන ලාභ කොටස් - කොටස් සංචිත ගිණුම | - | - | - | - | - | (15,395) | - | - | - | (15,395) |
| පෙර වර්ෂයේ දායක මුදල් ගැලපීම | - | - | - | (16,607) | - | - | - | - | - | (16,607) |
| දායක මුදල් ලැබීම් | 20,318,193 | - | - | 20,318,193 | - | - | - | - | - | 20,318,193 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (13,478,002) | - | - | (13,478,002) | - | - | - | - | - | (13,478,002) |
| සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | - | 6,759,768 | - | 6,759,768 | (6,759,768) | - | - | - | - | - |
| ලාභාංශ 6.0% | - | - | 13,519,536 | 13,519,536 | (13,519,536) | - | - | - | - | - |
| වර්ෂය සඳහා සමුච්චිත ලාභය | - | - | - | - | 20,410,933 | - | - | - | - | 20,410,933 |
| විකිණිම පිණිස ඇති සංචිතය | - | - | - | - | - | (173,479) | - | - | - | (173,479) |
| විකිණිම පිණිස ඇති සංචිතය (කොටස්) | - | - | - | - | - | (3,846) | - | - | - | (3,846) |
| පරිපාලිතයන්ගි අයෝජන වල සාධාරන වටිනාකම පෙරපරදි තත්වයට ගෙනඒම | - | - | - | - | - | (790,551) | - | - | - | (790,551) |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | - | - | - | - | - | - | - | 200,000 | 200,000 |
| ආයුගණන ලාභය / (අලාභය) | - | - | - | - | - | - | 500 | - | - | 500 |
| ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ මාරුකිරීම් | - | - | - | - | - | - | - | - | (200,000) | (200,000) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,840,190** | **6,759,768** | **13,519,536** | **245,604,905** | **3,449,498** | **(800,805)** | **(29,295)** | **142,000** | **-** | **248,366,304** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | | සමූහය | | සමාගම/ මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | | | |
| ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් විකුණුම් ලදමනාව | 1 | 264,734 | 2,953,322 | 264,734 | 2,953,322 |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය උපකරණ පරිනතවීම් | 2 | 226,866,952 | 243,132,309 | 226,866,952 | 243,132,309 |
| මූල්‍ය උපකරණ පරිනත වීම් - ණය සහ ලැබිය යුතු ගිණුම් | 3 | 128,216 | 6,263,837 | 128,216 | 6,263,837 |
| ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මිලදී ගැනීම් | 4 | (2,105,430) | (5,006,253) | (2,105,430) | (5,006,253) |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය උපකරණ මිලදී ගැනීම් | 5 | (250,088,421) | (271,650,535) | (250,088,421) | (271,650,535) |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකරණ අත්පත් කරගැනීම සඳහා ණය ප්‍රදානය | 6 | (215,730) | (148,464) | (215,730) | (148,464) |
| පාරිභෝගිකයන්ගෙන් ලද ප්‍රේෂණ | | 2,137,602 | 1,011,685 | - | - |
| සැපයුම්කරුවන්ට කල ගෙවීම් | | (1,160,490) | (783,195) | - | - |
| පොළී ලැබීම් | 7 | 19,493,760 | 16,872,388 | 19,493,760 | 16,872,388 |
| ලාභාංශ ලැබීම් | 8 | 329,938 | 524,271 | 329,938 | 524,271 |
| අනෙකුත් අදායම් ලැබීම් | 9 | 306,894 | 281,709 | 306,894 | 281,709 |
| ගෙවන ලද මෙහෙයුම් වියදම් | 10 | (1,047,671) | (1,010,390) | (1,047,671) | (1,010,390) |
| ගෙවන ලද සාමාජික වියදම් | 12 | (315,819) | (228,298) | (315,819) | (228,298) |
| ගෙවන ලද ආදායම් බදු | 13 | (713) | (11,395) | (713) | (11,395) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගෙවීම් | | (181,210) | (158,976) | (176,512) | (149,122) |
| ප්‍රාදේශිය ලේකම් වෙත ගෙවූ බිම් කුළි | | (23,142) | (11,962) | | |
| ගෙවන ලද පොළී | | (25,095) | (4,472) | | |
| 5 වසර ශිෂ්‍යත්ව ගෙවීම් /ආපසු ලැබීම් | | (178,314) | (8,368) | (178,314) | (8,368) |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම් | | (41,908) | (19,704) | (41,908) | (19,704) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(5,855,848)** | **(8,002,490)** | **(6,780,024)** | **(8,204,693)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (271,465) | (28,515) | (24,990) | (8,633) |
| දේපළ, පිරියත හා උපකරණ විකුණුම් ලදමනාව | | 470 | 17,164 | 73 | 12,462 |
| ආයෝජන මිලට ගැනීම | | (585,903) | (12,494) | - | - |
| පොළි ලැබීම් | | 40,087 | 7,149 | - | - |
| ශුද්ධ (ගෙවීම්)/ කාර්ය මණ්ඩල ණය මුදල් ආපසු ගෙවීම් | | 13,882 | 17,691 | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(802,930)** | **995** | **(24,917)** | **3,829** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | | | | |
| දායක මුදල් ලැබීම් | | 20,053,869 | 17,902,928 | 20,053,869 | 17,902,928 |
| ප්‍රතිලාභ ගෙවීම් | | (13,473,997) | (11,493,449) | (13,473,997) | (11,493,449) |
| ගෙවන ලද මූල්‍ය වියදම් | 11 | (2,547) | (1,639) | (2,547) | (1,639) |
| ලාභාංශ ගෙවීම් | | (200,000) | (8,750) | - | - |
| පොළියට යටත් ණය ආපසු ගෙවීම් | | (24,038) | (35,843) | - | - |
| මුළ්‍ය කල්බදු වගකීමට අදාල මූලික මුදල් ගෙවිම | | (4,425) | (1,676) | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **6,348,862** | **6,361,570** | **6,577,325** | **6,407,840** |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම** | | **(309,916)** | **(1,639,925)** | **(227,616)** | **(1,793,024)** |
| 2016 ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමානයන් | | 855,620 | 2,495,545 | 841,949 | 2,634,973 |
| **2016 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමානයන්** | | 545,704 | 855,620 | 614,332 | 841,949 |



## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

## 1 සාංගමික තොරතුරු

### 1.1 නිත්‍ය පදිංචි හා නෛතික ආකෘතිය

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජය සතු ව්‍යවසායකි. කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලදුව, 1997 දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට අනුයුක්ත කරන ලද අතර 2015 ඔක්තෝම්බර් මස සිට එය ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ලංකා සෝල්ට් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා ලුණු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරනු ලැබ නිත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. මෙම සමාගමේ ලියා පදිංචි කරන ලද කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයෙහි පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ සිටිමින් මෙහෙයවන ලද සමාගමට හා එහි අනුබද්ධිත සමාගම්වලට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වූයේ ය.

| සමාගමේ නම | ව්‍යාපාරයේ ස්වභාවය |
|---|---|
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් හා පෞද්ගලික අංශට අයත් සියලුම සේවා නියුක්තයන් මෙම අරමුදලෙහි සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි ඔවුන්ගේ සේවා යෝජකයින් එකී සේවක සේවිකාවන්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. මෙම අරමුදලට විගමනික ශ්‍රමිකයන් සහ ස්වයං රැකියා ක්ෂේත්‍රවල නියුතු සේවක සේවිකාවන් ද අන්තර්ගත වේ. මෙම අංශය තවදුරටත් ඉදිරියේදී වඩාත් ප්‍රසාරණය වීමට නියමිතය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මෙම අරමුදල කළමනාකරණය කිරීමට අමතර වශයෙන් ස්වකීය සේවා නියුක්තයන්ගේ සේවා කාලය තුළ ඔවුන් වෙත සමාජීය හා සුභසාධන ප්‍රතිලාභ ගණනාවක් සලසා දීමේ කාර්යයෙහි ද නිරතව සිටී. |
| ලංකා ලුණු සමාගම | මෙම සමාගමෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ ලුණු නිෂ්පාදනය කර බෙදා හැරීමයි. |

### 1.3 මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම සතු අත්‍යන්ත මව් ව්‍යවසායක් නොමැත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මව් ව්‍යවසාය ලෙස කටයුතු කරයි.

### 1.4 නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ 2016 අගෝස්තු මස 10 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව නිකුත් කරනු ලැබීම සඳහා බලය පවරන ලදී.

## 2 වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සම්පිණ්ඩනය

### 2.1 පොදු ප්‍රතිපත්ති

#### 2.1.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපාර ආයතනය සතු වත්කම් හා බැරකම්

ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපිත වන අයුරින් ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන උද්ධමනීය සාධකයන් සඳහා ගැළපුම් කිසිවක් සිදුකර නොමැත. රපෝර්තු දිනයේ සිට මාස 12 ක් ඇතුළත සහ මාස 12 කට වැඩි කාලයකින් පසුව ආපසු අයකර ගනු ලැබීම් හෝ බේරුම් කරනු ලැබීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ තිබේ.

### 2.1.2 අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

2016 දෙසැම්බර් මස 31 වන දින වන විට හා එදිනට අවසන් වර්ෂය සඳහා වන සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාව දක්වන අයුරිනි. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා අනුකූල වන පරිදි පිළියෙළ කරනු ලැබ තිබේ.

### 2.1.3 වැදගත් ගිණුම් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

'

මණ්ඩලය ස්වකීය අනාගතය සම්බන්ධයෙන් ඇතැම් ඇස්තමේන්තු වලට හා උපකල්පන වලට එළැඹේ. එකී ඇස්තමේන්තු හා විනිශ්චයන් ඓතිහාසික පරිචය හා අනාගත අපේක්ෂා ද ඇතුලත් වෙනත් සාධකයන් මත අඛණ්ඩව ඇගයුමට ලක් කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමානයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූලතාව දැක්වෙන පරිදි සැකසීම සඳහා ඇතැම් සුවිශේෂී ගිණුම් ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ නිශ්චයමතියක් හෝ සංකීර්ණතාවයක් සම්බන්ධ වන්නා වු ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි උපකල්පනයන් හා ඇස්ත්මේන්තු වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇත.

**තීන්දු**

**විලම්බිත බදු වත්කම්:**

සියළු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ එල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණයෙහි මූලොපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

### 2.1.4 මානනය කිරීමේ පදනම

ඇතැම් වත්කම් හා බැරකම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික සම්මුතිය යටතේ සාධාරණ අගය මත පිළියෙළ කරනු ලැබ ඇත.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙළකරනු ලැබ තිබේ.

### 2.1.5 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල් ඒකකය

සමාගමේ ක්‍රියාකාරී ව්‍යාවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලැබ ඇත. සියලු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ.

### 2.1.6 ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු ආනගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්යෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තක්සෙරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකර ගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහිමට පත්ව සිටී. තවද, ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යා හැකි මණ්ඩලයේ හැකියාව සම්බන්ධයෙන් වැදගත් සැක සංකා මතු කෙරන යම් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතීදැයි කළමනාරණය දැනුවත් නොමැත. එහෙයින්, සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම නොකඩවා සිදු කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සමාගම ක්‍රියාත්මක ව්‍යාපාර තත්වයෙන් පවත්වාගෙන යාමේ ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සමාගම සතු ව්‍යාපාරය ඈවර කිරීමට හෝ එහි වෙළඳ කටයුතු නවතා දැමීමට හෝ ඔවුහු අපේක්ෂා නොකරති.

### 2.1.7 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම් ප්‍රතිපත්ති සුසංගත අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සමඟ ද සාරානුකූල වේ.

## 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

#### (අ) ඒකාබද්ධ කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ, 2016 දෙසැම්බර් මස 31 වන දිනට අයත් සමාගමේ සහ එහි පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අන්තර්ගත වේ.

පාලිත සමාගම, එය සමාගමට අත්කර ගත් දිනයේ සිට එනම්, සමූහය එහි පාලනය ලබාගත් දිනයේ සිට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එකී පාලනය නතර කෙරෙන දිනය දක්වා එසේ ඒකාබද්ධව පැවතීම අඛණ්ඩව සිදුවනු ඇත. පාලිත සමාගමට අයත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබනුයේ ද එහි මව් සමාගමට අදාළ සමාන රපෝර්තු කාල පරිච්ඡේදයට අනුව ය.

එසේ වුවද, මෙම ආයතන දෙකෙහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන අතර ඒවා සමූහයට අයත් ගිණුම් ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දක්වා ඇත.

#### (ආ) පාලිත සමාගම්

පාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරීත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශ සෘජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමාගම සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්ත්‍ය සේ සැලකෙන ඡන්දය දීමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදී සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම අත් හැරේ. ඒකාබද්ධ කිරීමේදී සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් වර්ෂය වෙනුවෙන් ඇතුළත් කරන ලද මුළු ලාභ හෝ අලාභ ප්‍රමාණ සහ ඒකාබද්ධ කිරීමේදී අන්තර්ගත කළ සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් මුළු වත්කම් හා බැරකම් ප්‍රමාණ, ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබද ප්‍රකාශයෙහි පිළිවෙළින් දක්වා ඇත.

#### (ඇ) රපෝර්තු දිනය

පාලිත සමාගම් හී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබන්නේ පොදු වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය වන දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නා වූ දොළොස් මසක කාල සීමාවක් සඳහාය.

## 2.3 ලාභය සහ අලාභය මානනය කිරීමේ පදනම

### 2.3.1 ආදායම

ආදායම හඳුනා ගැනෙනුයේ එමගින් ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි අනුමාන කෙරෙන හා එම ආදායම විශ්වාසදායක ලෙෂ මානනය කළ හැකිතාක් දුරකටය. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනිමේ නිර්ණායක ද සපුරා ලිය යුතු වන්නේ ය.

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙනුයේ, භාණ්ඩ විකිණීම සඳහා පිටත් කර යවනු ලැබ ඒහි අයිතිය පවරා දෙනු ලැබ ඇති කල්හී ය. වට්ටම් සහ අලෙවි කටයුතු ආශ්‍රිතව රජය වෙනුවෙන් රැස් කරනු ලබන බදු මුදල් රහිත වූ ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදයම මානනය කෙරේ. ආදායම හඳුනා ගැනිමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේ ය.

**(අ) භාණ්ඩ විකිණීම**

සාමාන්‍යයෙන් විකිණීම සඳහා භාණ්ඩ පිටත් කරනු ලැබීම මත භාණ්ඩවලට ආවේනික සුවිශේෂී අවදානම් සහ භාණ්ඩවල හිමිකාරීත්වය සතු ප්‍රතිලාභ ඒවා මිලදී ගනු ලබන්නා වෙත පවරා දෙනු ලැබ ඇති කල්හි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

**(ආ) සේවා ඉටු කිරීම**

එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත කරන ලද මුළු මිනිස් ශ්‍රම පැය ගණනේ ප්‍රතිශතයක් ලෙස වත්මන් දිනය දක්වා වැය කළ මුළු මිනිස් ශ්‍රම පැය ගණන සැලකිල්ලට ගනිමින් නිශ්චය කරන ලබන අදාළ කාර්යයන් නිමකළ අදියරට සැදිහුම් දක්වමින් සේවා ඉටු කිරීම මඟින් ලබා ගන්නා ආදායම හඳුනා ගැනේ. අදාළ කොන්ත්‍රාත් කාර්යයෙහි ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස මිණිය නොහැකි විට ආපසු අයකර ගත හැකි දරන ලද වියදමේ ප්‍රමාණය දක්වා වූ දුරකට පමණක් ආදයම හඳුනා ගැනේ.

**(ඇ) පොළී**

වත්කම් මත සඵල පොලී අනුපාතය ගණනය කිරීමේ කාල අනුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

**(ඈ) වෙනත්**

වෙනත් ආදායම් හඳුනා ගැනෙනුයේ උපචිත වන්නා වූ පදනමක් මතය.

## 2.3.2 පොලී සහ සමාන ආදායම් සහ වියදම්

සියළුම මුල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. පොලිය දරණ මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ගිණුම් හරහා විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගය අනුව වර්ගීකරණය කරනු ලබන අතර පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාත භාවිතයට ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් වල ඇස්තමේන්තු කළ ආදළ පරිදි වන්නාවූ අපේක්ෂිත ආයු කාලයක් හෝ ඊට අඩු කාලයක් තුළ මුල්‍ය වත්කමෙහි හෝ මුදල් බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකම වේ. එම ගණනය මගින් මුල්‍ය මෙවලමෙහි දැක්වෙන සියලුම ගිවිසුම්ගත කොන්දේසි (නිදසුනක් වශයෙන් පෙර ගෙවුම් විකල්ප) සලකා බලනු ලබන අතර අදාළ මූල්‍ය මෙවලමට සෘජුවම ආරෝපනය කළ හැකි සඵල පොලී අනුපාතයේ ද මුඛ්‍යාංගයක් වන එහෙත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය එකී ගණනයෙහිලා අන්තර්ගත වේ. පොලී ආදායම තුළ කූපන් ආදායම සහ වට්ටම් ක්‍රමක්ෂය කිරීම හෝ මෙවලම් අධි මිල කිරීම මත ලැබූ යම් ලාභ හෝ අලාභ සමන්විත වේ. දුබලතා අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ වත්කම් සමූහයක වාර්තා කරන ලද වටිනාකම අඩු කරනු ලැබ ඇති කල්හි දුබලතා අලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා ඉදිරි මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස යොදා ගැණුනු මුල් පොලී අනුපාතය භාවිතයට ගනිමින් පොලී ආදායම හඳුනා ගැනීම නොකඩවා සිදු කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොලී වියදම හඳුනා ගැනේ. ඉන් කියැවෙනුයේ, "අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍ය වරයා සහ මුදල් විෂය භාර අමාත්‍ය වරයාගේ එකගත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය" යනුවෙනි.

## 2.3.3 ලාභාංශ ආදායම් හා වියදම්

ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනිමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුවය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.



## 2.3.4 වෙනත් ආදායම්

සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොලී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනිමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

## 2.4 බදුකරණය

### 2.4.1 ප්‍රවර්තන බදු

රපෝර්තු දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.

ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනිමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂ්‍ය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබිමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයූ ආදායමට අදාළ රඳවා ගැනිමේ බද්දෙහි ප්‍රමාණය හඳුනා ගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පසුගිය කාල පරිච්ඡේදයක් සඳහා ජාතික බද්ද වෙනින් බදු බැර කිසිවක් වෙනුවෙන් හිමිකම් ඉල්ලා නොමැත. එහෙයින් ඒ සඳහා ලැබිය යුතු බදු ප්‍රමාණයක් පවතින අතර එය වත්කමක් ලෙස හඳුනාගත යුතුව තිබිණි. එසේ වුවද ලැබිය යුතු බදු කිසිවක් හඳුනා ගනු ලැබ නොමැති හෙයින් උද්ගත වන ගිණුම්කරණ වරදක් සිදුව ඇත. ප්‍රවර්තන මුදල් වර්ෂය තුළ එකී දෝෂය නිවැරදි කරනු පිණිස වඩාත්ම කලින් එළැඹෙන රපෝර්තු දිනයට (2015 ජනවාරි මස 01 වන දින) පැවති රඳවාගත් ඉපැයුම්, රුපියල් මිලියන 128 කින් ගළපනු ලැබ තිබේ. එමෙන්ම, අදාළ වර්ෂවලදී හිමිකම් කිව හැකි බදු බැර මුදල හා සමාන මුදල් ප්‍රමාණයකින් අදාළ බදු වත්කම් අවරකණය කරනු ලැබ තිබේ.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශිය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

### 2.4.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කල පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනිමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම රපෝර්තු දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලහය (බදු ආලහය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නා වු විලම්බිත බදු බැරකම් අනුව, රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

## 2.5 විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිලිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකකය මත මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියළු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පර්වර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පර්වර්තනය කෙරේ.

## 2.6 ඉකුත් වර්ෂයේ ලාභයට ගැළපීම

දෝෂ නිවැරදි කිරීම් අතීතයට බලපාන පරිදි ගළපනු ලබනුයේ, මූල්‍ය ප්‍රකාශවල සංසන්දනාත්මක භාවය ඉන් වර්ධනය වන නිසාය. ඒ අනුව, රඳවාගත් ඉපැයුම්වල ආරම්භක ශේෂය එකී දෝෂවල විශෝධනයෙන් පසුව ප්‍රතිප්‍රකාශ කරනු ලැබේ. 2016 වසර තුළ පහත දැක්වෙන ඉකුත් වසරට අයත් දෝෂ අනාවරණය කරගන්නා ලදි.

(අ) අධිකරණය වෙත ඉදිරිපත් කෙරෙන බැංකු ඇපකරයක් ලෙස සමාගම විසින් තැන්පත් කරනු ලැබ ඇති රුපියල් 21,900,000 මුදල ඉකුත් වර්ෂයේදී සිදුවූ වියදමක් ලෙස හඳුනා ගනු ලබන අතර ඒ අනුව, එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගනු වෙනුවට රඳවා ගත් ඉපැයුම්වලින් අවකරණය කරනු ලැබේ.

(ආ) රුපියල් 74,995,085.96 ක මුදලක් බැඳුම්කර තක්සේරුවෙන් කෙරෙන දෝෂ විශෝධනයක් ලෙස ඉකුත් වසරින් ගළපනු ලැබේ.

(ඇ) ආයෝජන දේපළ නමැති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 35 වන ඡේදය වන "ආයෝජන දේපළක සාධාරණ අගය තුළින් උද්ගතවන ලාභයක් හෝ අලාභයක් එය උද්ගතවන කාල පරිච්ඡේදය සඳහා වන ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගනු ලබනු ඇත." යන ප්‍රකාශය හා බැඳේ.
ඒ අනුව, 2016 වසරේදි රු. 200,000,000 ක් වූ ප්‍රත්‍යාගණන ලාභය සහ රුපියල් 3,155,730,000 ක් වූ කලින් හඳුනා ගත් ප්‍රත්‍යාගණන ලාභය කොටස් හිමිකම් වලින් (විකුණුම් සඳහා පවත්නා සංචිත වලින්) ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

(ඈ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ලඩය ඉකුත් කාල පරිච්ඡේද කිසිවක් සඳහා ජාතික බද්ද වෙතින් බදු බැර සඳහා වන හිමිකම් ඉල්ලා නොමැත. එහෙයින්, ඒ සඳහා ලැබිය යුතු වන්නා වූ බදු ප්‍රමාණයක් පවතින අතර එය වත්කමක් ලෙස හඳුනාගත යුතුව තිබිණි . එසේ වුවද, ලැබිය යුතු බදු කිසිවක් හඳුනා ගනු ලැබ නොමැති හෙයින් උද්ගතවන ගිණුම්කරණ වරදක් සිදුව ඇත.

ප්‍රවර්තන මුදල් වර්ෂය තුළ එකී දෝෂය නිවැරදි කරනු පිණිස වඩාත් ම කලින් එළැඹෙන රපෝර්තු දිනයට (2015 ජනවාරි මස 01 වන දිනට) පැවති රඳවා ගත් ඉපැයුම් රුපියල් මිලියන 128 කින් ගළපනු ලැබ තිබේ. එමෙන්ම, අදාළ වර්ෂවලදී හිමිකම් කිව හැකි බදු බැර වශයෙන් රුපියල් 30,072,932.91 ක් සහ රුපියල් 30,376,202.80 ක් වූ සමාන මුදල් ප්‍රමාණවලින් අදාළ බදු වත්කම් අවකරණය කරනු ලැබ තිබේ.

## 2.7 මූල්‍ය මෙවලම්

### 2.7.1 මූල්‍ය මෙවලම් හි ප්‍රාරම්භක මිනුම්කරණය

ප්‍රාරම්භක හඳුනාගැනීමේදි මූල්‍ය මෙවලම්හි වර්ගීකරණය රඳා පවතිනුයේ එහි අරමුණ හා එහි අඩංගු ලක්ෂණ මෙන්ම ඒවා අත්කර ගැනිමේදී කළමනාකරණය තුළ ඊට තිබූ අභිලාෂය ද මතය. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව වාර්තා කරනු ලැබූ මූල්‍ය වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට සියලු මූල්‍ය මෙවලම්, ඒවායේ සාධාරණ අගයට එකතු කළ ගනුදෙනු පිරිවැය අනුව මානනය කරනු ලැබේ.

### 2.7.2 හඳුනාගනු ලබන දිනය

සියලුම මූල්‍ය වත්කම් හා බැරකම්, ඒවායේ වෙළෙඳ දිනයේදී, එනම්, එකී මූල්‍ය මෙවලමෙහි කොන්ත්‍රාත්තුමය විධිවිධාන වලට මණ්ඩලය පාර්ශවකරුවෙකු වන දිනයේදී, මූලික වශයෙන් හඳුනා ගනු ලැබේ. මීට නිත්‍ය වෙළෙඳ ක්‍රමය හෙවත් වෙළඳපොල තුළ පවත්නා නියාමනය හෝ සම්මුතිය මගින් සමාන්‍ය පරිදි ස්ථාපනය කෙරුණු කාල රාමු තුළ වත්කම් පිටත්කර භාරදීම අවශ්‍ය වන්නා වූ මූල්‍ය වත්කම් මිලදී ගැනුම් හා විකුණුම් අන්තර්ගත වේ.

### 2.7.3 ලාභය හෝ අලාභය මගින්වූ සාධාරණ අගය

මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වනුයේ, ඒවායේ මූලික හඳුනා ගැනීමෙන් පසුව කළමනාකරණය විසින් නම් කරනු ලැබ ඇති ඒවායි. පහත දැක්වෙන නිර්ණායකයන් සපුරාලීමෙන් පසුව හා මෙවලමෙන් මෙවලමට වූ පදනමක් මත එසේ නම් කිරීම නිශ්චය කළ කල්හී කළමනාකරණය විසින් ඒවායේ ප්‍රාරම්භක හඳුනා ගැනිමෙන් අනතුරුව ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගය මත පමණක් යම් මෙවලමක් නම් කරනු ලැබිය හැකි වන්නේ ය.

(අ) වත්කම් හෝ බැරකම් ගණනය කිරීමෙන් හෝ එකිනෙකට වෙනස් පදනමක් මත ඒවායේ ලාභය හෝ ආලභය මත හඳුනා ගනු ලැබිම මගින් හෝ වෙනත් අයුරකින් උද්ගත විය හැකි අනුකූල ප්‍රතිකර්ම මෙම නම් කිරීම තුළින් සපුරා ඉවත් කරයි. එසේ නැතහොත් සැලකිය යුතු අයුරින් අඩු කරයි.

(ආ) මෙම වත්කම් හා බැරකම් ලේඛණගත ආදායම් කළමනාකරණය හෝ ආයෝජන උපාය මාර්ගය ප්‍රකාරව සාධාරණ අගයට අනුව කළමනාකරණය කරනු ලැබ ඒවායේ කාර්ය සාධනය අගය කරනු ලබන මුල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් සමූහයක හෝ ඒ දෙවර්ගයේ ම කොටසකි.

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අනුව ගණනය කරනු ලබන මුල්‍ය වත්කම් හා බැරකම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට අනුව සටහන් කෙරේ. සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් සටහන් කරනු ලබනුයේ, "ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට නම් කරනු ලබන මූල්‍ය වත්කම්වල සහ බැරකම්වල ශුද්ධ ලාභය හෝ අලාභය" තුළය. ඉපැයූ හෝ දැරූ පොලිය, සඵල පොලී අනුපාතය යොදා ගනිමින් පිළිවෙලින් " පොලී ආදායම" හෝ පොලී වියදම තුළ උපචිත කරන ලබන අතර ලාභාංශ ආදායම සටහන් කෙරෙනුයේ, අදාළ ලාභාංශ ගෙවීම ලබා ගැනිම සඳහා වන අයිතිවාසිකම තහවුරු කර ගැනිමෙන් අනතුරුව අදායම් ප්‍රකාශය තුළ "ලාභාංශ අදායම" යටතේ ය.

අලෙවිය සඳහා නොතැබෙන හිමිකම් කොටස් ආයෝජනවල වටිනාකම, ඒවායේ සැලකිය යුතු හෝ කල්ගත වන්නා වූ වටිනාකම හඳුනා ගනු පිණිස කාලානුරූපිව සමාලෝචනයට භාජනය කෙරේ. මෙම කරුණ සඳහා, වෙළඳපොළ වටිනාකම පිරිහීමට ලක් නොවන එහෙත්, මූලොපායික අභිලාෂය සහ නෛසර්ගික වටිනාකම වැනි ගුණාත්මක සාධකවලට සීමා නොවන අදාළ වත්කම් හානිකරණය පිළිබඳ විෂ්‍ය නිශ්‍රිත සාක්ෂි කළමනාකරණය විසින් සලකා බලනු ලබන්නේ ය. ඒ අනුව, සැලකිය යුතු හෝ කල්ගත වන්නා වූ යම් පිරිහීමක් වටිනාකම තුළ සිදුවන කල්හි හා මෙම තත්වය ප්‍රත්‍යාවර්තනය පිණිස යුක්ති සහගත හැකියාවක් නොමැති විට ඇතැම් හිමිකම් ආගෙය්ජනවලට අදාළව (රුපියල් 282,738 ක් වශයෙන් ගණනය වන) දුබලතා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ තිබේ. එබඳු ප්‍රතිපාදන ලාභය හෝ අලාභය හරහා හඳුනා ගනු ලැබිය යුතු වන්නේ ය.

### 2.7.4 අලෙවිය සඳහා පවත්වා ගනු ලැබීම

අලෙවිය සඳහා පවත්වා ගනු ලබන මූල්‍ය වත්කම් හෝ බැරකම් සාධාරණ අගයට අනුව මුල්‍ය තත්වය පිළිබඳ ප්‍රකශයෙහි සටහන් කරනු ලැබේ. සාධාරණ අගය තුළ සිදුවන වෙනස්කම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. පොලිය සහ ලාභාංශ අදායම හෝ වියදම ආදායම් ප්‍රකාශයෙහි සටහන් කෙරෙනුයේ, අදාල කොන්ත්‍රාතුවේ නියමයන් ප්‍රකාරව හෝ අදාල ගෙවීම් ලබා ගැනිම සඳහා වන අයිතිවාසිකම් තහවුරු කරගනු ලැබ ඇති විටදීය. නුදුරු කාල වකවානුවක් තුළ විකිණීම හෝ ආපසු මිලදී ගැනීම අරමුණු කර ගනිමින් ප්‍රධාන වශයෙන් අත්කර ගනු ලැබ ඇති කොටස් හිමිකම් මෙම වර්ගීකරණය තුළ අන්තර්ගත කර ඇත.

### 2.7.5 විකිණීම සඳහා ඇති ආයෝජන

විකිණීම සඳහා ඇති ආයෝජන තුළ අනිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා ගැනිමට අපේක්ෂිත සහ ද්‍රවශීලතා අවශ්‍යතාවනට ප්‍රතිචාරාත්මක වශයෙන් හෝ වෙළඳපොළ තත්වයන්ට ප්‍රතිචාරාත්මක වශයෙන් විකුණානු ලැබිය හැකි වන්නා වූ දිගු කාලීන කොටස් හිමිකම් ආයෝජන සහ ණය සුරැකුම් පත් සමන්විත වේ. විකිණීම සඳහා පවත්නා මූල්‍ය ආයෝජන ඒවායේ මූලික ගණනය කිරීමෙන් පසුව නැවතත් සාධාරණ අගය අනුව මානනය කෙරේ.

### 2.7.6 පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන

පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන වනුයේ, පරිණත වන තෙක් රඳවා තබා ගැනීමට සමාගම අදහස් කරන හා ඒ සඳහා සමාගමට හැකියාවක් ඇති ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල් පිරීම් සහිත මූල්‍ය වත්කම් ය. මූලික ගණනය කිරීමෙන් පසුව, පරිණතවීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන, ඒවායේ දුබලතා අලාභ ද අඩු කරනු ලැබ, සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව නැවතත් මානනය කෙරේ. සඵල පොලි අනුපාතයේ මුඛ්‍යාංගයක් වන අත්කර ගැනීම් සහ ගාස්තු මත වන්නා වූ යම් වට්ටම් හෝ අධි මිල සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ. ආදායම් ප්‍රකාශයෙහි "පොලී ආදායම" යටතේ ක්‍රමක්ෂය ඇතුළත් කෙරේ. එබදු ආයෝජන හානිකරණය හේතුවෙන් උද්ගත වන අලාභ ආදායම් ප්‍රකාශයට කෙරෙන සටහන් තුළ හඳුනා ගැනේ.

### 2.7.7 ණය සහ ලැබීම් නියමිත

ණය සහ ලැබිම් නියමිත වනුයේ, සක්‍රීය වෙළෙඳපළක් තුළ මිළ ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම්, ඒවායේ දුබලතා අලාභ අඩු කිරීමට යටත්ව සඵල පොළී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත නැවතත් මානනය කෙරේ. සඵල පොළී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන අත්කර ගැනීම් සහ ගාස්තු හෝ පිරිවැය මත වන්නා වු යම් වට්ටම් හෝ අධි මිල සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ. අදායම් ප්‍රකාශයෙහි පොළී ආදායම තුළ සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය කිරීම අන්තර්ගත වේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ, වෙනත් මෙහෙයුම් වියදම් යටතේ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. සාධාරණ අගයෙහි අලාභය සේවක පිරිවැයක් ලෙස සේවකයාගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කෙරේ.

### 2.7.8 ප්‍රති මිලදීගැණුම් සහ ප්‍රතිවර්ථන ප්‍රති මිලදි ගැනිම් හා බැඳි ගිවිසුම්

ප්‍රති මිලදි ගැනිම්හි කරනු ලබන ආයෝජනයන්හි ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහ ස්ථාවර කල් පිරිමක් ඇති අතර ඒවා කල් පිරෙන තෙක් රඳවා ගැනිමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් මණ්ඩලය සතුය. එබැවින් එය පරිණත ආයෝජනයක් දක්වා රඳවා ගැනිම පිණිස නිගමනය වේ. අදාළ ගණුදෙණු කිරීමේ පිරිවැයක් ඇත්නම් එය ද ඇතුළුව මෙය ආරම්භයේදී සාධාරණ අගය අනුව ගණනය කළ යුතු අතර පසු කාලීනව සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව මානනය කළ යුතු වන්නේ ය.

**මූලික මූල්‍ය මෙවලම්**

අලෙවිය සඳහා රඳවාගත් මුල්‍ය වත්කම්, කල් පිරෙන තෙක් රඳවාගත් මුල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනිමේ අවස්ථාවේදි සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

**ණය සහ ලැබීම් නියමිත**

ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටි කාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත ඇතුළත් වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුව ය.

ණය සහ ලැබිම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු කාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මුල්‍ය බැරකම්වල අර්ථ කථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මුල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය බැරකම් වශයෙනි.



ලාභය හෝ අලාභය හරහා ගණනය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදි මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධරණ අගයට අනුව ය.

පොලී දරණ ණය සහ ණය ගැනුම් ද, වෙනත් මුල්‍ය බැරකම් ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදි මානනය කරනු ලබන්නේ, අත්කර ගැනිම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩු කරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසු කාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නා වු යම් වට්ටම් හෝ අධි මිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල් ඉකුත් වන කල්හී ය. දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලැකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත් කරනු ලබන වෙනත් මුල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමණාවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරිමක් මුල් බැරකම නොපිලිගැනිමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනිමක් ලෙසත් සලකනු ලබන්නේ ය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## 2.8 දේපළ, පිරියත හා උපකරණ

ආරම්භක අවස්ථාවේදි දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට අනුව හඳුනා ගනු ලැබේ. ගැණුම් මිල සෘජුව ආරෝපනය කළ හැකි පිරිවැය සහ කොටස් ගලවා වෙන් කිරීමේ සහ ඉවත් කිරිමේ කටයුතු සඳහා වැලැක්විය නොහැකි ආකාරයේ අනාගතයේ දැරීමට සිදුවන ඇස්තමේන්තු ගත වර්තමාන පිරිවැය පිරිවැයෙහි අන්තර්ගත වේ. ඊට අනුරූප වන්නා වූ බැරකම් ප්‍රතිපාදන තුළ හඳුනා ගනු ලැබේ. මුල් අවස්ථාවේ තක්සේරු කර පැවති කාර්ය සාධන තත්වයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථාවත්ව පවත්වා ගැනිම සඳහා හෝ නඩත්තු කර ගෙන යාම සඳහා දේපළ, පිරියත හා උපකරණ මත සිදුවන අළුත්වැඩියාව සහ නඩත්තු කටයුතු වෙනුවෙන් දරන වියදම, එය දරන අවස්ථාවේදි කෙරෙන වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

නිශ්චල දේපළ (ආයෝජන දේපළ) සම්බන්ධයෙන් හැරනු විට ක්ෂය විම් සඳහා ප්‍රතිපාදනය ගණනය කෙරෙනුයේ හීනවන ශේෂ ක්‍රමය අනුව ය. සින්නක්කර ඉඩම් සම්බන්ධයෙන් ක්ෂය ප්‍රතිපාදනය කරනු නොලැබේ. අනෙකුත් සියළුම දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒවායේ අවශේෂ අගයක් වේ නම් එය අඩු කළ එහි ධාරණ අගය ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය මුළුල්ලේ කපා හැරිය හැකිවන අයුරින් ක්ෂවිම් ප්‍රතිපාදනය කරනු ලැබේ. මෙම වත්කම්වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය පහත දක්වා ඇත.

| | |
|---|---|
| පරිගණක උපකරණ | 20% |
| අනෙකුත් උපකරණ | 20% |
| ලී බඩු | 15% |
| මෝටර් වාහන | 25% |
| සවිකිරීම් වැද්දුම් | 33.33% |

ගොඩනැගිලිවල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය අවශේෂ හීනවන ශේෂ ක්‍රමය මත වාර්ෂිකව 6.67% ක් වූ ප්‍රතිශතයක් වශයෙන් හෙළිදරව් කළ යුතු වන්නේ ය.

වත්කම්හි ක්ෂයවිම ආරම්භ වනුයේ, එය භාවිතය සඳහා යොදා ගැනුණු මාසය තුළ සිට වන අතර එය ව්‍යපහරණය කළ මාසය තුළ සිට නොවේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යපහරණය මත හෝ ඒවායින් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හෝ හඳුනා ගැනිමක් සිදු නොකෙරේ. එසේ හඳුනා නොගැනීම නිසා උද්ගතවන යම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම් නොපිලිගැනෙන වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ අන්තර් ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත් ඒවා අඩු කරන ලද ඓතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂය වීම් සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩු කළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර පහත දැක්වෙන දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වීම් සඳහා එය යොදා ගැනේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම් | 2.5% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10% |
| උපකරණ | 10% |
| ලීබඩු සහ සවිකිරීම් | 10% |
| මොටර් වාහන | |
| - මහ මාර්ග වාහන | 10% |
| - ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | 20% |
| සංවර්ධන වැඩ | 20% |
| වැඩුනු වතු වගා - පොල් | 2% |

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණු පිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යාපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොගැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යාපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

## 2.9 ආයෝජන දේපළ

ආයෝජන දේපළ, ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදි පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනා ගැනිමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැන නගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනස ද සමග විස්තීර්ණ අදායම් ගිණුමෙහි හඳුනා ගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේ ය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතු ය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරි ගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළ ආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනිමේ ප්‍රතිඵලයක් ලෙස වෙනම ම වත්කමක් සේ වාර්තා වූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේ ය.

## 2.10 අස්පෘශ්‍ය වත්කම්

### 2.10.1 බාහිර වශයෙන් අත්කර ගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්කර ගත් අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනිමේ අවස්ථාවේදි පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනා ගැනිමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩු කළ පිරිවැයට අනුව ය. අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘශ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යාමාන වන කල්හි ඒවායේ දුබලතා එල්ලේ ද තක්සේරු කිරීමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී, නියත ප්‍රයෝජ්‍ය ආයු කලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරීමේ කාල සීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේ ය. නියත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරීත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යාපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිලිගැනෙන අවස්ථාවේදී, එය අදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.10.2 පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කර ගැනීමේ සහ වැඩි දියුණු කිරීමේ අවස්ථාවේදි දරනු ලබන මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.11 කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල් බදුකර දේපළ, "කල් බදුකර දේපළ" ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30 ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

### 2.11.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නා වූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදි, බදුකරය යටතේ ගෙවිය යුතු වන්නා වූ මුළු කුලී මුදල් ප්‍රමාණ බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

## 2.12 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමිව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදිමෙන් පසුව ය.

අභාවිත හා මන්දගාමිව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසා දිමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ වට්ටෝරු භාණ්ඩ විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේනතුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ඇස්තමේන්තුගත පිරිවැය අඩු කරන ලද එය විකුණනු ලබිය හැකි මිල ය.
පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ වට්ටෝරු භාණ්ඩ ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - | පළමුව පැමිණ පළමුව පිටවන පිරිවැය පදනම මත වූ ගැනුම් වියදම අනුව |
| නිමි භාණ්ඩ | - | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශිය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහා වූ වියදම අනුව |
| කෙරෙමින් පවත්නා වැඩ | - | ඝනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදි පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසිමේ වියදමින් 25% ක් වූ ප්‍රමාණයට අනුව |
| පරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස් | - | පළමුව පැමිණ පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව |

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ඇස්තමේන්තුගත පිරිවැය අඩු කරන ලද ඇස්මේන්තු ගත විකුණුම් මිල ය.

## 2.13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 2.13.1 සේවක ප්‍රතිලාභ

සමාගම සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, සමාගම විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනිමේදි තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

### 2.13.2 නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වන සේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

### 2.13.3 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවක ප්‍රතිලාභ  නැමති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 19 අනුව සියළුම සේවක සේවිකාවන් සඳහා ඔවුන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත ලබාගනු පිණිස ප්‍රතිපාදන සලසා දෙනු ලැබ ඇත.  එසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකුට එලෙස පාරිතෝෂිත මුදල් ගෙවීමේ වගකිම උද්ගත වන්නේ ය.  මෙම වගකීම් දැරීම බාහිර වශයෙන් මූල්‍යයනය කෙරෙන්නක් නොවේ. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොව පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලස්මකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් මත ආයතනයේ ශුද්ධ බැදියාව, ප්‍රවර්තන හා පූර්ව සේවා කාල පර්ච්ඡේදයන් සඳහා සේවක සේවිකාවන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු  කිරීම මගින් ගණනය කරනු ලබන අතර එම ප්‍රතිලාභය අදාළ වර්තමාන වටිනාකම තීරණය කිරිම සඳහා වට්ටම් කරනු ලැබේ. යම් හඳුනා නොගත් පූර්ව සේවා පිරිවැයක් වෙතොත් ඒවා අවකරණය කරනු ලැබේ.  ආයතනය සතු බැඳියාවන් හි නියමයන් සමඟ සන්නිකර්ෂනීය වන්නා වූ කල් පිරීමේ දිනයන් ඇත්තා වූ ද, අදාළ ප්‍රතිලාභ ගෙවනු ලැබීම අපේක්ෂිත එක හා සමාන ව්‍යාවහාර මුදල් ඒකක  අනුව නාමනය කරනු ලැබ ඇත්තා වු ද රපෝර්තු දිනට පවත්නා උසස් තත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලදාව වට්ටම් අනුපාතය වන්නේ ය.  අදාළ ගණනය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගනිමින් සුදුසුකම් ලත් ආයු ගණක විශේෂඥයෙකු ලවා වාර්ෂිකව ඉටු කරවා ගනු ලැබේ.

සැලසුමක අඩංගු ප්‍රතිලාභ වැඩි දියුණු වන කල්හි සේවක සේවිකාවන් විසින් ඉටු කරන ලද අතීත සේවයට අදාළ ඉහළ ප්‍රතිලාභවලට අයත් කොටස, එකී ප්‍රතිලාභ පවරා දෙනු ලබන තෙක් වූ සාමාන්‍ය කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් උද්ගතවන සියලු ජීව ගණක ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ ආයතනය විසින් හඳුනා ගනු ලැබේ.

සේවක සේවිකාවන්ගේ සේවා කාලය මත හා ඔවුන් විසින් දැනට ලබන මාසික වැටුප්හි ප්‍රතිශතය මත අදාළ ප්‍රතිලාභ පදනම්වී ඇති කල්හි තම සියලුම නිත්‍ය සේවක සේවිකාවන් ආවරණය කරමින් සැදුම් ලත් අරමුදල් නොසැපයූ දායකත්ව නොවන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සමාගම සතුව පවතී. අදාළ වගකීමෙහි වටිනාකම ගණනය කිරීමෙහිලා ඇස්තමේන්තුගත අනාගත වැටුප් වැඩිවීම්වල සරල කිරීම් ද, වත්මන් සේවක සේවිකාවන්ගේ අනාගත සේවා කාල ද, වත්මන් සේවක සේවිකාවන්ගේ සේවාස්ථ මර්ත්‍යතාව ද 28.19 වගන්තිය ප්‍රකාරව උපයෝගි කරගනු ලැබ තිබේ.  පාරිතෝෂිකයට අදාළ වගකීම සම්බන්ධයෙන් අරමුදල් සපයනු ලැබ නොමැති අතර එය ආයු ගණක වශයෙන් අගයනු ලැබ ද නොමැත.

## 2.14 සම කොටස් හිමිකම

### 2.14.1 සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩු කරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙුවෙන් උපචිත වන්නා වූ පොලි හා ලාභාංශ ද සමඟ සාමාජික අරමුදල සමන්විත වන්නේ ය.

### 2.14.2 ලාභාංශ

ලාභාංශ හඳුනා ගනු ලබනුයේ, ඒවා ලැබ ගැනිමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හි ය.

### 2.14.3 සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාගණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සම කිරීමේ සංචිත ගිණුමට මාරු කරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවා ගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩු කිරීමත් යන කරුණු ය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයට පත්වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විත වේ.

## 2.15 ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ ඇත. රපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නා වූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත  වන්නා වූ අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.  අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හි ද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.  අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මනිනු ලැබේ. කල්ගත වීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම් පොලි වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

## 2.16 වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත

බොහෝමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය.  ඊට අදාළ ලැබීම් නියමිත තුළ පොලී නොදැරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබීම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය.  එක් එක් රපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදි වෙළඳ හා වෙනත් ලැබීම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ.  එසේ පවතී නම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

## 2.17 වෙළඳ ගෙවීම් නියමිත

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නා වූ බැඳීම් වන අතර, ඒ සඳහා පොලී නොදැරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත රපෝර්තු දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගත වේ.

## 2.18 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඒක්ෂණ තැන්පතු ද, කෙටි කාලීන වූ අතිශය ද්‍රවශීල ආයෝජන ද වන්නේ ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩු කරන ලද අතැති මුදල ද, බැංකුවෙහි ඇති තැන්පතු ද අඩංගු වන්නේ ය. කෙටි කාලීන කල් පිරීමක් සහිත ආයෝජන එනම්, ඒවා අත්කර ගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන් ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙස ය.

## 2.19 ප්‍රදාන සහ සහනාධාර

ප්‍රදාන ලැබේය යනුවෙන් හා සියලුම සම්බන්ධිත කොන්දේසි අනුව කටයුතු කර ඇතැයි යනුවෙන් යුක්ති සහගත සහතිකයක් පවත්නා අවස්ථාවකදී ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය යම් වියදම් අයිතමයකට අදාළ වන කල්හි අදාළ ප්‍රදානය ක්‍රමවත් පදනමක් මත වන්දි ගෙවනු පිණිස අදහස් කරන පිරිවැය හා ගැළපීම සඳහා අවශ්‍ය වන්නා වූ කාල පරිච්ඡේදය මුළුල්ලේ පවන්නා ආදායමක් ලෙස හඳුනා ගනු ලබනවා ඇත. ප්‍රදානය යම් වත්කමකට අදාළ වන කල්හි එය විලම්බිත ආදයමක් ලෙස ස්ථාපනය කෙරේ. මුදල්මය නොවන ප්‍රදාන සමාගම විසින් ලබා ගන්නා අවස්ථාවකදී අදාළ වත්කම හා එම ප්‍රදානය නාමික මුදල් වටිනාකම් මත සටහන් කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි සමාන වාරික කොටස් මගින් අදාළ වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය වෙත එය මුදා හරිනු ඇත.

ලද ප්‍රධාන ප්‍රතිවර්තන ගිණුමකට බැර කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| අයඩීකරණ පිරියත සඳහා ප්‍රදානය | 10% |
| ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය | 2.5% |
| පොම්පාගාරය සඳහා ප්‍රදානය | 2.5% |
| සේවක වන්දි සඳහා වූ ප්‍රදානය - | ගෙවූ වන්දි මුදලින් අඩු කෙරේ. |

## 2.20 වත්කම් දුබලතාවයට පත්වීම

### 2.20.1 මූල්‍ය වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලතාවයට පත්ව ඇති බවට විෂය නිශ්‍රිත සාක්ෂි කිසිවක් තිබේදැයි සේවා නියුත්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සෑම රපෝර්තු දිනයකදී ම තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලතාවයට පත්ව ඇතැයි සලකනුයේ, අදාළ වත්කම මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුව ඇති (දරා ඇති අලාභ සිද්ධිය) එක් හෝ ඊට වැඩි සිදුවීම් ප්‍රමාණයක ප්‍රතිඵලයක් ලෙස හටගත් එහි දුබලතාව සම්බන්ධයෙන් විෂය නිශ්‍රිත සාක්ෂි කිසිවක් වේ නම් හෝ ඇත්නම් පමණක් සහ එම අලාභදායක සිද්ධිය (හෝ සිද්ධි) විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහය මත බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

කිසියම් මූල්‍ය වත්කමක් දුබලතාවට පත්ව තිබේදැයි යනුවෙන් වූ විෂය නිශ්‍රිත සාක්ෂි සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සෑම රපෝර්තු දිනයකදී ම තක්සේරු කර බලයි. මූල්‍ය වත්කමක් දුබලතාවයට පත්ව ඇතැයි සලකනුයේ, අදාළ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් පසුව සිදුව ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ගණනාකවක ප්‍රතිඵලයක් ලෙස අදාළ දුබලතාව සම්බන්ධයෙන් වූ විෂය නිශ්‍රිත සාක්ෂි ඇත්නම් හෝ ඇතිවී තිබුයේ නම් සහ එකී අලාභදායක සිද්ධිය අදාළ මූල්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහය මත බලපෑමක් සිදුව ඇතැයි විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකිනම් පමණි. දුබලතාවය පිළිබඳ සාක්ෂි තුළ ණය ගැතියන් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම, පොලිය ගෙවීම හෝ මුල් ගෙවීම් පැහැර හැරීම හෝ නොසලකා හැරීම, ඔවුන් වස්තු භංගත්වයට පත්වීමේ හැකියාව හෝ වෙනත් මූල්‍යමය ප්‍රතිසංවිධාන යන කරුණු ද, පැහැර හැරීම් හා සම්බන්ධ හිඟ මුදල් හි වෙනස්කම් හෝ ආර්ථික තත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුළ දිස්වන කිසියම් ප්‍රමාණාත්මක අඩුවීමක් දත්ත නිර්ක්ෂණය අනුව පෙනීයාම යන කරුණු ද අන්තර්ගත විය හැකිය.



### 2.20.2 මූල්‍ය නොවන වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වීමේ ලක්ෂණ පහළවී තිබේදැයි යනුවෙන් සැම රපෝර්තු දිනක ම මණ්ඩලය තක්සේරු කර බලයි. ඒ පිළිබඳව හඟවන යම් කරුණු වේ නම් හෝ කිසියම් වත්කමක් විෂයෙහි වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වේ නම් අදාළ වත්කමෙහි ආපසු අයකර ගතහැකි වටිනාකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. වත්කමක ආපසු අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගයෙහි හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම ආපසු අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලතාවයට පත්වූ ලෙස සලකා එහි ආපසු අයකර ගත හැකි වටිනාකම ලියා දක්වනු ලැබේ.

භාවිත වටිනාකම තක්සේරු කිරීමෙහිලා ඇස්තමේන්තු කළඅනාගත මුදල් ප්‍රවාහ, අදාළ මුදලෙහි කාලානුරූප වටිනාකමෙහි ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව හා අදාළ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුව පිළිඹිඹු වන බදු පූර්ව වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ ප්‍රවර්තන අගය අනුව වට්ටම් ගත කෙරේ. සාධාරණ අගයෙන් අඩු කළ විකුණුම් පිරිවැය නිශ්චය කිරීමෙහිලා ප්‍රශස්ත තක්සේරු කිරීමේ ආකෘතියක් යොදා ගනු ලැබේ. මෙම ආගනනයන්, තක්සේරුවල බහුවිධ ක්‍රම, ප්‍රසිද්ධ වෙළඳ සමාගම් වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දැක්වීමේ දර්ශක මගින් තහවුරු කෙරේ. වත්කම් සදහා පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද දුබලතා අලාභ තව දුරටත් නොපවතින්නේ ද නැතහොත් අඩුවී තිබේ ද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම රපෝර්තු දිනයකදී ම සිදු කරනු ලැබේ. එබඳු දැනවුමක් පවතී නම්, අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් දුබලතා අලාභය හඳුනා ගන්නා ලද අවස්ථාවේ වත්කමෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් හි වෙනසක් පවතින්නේ නම් පමණක් පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද දුබලතා අලාභය අවලංගු කෙරේ. වත්කම සඳහා පූර්ව වර්ෂ තුළ අදාළ දුබලතා ආලභ කිසිවක් හඳුනා ගෙන නොතිබියේ නම්, ක්ෂය වීම් අඩු කළ වත්කමෙහි ධාරණ වටිනාකම එහි ආපසු අයකර ගත හැකි මුදල ඉක්මවා නොයන අයුරින් හෝ නිශ්චය කරනු ලැබිය යුතුව තිබූ ඊට අදාළ ධාරණ අගය ඉක්මවා නොයන අයුරින් එකී අවලංගු කිරීම සීමා කරනු ලැබේ. එබඳු අවලංගු කිරීම් ආදයම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

## 2.21 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

### 2.21.1 මූල්‍ය වත්කම් සහ බැරකම් ප්‍රතිවර්ගීකරණය කිරීම

මේ යටතේ, "අලෙවිය සදහා තබාගත් " කාණ්ඩවලින් සහ "විකුණුම් සඳහා පවත්නා" කාණ්ඩ තුළට "මූල්‍ය සාධන පත්‍රඃ හඳුනාගැනීම සහ මිනුම්කරණය" යන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 39 මගින් අවසර දෙන ලද පරිදි වූ කාණ්ඩය නිරූපණය වන අයුරින් ආයතනය විසින් අදාළ ලැයිස්තුගත ඒකක ප්‍රතිවර්ගීකරණය කරන ලදි. පසුගිය වර්ෂ කිහිපය තුළ ආයතනය විසින් කෙටි ලාභ ලබා ගන්නා මෑත කාලීනව සිදුවූ තත්‍ය රටාවක් පිළිබඳව සාක්ෂි කිසිවක් නොවූ හෙයින් මේවා විකුණුම් සඳහා පවත්නා කාණ්ඩය යටතේ ප්‍රතිවර්ගීකරණයට හසු කෙරේ. එම ප්‍රතිවර්ගීකරණ අදාළ ප්‍රතිවර්ගීකරණ දිනයේ පැවති සාධාරණ අගය අනුව සටහන් කරනු ලැබේ.

### 2.21.2 ආයෝජනමය දේපළ තක්සේරු කිරීම

ස්වකීය ආයෝජනමය දේපළවල සාධාරණ අගය නිශ්චය කර ගැනීම පිණිස ආයතනය බාහිර තක්සේරු කරුවෙකු ලවා ඒවා හා සම්බන්ධ තක්සේරු කිරීම් ඉටු කරවා ගනියි. මෙම තක්සේරු කිරීම්, අනාගත කුලී ආදායම්, අපේක්ෂිත නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන වියදම් සහ ප්‍රශස්ත වට්ටම් අනුපාත ඇතුළු උපකල්පන මත පදනම්වී ඇත. මෙහිලා තක්සේරු කරුවා මේ හා සමාන දේපළවල ගණුදෙනු කිරීමේ මිල ගණන් ආශ්‍රිත වෙළඳ පොළ සාක්ෂි පිළිබඳව ද අවධානය යොමු කරයි.

### 2.21.3 මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය මෙවලම්හි සාධාරණ අගය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි. වට්ටම් අනුපාත සහ අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු ඇතුළුව යොදා ගනු ලැබ ඇති උපකල්පන මගින් එබඳු ශිල්ප ක්‍රම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කරයි. එම කාරණයෙහිලා, එලෙස ලබා ගන්නා සාධාරණ අගය පිළිබඳ ඇස්තමේන්තු ස්වාධීන වෙළඳපළ තත්වයන් සමඟ සංසන්දනය කිරීම මගින් සෑම විටම සනාථ කළ නොහෙන අතර බොහෝ අවස්ථාවලදී ඒවා වහා උපලබ්ධි කර ගැනීමේ හැකියාවක් ද නොමැති විය හැකිය.

### 2.21.4 දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රශස්ත ප්‍රයෝජ්‍ය ආයුකාල සහ අවශේෂ අගය

ආයතනය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරමින් ඉහත අයිතමවල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඒවායේ අවශේෂ වටිනාකම් වල ඇස්තමේන්තු ප්‍රශස්තව පවතින්නේදැයි වාර්ෂිකව පරීක්ෂා කර බලයි.

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**2016 දෙසැම්බර් මස 31 වන දිනට**

### ව්‍යාපාර සංකලන සහ පාලනමය නොවන සබැඳියා අත්කර ගැනිම

සේවා නියක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1997 වර්ෂයේදි සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් වලින් 90% ක්වූ ප්‍රමාණයක් අත්කර ගෙන ඇත. ඒ හා බැඳි කීර්ති නාමයෙහි වටිනාකම රුපියල් 378,926,440 ක් වශයෙන් ගණනය වන අතර, එලෙස එම කොටස් අත්කර ගත් දිනයේ සිට බලපැවැත්වෙන ගිණුම් පරිචයන් මත පදනම්ව අදාල අත්කර ගත් දිනයේ සිට ආරම්භ වන 05 අවුරුදු කාල සීමාවක් මුළුල්ලේ එකී කොටස් වටිනාකම ක්‍රමක්ෂය වන බව හඟනු ලැබ ඇත.

මෙම ව්‍යාපාර සංකලනය පිළිබඳ විස්තර පහත දක්වේ.

| | සමූහය | |
|---|---|---|
| | රු. | රු. |
| **පවරන ලද ප්‍රතිෂ්ඨාව** | | **470,960,938** |
| හඳුනාගත් ශුද්ධ වත්කම් වල පිළිගන්නා ලද වටිකාකමෙහි සමානුපාතික කොටස | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 31,500,000 | |
| සංචිත | 60,534,498 | |
| | | 92,034,498 |
| **කීර්ති නාමය** | | **378,926,440** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**මුල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **5** | **පොළී ආදායම** | | | | | |
| | විකිණීම සඳහා ඇති මුල්‍ය ආයෝජන | | | | | |
| | පරිනත වීම තෙක් රඳවාගත් මුල්‍ය ආයෝජන | 5.1 | 23,442,614 | 20,008,796 | 23,404,664 | 20,005,441 |
| | ණය සහ ලැබිය යුතු ගිණුම් මත මුල්‍ය ආයෝජනය | 5.2 | 87,686 | 268,763 | 87,686 | 268,763 |
| | | | **23,530,300** | **20,277,559** | **23,492,350** | **20,274,204** |
| **5.1** | **පරිනත වීම තෙක් රඳවාගත් මුල්‍ය ආයෝජන** | | | | | |
| | ස්ථාවර තැන්පත් පොළී | | 468,050 | 32,751 | 431,390 | 29,396 |
| | ණයකර පොළී | | 195,881 | 184,916 | 195,881 | 184,916 |
| | භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිලාභ | | 22,132,320 | 18,836,118 | 22,132,320 | 18,836,118 |
| | භාණ්ඩාගාර බිල්පත් ආන්තිකය | | 157,016 | 604,096 | 157,016 | 604,096 |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් පොළී | | 202,932 | 114,422 | 202,932 | 114,422 |
| | මුදල් වෙළඳපොළ තැන්පත් පොළී | | 1,476 | 1,320 | 1,476 | 1,320 |
| | ආයෝජන කළමනාකරණ ගිණුම් පොළී | | 1,459 | 7,145 | 170 | 7,145 |
| | විදුලි බල ව්‍යාපෘති බැඳුම්කර පොළී | | 283,479 | 228,028 | 283,479 | 228,028 |
| | | | **23,442,614** | **20,008,796** | **23,404,664** | **20,005,441** |
| **5.2** | **ණය සහ ලැබියයුතු ගිණුම් මත මුල්‍ය ආයෝජන** | | | | | |
| | රුපියල් ණය පොළී | | - | 169,832 | - | 169,832 |
| | වියන නිවාස ණය පොළී | | 68,443 | 81,243 | 68,443 | 81,243 |
| | ආපදා ණය පොළී (විශේෂ ණය) | | 560 | 570 | 560 | 570 |
| | වාහන ණය පොළී | | 6,061 | 5,713 | 6,061 | 5,713 |
| | විශේෂ ආපදා ණය පොළී | | 5,917 | 5,697 | 5,917 | 5,697 |
| | විශේෂ උත්සව අත්තිකාරම් පොළී | | 137 | 145 | 137 | 145 |
| | විශේෂ අත්තිකාරම් පොළි | | 416 | - | 416 | - |
| | පරිගණක ණය පොළී | | - | 2 | - | 2 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොළී | | 6,077 | 5,424 | 6,077 | 5,424 |
| | ක්‍රීඩා සමිති ණය පොළී | | 74 | 137 | 74 | 137 |
| | | | **87,686** | **268,763** | **87,686** | **268,763** |
| **6** | **ශුද්ධ වෙළඳ ආදායම** | | | | | |
| | ශුද්ධ ආදායම | 6.1 | 1,902,126 | 893,578 | - | - |
| | (-) විකුණුම් පිරිවැය | | (787,898) | (971,724) | - | - |
| | | | **1,114,228** | **(78,146)** | **-** | **-** |
| **6.1** | **ශුද්ධ ආදායම** | | | | | |
| | දළ ආදායම | | **2,182,064** | **1,010,620** | **-** | **-** |
| | (-) එකතුකල අගය මත බදු සහ ජාතිය ගොඩනැඟීමේ බද්ද | | (279,938) | (117,042) | - | - |
| | | | **1,902,126** | **893,578** | **-** | **-** |

| | | | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **7** | **ලාභාංශ ආදායම** | | | | | |
| | විකිණීම සඳහා රඳවාගත් ආයෝජන | 7.1 | 298,007 | 325,340 | 298,007 | 325,340 |
| | විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 7.2 | 188,188 | 35,243 | 188,188 | 35,243 |
| | | | 486,194 | 360,582 | 486,194 | 360,582 |
| **7.1** | **විකිණීම සඳහා රඳවාගත් ආයෝජන** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් මත ලාභාංශ | | 289,059 | 313,960 | 289,059 | 313,960 |
| | මිල ප්‍රකාශිත ඒකක මත ලාභාංශ | | 8,948 | 11,380 | 8,948 | 11,380 |
| | | | **298,007** | **325,340** | **298,007** | **325,340** |
| **7.2** | **විකිණීමට ඇති ආයෝජන** | | | | | |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් මත ලාභාංශ | | 188,188 | 35,243 | 188,188 | 35,243 |
| | | | **188,188** | **35,243** | **188,188** | **35,243** |
| **8** | **ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ)** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ | | 27,166 | 450,204 | 27,166 | 450,204 |
| | දිගුකාලීන කොටස් විකුණුම් ලාභ/ (අලාභ) | | 32,835 | - | 32,835 | - |
| | කොටස් සංචිතය මත උපලබ්ධිවූ ලාභ | | 15,395 | 475,070 | 15,395 | 475,070 |
| | ඒකක මත සාධාරණ වටිනාකම ගැලපීම | | - | (21,696) | - | (21,696) |
| | කොටස් මත සාධාරණ වටිනාකම ගැලපීම | | (6,804) | (69,727) | (6,804) | (69,727) |
| | | | **68,592** | **833,850** | **68,592** | **833,850** |
| **9** | **අනෙකුත් ආදායම්** | | | | | |
| | දේපළ ආදායම් - බදු කුලිය | | 3,255 | 15,093 | 3,255 | 15,093 |
| | ලද කුළී | | 386 | 481 | | |
| | දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | | 107 | 12,923 | 6 | 12,358 |
| | අධිභාර | | 235,477 | 232,543 | 235,477 | 232,543 |
| | කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් ආදායම | | 23,777 | 19,042 | 23,777 | 19,042 |
| | කාර්ය මණ්ඩල ණය ආදායම | | 31,409 | 32,843 | 29,271 | 29,049 |
| | විවිධ ආදායම් | | 4,015 | 3,710 | 1,237 | 1,597 |
| | පරිත්‍යාග - භාණ්ඩාගාර දීමනා | | 10,000 | - | 10,000 | - |
| | රථගාලේ ආදයම | | 31,443 | 13,395 | 31,443 | 13,395 |
| | නිවාඩු නිකේතන ලාභ/(අලාභ) | | (2,817) | (2,938) | (2,817) | (2,938) |
| | යලි නොගෙවන රැදවුම් තැන්පතු- සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම | | 241 | 169 | | |
| | ප්‍රදාන ක්‍රමක්ෂය | | 3,217 | 5,361 | | |
| | ආයෝජන දේපල ප්‍රත්‍යාගණන ලාභ | | 200,000 | - | 200,000 | - |
| | | | **540,511** | **332,623** | **531,650** | **320,139** |





| | | | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | සටහන් | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **10** | **සේවක මණ්ඩල වියදම්** | | | | | |
| | වැටුප් සහ වේතන | 10.1 | 588,117 | 611,446 | 548,210 | 574,681 |
| | කෙටි කාලීන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ | 10.2 | 354,109 | 327,838 | 330,278 | 318,523 |
| | නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් | 10.3 | 34,784 | 26,987 | 30,212 | 24,852 |
| | අනෙකුත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ | 10.4 | 82,402 | 81,940 | 77,263 | 76,333 |
| | | | **1,059,412** | **1,048,211** | **985,963** | **994,389** |
| **10.1** | **වැටුප් සහ වේතන** | | | | | |
| | වැටුප් | | 473,055 | 491,143 | 436,742 | 458,218 |
| | අධ්‍යක්ෂ ගාස්තු | | 2,260 | 1,343 | 850 | 593 |
| | ජීවන වියදම් දීමනා | | 84,741 | 85,761 | 84,741 | 85,761 |
| | අතිකාල | | 18,496 | 21,645 | 16,312 | 18,555 |
| | නිවාඩු දින ගෙවීම් | | 9,565 | 11,554 | 9,565 | 11,554 |
| | | | **588,117** | **611,446** | **548,210** | **574,681** |
| **10.2** | **කෙටිකාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ** | | | | | |
| | පුහුණු කිරීම් හා සංවර්ධන වියදම් | | 4,164 | 2,477 | 4,164 | 2,477 |
| | බඳවා ගැනිමේ වියදම් | | 528 | - | 528 | - |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | | 27,206 | 22,013 | 27,050 | 21,664 |
| | දිරි දීමනා | | 95,206 | 90,650 | 88,862 | 88,344 |
| | විදේශ පුහුණු | | 3,220 | 1,490 | 3,220 | 1,490 |
| | ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් | | 12,425 | 12,299 | 12,425 | 12,299 |
| | ප්‍රසාද දීමනා | | 100,072 | 89,902 | 83,778 | 84,253 |
| | වෛද්‍යාධාර වියදම් ප්‍රතිපූර්ණය | | 65,180 | 62,690 | 64,144 | 61,679 |
| | කාර්ය මණ්ඩල ණය පිරිවැය | | 29,271 | 29,049 | 29,271 | 29,049 |
| | නිවාස ණය පොළිය | | 16,783 | 17,267 | 16,783 | 17,267 |
| | සේවක අනතුරු වන්දි ගෙවීම් යෝජනා ක්‍රමය | | 53 | - | 53 | - |
| | | | **354,109** | **327,838** | **330,278** | **318,523** |
| **10.3** | **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්** | | | | | |
| | පොළී පිරිවැය | | 21,239 | 16,110 | 21,239 | 16,110 |
| | ප්‍රවර්තන සේවා පිරිවැය | | 13,545 | 10,877 | 8,973 | 8,742 |
| | | | **34,784** | **26,987** | **30,212** | **24,852** |
| **10.4** | **අනෙකුත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ** | | | | | |
| | සේ. අ. අ. මණ්ඩලීය දායකය | | 68,853 | 68,486 | 64,385 | 63,610 |
| | සේ. නි. භා. අ. මණ්ඩලීය දායකය | | 13,548 | 13,454 | 12,878 | 12,723 |
| | | | 82,402 | 81,940 | 77,263 | 76,333 |

| | | සටහන් | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| 11 | **පරිපාලන වියදම්** | | | | | |
| | ගොඩනැගිලි කුලී | | 57,131 | 59,857 | 48,140 | 49,739 |
| | වරිපනම් බදු | | 1,398 | 1,902 | 805 | 547 |
| | විදුලිය ගාස්තු | | 18,472 | 18,303 | 18,472 | 18,280 |
| | දුරකථන ගාස්තු | | 9,103 | 8,208 | 9,103 | 8,208 |
| | ජල ගාස්තු | | 1,460 | 1,567 | 1,460 | 1,567 |
| | උපදේශක ගාස්තු | | 1,861 | 2,002 | 763 | 828 |
| | විගණන ගාස්තු | | 1,164 | 1,428 | 603 | 900 |
| | ආරක්ෂක ගාස්තු | | 7,596 | 6,076 | 7,596 | 6,076 |
| | නීති ගාස්තු | | 1,222 | 797 | 1,222 | 797 |
| | කුලී වියදම් | | 7,482 | 751 | 5,872 | 259 |
| | ලේකම් ගාස්තු | | 120 | 150 | 120 | 150 |
| | තැපැල් හා විදුලි පණිවුඩ - පරිපාලන | | 2,209 | 1,982 | 2,209 | 1,982 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - පරිපාලන | | 635 | 759 | 635 | 759 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ - පරිපාලන | | 2,400 | 1,876 | 1,895 | 1,371 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය - පරිපාලන | | 351 | 273 | 272 | 14 |
| | තොරතුරු තාක්ෂණ වියදම් - පරිපාලන | | 1,206 | 1,257 | 1,206 | 1,257 |
| | පුවත්පත් දැන්වීම් සහ වෙළඳ දැන්වීම් | | 2,182 | 1,239 | 2,182 | 1,239 |
| | වාහන රක්ෂණ හා බලපත්‍ර ගාස්තු | | 2,459 | 2,482 | 2,459 | 2,482 |
| | පුවත්පත් හා වාර සඟරා | | 610 | 535 | 610 | 535 |
| | පරිත්‍යාග | | 859 | 416 | 50 | 416 |
| | විනය පරීක්ෂණ | | 316 | - | 316 | - |
| | අනෙකුත් රක්ෂණ | | - | 2 | - | 2 |
| | කාර්යාලීය නඩත්තු සහ අවශ්‍යතා | | 657 | 209 | 657 | 209 |
| | සේවක වන්දි | | - | 2,320 | - | 2,320 |
| | මුද්දර බදු | | 103 | 175 | 103 | 175 |
| | විවිධ වියදම් | | 9,630 | 2,705 | 3,623 | 2,705 |
| | වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | | 9,723 | 11,173 | 9,623 | 11,094 |
| | ඉන්ධන වියදම් | | 10,896 | 10,228 | 10,608 | 9,924 |
| | ගොඩනැගිලි නඩත්තුව | | 8,172 | 6,435 | 8,172 | 6,378 |
| | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තුව | | 2,098 | 2,414 | 2,044 | 2,397 |
| | | | **161,514** | **147,519** | **140,819** | **132,608** |
| 12 | **මූල්‍ය වියදම්** | | | | | |
| | ආයෝජන කළමනාකරණ ගාස්තු | | 352 | 333 | 352 | 333 |
| | බැංකු ගාස්තු | | 2,907 | 4,134 | 2,542 | 1,638 |
| | පොළී වියදම් | | 4,699 | 9,854 | - | - |
| | ලියා හරින ලද ප්‍රතිලාභ මුදාහැරීම් | | 9 | 16 | 9 | 16 |
| | | | **7,967** | **14,336** | **2,904** | **1,988** |





| | | සටහන් | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| 13 | **සාමාජික වියදම්** | | | | | |
| | සාමාජික ප්‍රතිලාභ | 13.1 | 393,349 | 373,882 | 393,349 | 373,882 |
| | සාමාජික සේවා | 13.2 | 45,261 | 40,651 | 45,261 | 40,651 |
| | තොරතුරු තාක්ෂණික සේවා | 13.3 | 15,856 | 15,076 | 15,856 | 15,076 |
| | | | **454,466** | **429,610** | **454,466** | **429,610** |
| 13.1 | **සාමාජික ප්‍රතිලාභ** | | | | | |
| | මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | | 97,518 | 92,209 | 97,518 | 92,209 |
| | නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය | | 8,598 | 6,093 | 8,598 | 6,093 |
| | අභ්‍යන්තර අක්ෂිකාච සවිකිරීමේ යෝජනා ක්‍රමය | | 4,293 | 4,909 | 4,293 | 4,909 |
| | ශ්‍රමසුව රැකවරණ යෝජනා ක්‍රමය | | 13,558 | 13,423 | 13,558 | 13,423 |
| | හෘද සැත්කම් යෝජනා ක්‍රමය | | 171,420 | 91,263 | 171,420 | 91,263 |
| | වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් යෝජනා ක්‍රමය | | 3,926 | 1,292 | 3,926 | 1,292 |
| | 5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | | 67,898 | 116,250 | 67,898 | 116,250 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | | 26,136 | 48,444 | 26,136 | 48,444 |
| | | | **393,349** | **373,882** | **393,349** | **373,882** |
| 13.2 | **සාමාජික සේවා** | | | | | |
| | තැපැල් හා විදුලි පණිවුඩ -සාමාජික | | 19,106 | 18,230 | 19,106 | 18,230 |
| | ලිපද්‍රව්‍ය හා මුද්‍රණ - සාමාජික | | 13,807 | 12,340 | 13,807 | 12,340 |
| | පරිගණක ලිපිද්‍රව්‍ය | | 3,782 | 3,071 | 3,782 | 3,071 |
| | ස්වයංරැකියා ප්‍රවර්ධන වියදම් | | 4 | 55 | 4 | 55 |
| | සාමාජික ආශ්‍රිත වියදම් | | 357 | 522 | 357 | 522 |
| | සේවකයින් දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමය | | 445 | 315 | 445 | 315 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - සාමාජික | | 4,830 | 4,975 | 4,830 | 4,975 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය - සාමාජික | | 755 | 235 | 755 | 235 |
| | සාමාජිකයින් සඳහා වෛද්‍ය උපදේශන ගාස්තු | | 42 | 40 | 42 | 40 |
| | ශිෂ්‍යත්ව පිරිනැමීමේ වියදම් | | 2,134 | 868 | 2,134 | 868 |
| | | | **45,261** | **40,651** | **45,261** | **40,651** |
| 13.3 | **තොරතුරු තාක්ෂණික සේවා** | | | | | |
| | දෘඩකාංග නඩත්තුව | | 4,292 | 4,355 | 4,292 | 4,355 |
| | මෘදුකාංග නඩත්තුව | | 526 | 660 | 526 | 660 |
| | ක්ෂයවීම් - තොරතුරු තාක්ෂණ | | 5,658 | 5,407 | 5,658 | 5,407 |
| | රක්ෂණය - තොරතුරු තාක්ෂණ | | 29 | 87 | 29 | 87 |
| | රැහැන් බදු කුලී | | 5,351 | 4,568 | 5,351 | 4,568 |
| | | | **15,856** | **15,076** | **15,856** | **15,076** |
| 14 | **ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය** | | | | | |
| | දේපල පිරිය හා උපකරණ ක්ෂවීම් | | 35,778 | 36,140 | 15,290 | 16,896 |
| | කල්බදු ඉඩම් හා සංවර්ධන කටයුතු ප්‍රාග්ධනීකරණය කිරීම් | | 4,882 | 697 | | |
| | ජෛවීය වත්කම් මත ක්ෂ්‍ය වීම්/ ක්‍රමක්ෂය | | - | 6,678 | | |
| | | | **40,660** | **43,515** | **15,290** | **16,896** |

| | | සටහන් | සමූහය 2016 ජනවාරි 31 දිනට රු '000 | සමූහය 2015 ජනවාරි 31 දිනට නැවත ප්‍රකාශ කිරීම රු '000 | සමාගම/මණ්ඩලය 2016 ජනවාරි 31 දිනට රු '000 | සමාගම/මණ්ඩලය 2015 ජනවාරි 31 දිනට නැවත ප්‍රකාශ කිරීම රු '000 |
|---|---|---|---|---|---|---|
| **15** | **ආදායම් බදු වියදම්** | | **2,733,111** | **2,007,460** | **2,394,498** | **2,060,646** |
| **15.1** | **ආදායම් බදු - සේනිහා අරමුදල් මණ්ඩලය** | | | | | |
| | මුදල් වෙළඳපොළ ආදායම | | | | 132 | 820 |
| | කොටස් ලාභාංශ | | | | 32,770 | 18,308 |
| | ණයකර | | | | 2,699 | 5,269 |
| | විදුලිබල ව්‍යාපෘති බැඳුම්කර | | | | 28,348 | 22,803 |
| | ස්ථාවර තැන්පතු | | | | 43,139 | 2,940 |
| | භාණ්ඩාගාර බිල්පත් | | | | 15,702 | 60,410 |
| | භාණ්ඩාගාර බැඳුම්කර | | | | 2,213,232 | 1,883,612 |
| | රුපියල් ණය | | | | - | 16,983 |
| | ප්‍රතිමිලදී ගැනීම් | | | | 20,293 | 11,442 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය | | | | 6 | 8 |
| | කඩිනම් ප්‍රතිලාළ ආදායම | | | | 2,378 | 1,904 |
| | වියන නිවාස ණය පොළි | | | | 6,844 | 8,124 |
| | දේපල ආදායම් - බදු කුළි | | | | 326 | 1,509 |
| | අධිහාර | | | | 23,279 | 23,254 |
| | අධිහාර ලේඛණ 11 | | | | 269 | - |
| | ආපදා ණය පොළි (විශේෂ ණය) | | | | 56 | 57 |
| | වාහන ණය පෝළි | | | | 606 | 571 |
| | විශේෂ ආපදා ණය පොළි | | | | 592 | 570 |
| | විශේෂ උත්සව ණය පොළි | | | | 14 | 15 |
| | විශේෂ අත්තිකාරම් පොළි | | | | 42 | - |
| | පරිගණක ණය පොළි | | | | - | - |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය | | | | 601 | 534 |
| | ක්‍රීඩා සමිති ණය පොළි | | | | 7 | 14 |
| | විවිධ ආදායම් | | | | 124 | 160 |
| | රථගාලේ හා නිවාඩු නිකේතයේ ලාභ/(අලාභ) | | | | 3,041 | 1,339 |
| | | | | | **2,394,498** | **2,060,646** |
| | අඩුකලා:- | | | | | |
| | නාමික බදු බැර | | | | | |
| | මූලාශ්‍රයේ ගෙවූ බද්ද | | | | (2,249,227) | (1,955,464) |
| | ගෙවිය යුතු බදු | | | | (107,094) | (67,131) |
| | | | | | **38,177** | **38,052** |
| **15.2** | **අදායම් බදු - ලංකා ලුණු සමාගම** | | | | | |
| | ප්‍රවර්ථන ආදායම් බදු | | | | 198,882 | - |
| | පෙර වර්ෂයේ ප්‍රවර්ථන ආදායම් බදු ඌන වෙන්කිරීම් | | | | - | 2,207 |
| | විලම්භිත ආදායම් බදු | | | | - | - |
| | විලම්භිත බදු වියදම/ (ප්‍රත්‍යාවර්ථනය) | | | | 139,732 | (55,394) |
| | **ආදායම් ප්‍රකශයේ වර්තාවූ ආදායම් බදු වියදම** | | | | **338,613** | **(53,186)** |





| | | සටහන් | සමූහය 2016 ජනවාරි 31 දිනට රු '000 | සමූහය 2015 ජනවාරි 31 දිනට නැවත ප්‍රකාශ කිරීම රු '000 | සමාගම/මණ්ඩලය 2016 ජනවාරි 31 දිනට රු '000 | සමාගම/මණ්ඩලය 2015 ජනවාරි 31 දිනට නැවත ප්‍රකාශ කිරීම රු '000 |
|---|---|---|---|---|---|---|
| **16** | **විකිණීම සඳහා රඳවාගත් අනෙකුත් මූල්‍ය වත්කම්** | | | | | |
| | මිළ ප්‍රකාශිත කොටස් ආයෝජනය (විකිණීම පිණිස) | | 1,955,837 | 1,494,287 | 1,955,837 | 1,494,287 |
| | අඩු කළා: මිල ප්‍රකාශිත කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | | - | - | - | - |
| | | | **1,955,837** | **1,494,287** | **1,955,837** | **1,494,287** |
| **17** | **පරිපාලිතයන්හි ආයෝජන** | | | | | |
| | ලංකා ලුණු සමාගම | | - | - | 470,961 | 470,961 |
| | | | **-** | **-** | **470,961** | **470,961** |
| **18** | **විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන** | | | | | |
| | මිල ප්‍රකාශිත කොටස් ආයෝජන (දිගු කාලීන) | | 8,788,639 | 8,427,668 | 8,788,639 | 8,427,668 |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් ආයෝජන | | 89,992 | 75,299 | 89,992 | 75,299 |
| | මිළ ප්‍රකාශිත ඒකක | | 330,886 | 334,732 | 330,886 | 334,732 |
| | පොරොන්දු නෝට්ටු | | 12,174 | 12,174 | 12,174 | 12,174 |
| | ලැයිස්තුවෙන් ඉවත් කළ සහ ඈවරකරණයට යටත් කොටස් | | 25,228 | 25,228 | 25,228 | 25,228 |
| | අඩුකළා : කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | | (25,228) | (25,228) | (25,228) | (25,228) |
| | පොරොන්දු නෝට්ටු හානිකරණය | | (12,174) | (12,174) | (12,174) | (12,174) |
| | ස්කන්ධ ආයෝජන හානිකරණය | | (283) | - | (283) | - |
| | | | **9,209,233** | **8,837,699** | **9,209,233** | **8,837,699** |

අලෙවිය සඳහා නොවන ස්කන්ධ ආයෝජනයන්හි සැලිකය යුතු දීර්ඝ කාලීන අගය හීනවීම් හඳුනාගැනීම සඳහා කලින් කල ඇගයීම් කරනු ලැබේ. මේ සඳහා කළමනාකරණය විසින් හානිකරණයන් පිළිබඳව සාක්ෂි සලකා බලන අතර, එය හුදෙක් වෙළඳපොළ අගය අඩුවීම පමණක් නොව ගුණාත්මක හා නෛසර්ගික වටිනාකම්වලද ඇගයීමකි. ඒ අනුව සැලැකිය යුතු හෝ දිගු කාලීන වටිනාකමේ අඩුවීමක් පිළිබඳ සාක්ෂි හමුවීම හා එවැනි වටිනාකම් අඩුවීමක් ආපසු හැරවීමේ සාධාරණ හැකියාවක් නොමැති කල්හි එකී ස්කන්ධ ආයෝජනයන්හි (රුපියල් 282,738) සඳහා හානිකරණ ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ තිබේ. එවැනි ප්‍රතිපාදන ලාභා අලාභ ගිණුම් හරහා ගලපනු ලබයි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **19** | **පරිනතවීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන** | | | | | |
| | භාණ්ඩාගාර බැඳුම්කර | | 196,302,449 | 187,759,682 | 196,302,449 | 187,759,682 |
| | භාණ්ඩාගාර බිල්පත් | | 3,624,832 | 4,269,404 | 3,624,832 | 4,269,404 |
| | මිල ප්‍රකාශිත ණයකර | | 2,194,114 | 1,653,914 | 2,194,114 | 1,653,914 |
| | අඩුකළා : මිල ප්‍රකාශිත ණයකර හානිකරණය | | (7,450) | (7,450) | (7,450) | (7,450) |
| | ස්ථාවර තැන්පත් | | 15,783,095 | 70,192 | 15,127,000 | - |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් | | 2,846,294 | 1,750,702 | 2,846,294 | 1,750,702 |
| | මිල ප්‍රකාශිත නොවූ ණයකර | | - | 200,000 | - | 200,000 |
| | බැඳුම්කර - විදුලිබල යෝජනා ක්‍රමය | | 2,367,270 | 2,679,635 | 2,367,270 | 2,679,635 |
| | | | **223,110,604** | **198,376,078** | **222,454,509** | **198,305,886** |

| | | සටහන් | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **20** | **ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම්** | | | | | |
| | නිවාස මූල්‍යණය - ජාතික සංවර්ධන බැංකුව | | 642,046 | 667,860 | 642,046 | 667,860 |
| | කාර්ය මණ්ඩල ණය | | - | - | - | - |
| | ආපදා ණය (විශේෂ ණය) | | 13,723 | 13,737 | 13,723 | 13,737 |
| | විශේෂ ආපදා ණය | | 176,103 | 169,824 | 176,103 | 169,824 |
| | උත්සව අත්තිකාරම් | | 571 | 610 | 571 | 610 |
| | විශේෂ උත්සව අත්තිකාරම් | | 849 | 917 | 849 | 917 |
| | විශේෂ අත්තිකාරම් | | 17,216 | 32,484 | 3,275 | 4,660 |
| | වාහන ණය | | 167,925 | 170,987 | 167,925 | 170,987 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය | | 339,383 | 307,943 | 339,383 | 307,943 |
| | | | **1,357,817** | **1,364,362** | **1,343,876** | **1,336,538** |
| **21** | **අනෙකුත් වත්කම්** | | | | | |
| | උපචිත ආදායම් | 21.1 | 7,015,577 | 6,246,206 | 7,015,577 | 6,246,206 |
| | ලැබිය යුතු ගිණුම් හා පූර්ව ගෙවීම් | 21.2 | 2,157,048 | 1,712,072 | 2,123,869 | 1,700,924 |
| | අයකරගත යුතු බදු | 21.3 | 97,805 | 151,626 | 68,054 | 98,430 |
| | තොග | 21.4 | 321,077 | 103,878 | 6,512 | 7,454 |
| | | | **9,591,507** | **8,213,782** | **9,214,011** | **8,053,014** |
| **21.1** | **උපචිත ආදායම්** | | | | | |
| | ලැබිය යුතු පොළී | | 7,043,442 | 6,274,072 | 7,043,442 | 6,274,072 |
| | අඩුකළා : අඩමාන ආදායම් සඳහා ප්‍රතිපාදන | | (27,866) | (27,866) | (27,866) | (27,866) |
| | | | **7,015,577** | **6,246,206** | **7,015,577** | **6,246,206** |
| **21.2** | **ලැබිය යුතු ගිණුම් සහ පූර්ව ගෙවීම්** | | | | | |
| | ලැබිය යුතු දායක මුදල් | | 1,806,052 | 1,547,314 | 1,806,052 | 1,547,314 |
| | වෙළඳ ණය ගැතියෝ | | 7,561 | 6,175 | - | - |
| | මුදල් ඇණවුම් පාලන ගිණුම | | 5,385 | 3,590 | 5,385 | 3,590 |
| | තැපැල් මුද්‍රා යන්ත්‍ර අග්‍රිමය | | 772 | 457 | 772 | 457 |
| | විවිධ ණයගැතියෝ | | 177,052 | 12,493 | 177,052 | 12,493 |
| | පෙර සේවකයින්ගෙන් අයවිය යුතු මුදල් | | 1,913 | 1,523 | 1,913 | 1,523 |
| | ආරක්ෂිත තැන්පතු | | 4,039 | 2,989 | 4,039 | 2,989 |
| | පූර්ව ගෙවීම් | | 7,155 | 8,356 | 7,155 | 8,356 |
| | කාර්ය මණ්ඩල ණය පෙරගෙවුම් පිරිවැය | | 119,273 | 121,324 | 119,273 | 121,324 |
| | අත්තිකාරම් ගෙවීම් | | 27,347 | 6,775 | 1,729 | 1,802 |
| | සමර්විල් සහ සමාගම - තැන්පතු | | - | 21,900 | - | 21,900 |
| | අඩුකලා : වෙනත් විස්තීරණ ආදායමට මාරු කිරීම | | - | (21,900) | - | (21,900) |
| | වෛද්‍යාධාර අත්තිකාරම් | | - | 15 | - | 15 |
| | ණය - ක්‍රීඩා සමාජය | | 499 | 1,060 | 499 | 1,060 |
| | | | **2,157,048** | **1,712,072** | **2,123,869** | **1,700,924** |





| | | සටහන් | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **21.3** | **අයවිය යුතු බදු** | | | | | |
| | අයකරගතයුතු බදු | | | | | |
| | ආදායම් බදු අත්තිකාරම් | | 97,805 | 151,626 | 68,054 | 98,430 |
| | | | **97,805** | **151,626** | **68,054** | **98,430** |
| **21.4** | **තොග** | | | | | |
| | සාමාන්‍ය ලුණු තොග | | 242,991 | 35,981 | - | - |
| | අයඩිනීකරණය කල තොග | | 3,482 | 1,516 | - | - |
| | නොනිමි තොග | | 23,604 | 19,404 | - | - |
| | පරිභෝජන භාණ්ඩ හා අමතර කොටස් | | 44,489 | 39,524 | - | - |
| | අඩුකළා : පරිභෝජන භාණ්ඩ සහ අමතර කොටස් සඳහා ප්‍රතිපාදන | | - | - | - | - |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ ද්‍රව්‍ය | | 5,030 | 6,146 | 5,030 | 6,146 |
| | පුස්තකාල | | 172 | - | 172 | - |
| | නිවාඩු නිකේතන තොග | | 1,310 | 1,308 | 1,310 | 1,308 |
| | | | **321,077** | **103,878** | **6,512** | **7,454** |

22 දේපළ, පිරියත සහ උපකරණ

22.1 සමූහය

| | ඉඩම් | ගොඩනැගිලි | බදු අයිතිය මත ගොඩනැගිලි | යන්ත්‍ර උපකරණ | මෝටර් වාහන | කල්බදුකල මෝටර් වාහන | ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ | පරිගණක උපාංග | උපකරණ | භාරකාර ජෛව වත්කම් නොමේරූ වගාවන් | මේරූ වගාවන් | සංවර්ධන කාර්යයන් | ඉදිරියට කරගෙන යන ඉදිකිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 20,000 | 37,380 | 581,608 | 176,397 | 221,208 | - | 100,769 | 139,538 | 31,740 | - | - | 38,130 | 51,839 | 1,398,610 |
| එකතු කිරීම් | - | - | 202 | 564 | 3,975 | 19,538 | 8,757 | 4,549 | 1,288 | 5,386 | - | - | 5,533 | 49,793 |
| ගැලපීම් | - | - | - | (5,071) | - | - | - | - | - | - | - | - | (221) | (5,293) |
| අපහරණයන් | - | - | - | - | (15,134) | - | (243) | - | - | - | - | - | - | (15,377) |
| හානිකරණයන් | - | - | - | - | - | - | - | - | - | (6,321) | - | - | - | (6,321) |
| ප්‍රත්‍යාගණනයන් / මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | 15,064 | 17,841 | - | (32,905) | (0) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,000** | **37,380** | **581,810** | **171,890** | **210,049** | **19,538** | **109,283** | **144,087** | **33,029** | **14,128** | **17,841** | **38,130** | **24,246** | **1,421,412** |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 20,000 | 37,380 | 581,810 | 171,890 | 210,049 | 19,538 | 109,283 | 144,087 | 33,029 | 14,128 | 17,841 | 38,130 | 24,246 | 1,421,412 |
| එකතු කිරීම් | - | 2,139 | 6,374 | 66,092 | 31,253 | 10,318 | 14,755 | 13,276 | 3,811 | - | - | 129,805 | 172,767 | 450,591 |
| අපහරණයන් | - | - | - | (26) | (779) | - | (2,208) | (254) | - | - | - | - | (1,230) | (4,497) |
| ගැලපීම් | - | - | - | - | - | - | (73) | (2,278) | - | - | - | - | - | (2,351) |
| හානිකරණයන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රත්‍යාගණනයන් / මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | (169,384) | (169,384) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,000** | **39,519** | **588,185** | **237,956** | **240,523** | **29,856** | **121,757** | **154,831** | **36,840** | **14,128** | **17,841** | **167,935** | **26,400** | **1,695,772** |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | - | 823 | 62,068 | 63,379 | 145,709 | - | 62,628 | 82,611 | 16,552 | - | - | 38,130 | - | 471,900 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 2,365 | 14,492 | 16,744 | 17,535 | 1,109 | 6,851 | 6,655 | 2,907 | - | 357 | - | - | 69,015 |
| අපහරණයන් | - | - | - | (4,839) | (11,080) | - | (219) | - | - | - | - | - | - | (16,137) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **3,188** | **76,560** | **75,285** | **152,164** | **1,109** | **69,260** | **89,266** | **19,459** | **-** | **357** | **38,130** | **-** | **524,777** |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | - | 3,188 | 76,560 | 75,285 | 152,164 | 1,109 | 69,260 | 89,266 | 19,459 | - | 357 | 38,130 | - | 524,777 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 2,285 | 14,551 | 17,277 | 15,005 | 3,641 | 7,422 | 7,026 | 3,050 | - | - | 4,185 | - | 74,441 |
| අපහරණයන් | - | - | - | (26) | (776) | - | (2,016) | (2,348) | - | - | - | - | - | (5,166) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **5,472** | **91,111** | **92,535** | **166,394** | **4,750** | **74,666** | **93,944** | **22,509** | **-** | **357** | **42,314** | **-** | **594,053** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | | | | | | | | | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 20,000 | 36,558 | 519,540 | 113,018 | 75,498 | - | 38,142 | 56,927 | 15,189 | - | - | - | 51,839 | 926,711 |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 20,000 | 34,193 | 505,250 | 96,606 | 57,884 | 18,429 | 40,023 | 54,821 | 13,570 | 14,128 | 17,484 | - | 24,246 | 896,635 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 20,000 | 34,047 | 497,074 | 145,421 | 74,130 | 25,106 | 47,091 | 60,887 | 14,331 | 14,128 | 17,484 | 125,620 | 26,400 | 1,101,719 |

22 දේපළ, පිරියත සහ උපකරණ

22.2 සමූහය

| | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් වාහන | සවිකිරීම් සහ | පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 37,380 | 138,183 | 82,849 | 139,538 | 417,951 |
| එකතු කිරීම් | - | - | - | 5,824 | 4,549 | 10,373 |
| ගැලපීම් | - | - | - | - | - | - |
| අපහරණයන් | - | - | (7,793) | (243) | - | (8,036) |
| ප්‍රත්‍යාගණනයන් | - | - | - | - | - | - |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,000** | **37,380** | **130,390** | **88,430** | **144,087** | **420,288** |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | 20,000 | 37,380 | 130,390 | 88,430 | 144,087 | 420,288 |
| එකතු කිරීම් | - | 2,139 | - | 10,940 | 13,276 | 26,355 |
| ගැලපීම් | - | - | - | (2,185) | (254) | (2,439) |
| අපහරණයන් | - | - | - | (73) | (2,278) | (2,351) |
| ප්‍රත්‍යාගණනයන් | | | | | | - |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,000** | **39,519** | **130,390** | **97,112** | **154,831** | **441,853** |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | - | 823 | 94,695 | 52,813 | 82,611 | 230,942 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 2,365 | 9,689 | 5,353 | 6,655 | 24,062 |
| අපහරණයන් | - | - | (7,642) | (219) | - | (7,861) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **3,188** | **96,742** | **57,947** | **89,266** | **247,143** |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | | 3,188 | 96,742 | 57,947 | 89,266 | 247,143 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 2,285 | 7,498 | 5,876 | 7,026 | 22,685 |
| අපහරණයන් | - | - | - | (2,006) | (2,348) | (4,354) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **5,472** | **104,240** | **61,817** | **93,944** | **265,474** |
| **ශුද්ධ පොත් අගය** | | | | | | |
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 20,000 | 36,558 | 43,488 | 30,036 | 56,927 | 187,008 |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 20,000 | 34,193 | 33,648 | 30,483 | 54,821 | 173,144 |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **20,000** | **34,047** | **26,150** | **35,295** | **60,887** | **176,379** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | සටහන් | සමූහය 2016 ජනවාරි 31 දිනට රු '000 | සමූහය 2015 ජනවාරි 31 දිනට නැවත ප්‍රකාශ කිරීම රු '000 | සමාගම/මණ්ඩලය 2016 ජනවාරි 31 දිනට රු '000 | සමාගම/මණ්ඩලය 2015 ජනවාරි 31 දිනට නැවත ප්‍රකාශ කිරීම රු '000 |
|---|---|---|---|---|---|
| **23 කල්බදු කල දේපල** | | | | | |
| පිරිවැය | | | | | |
| ජනවාරි 01 දිනට | | 20,910 | 20,910 | - | - |
| එකතු කිරීම් | | - | - | - | - |
| **දෙසැම්බර් 31 දිනට** | | **20,910** | **20,910** | **-** | **-** |
| සම්මුච්චිත ක්‍රමක්ෂය | | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 14,637 | 13,940 | - | - |
| වර්ෂය සඳහා අයවීම් | | 697 | 697 | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **15,334** | **14,637** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | | **5,576** | **6,273** | **-** | **-** |
| **24 අස්පෘෂ්‍ය වත්කම්** | | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 266 | 369 | 266 | 369 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | | (74) | (103) | (74) | (103) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | 192 | 266 | 192 | 266 |
| **25 ආයෝජන දේපළ** | | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 3,200,000 | 3,200,000 | 3,200,000 | 3,200,000 |
| සාධාරණ අගයේ වෙනස්කම් | | 200,000 | - | 200,000 | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | 3,400,000 | 3,200,000 | 3,400,000 | 3,200,000 |



**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**26 පොලියට යටත්වූ ණය**

ලංකා ලුණු සමාගම

| | | 2016 දෙසැම්බර් 31 දිනට | | | 2015 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | එකතුව | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | වර්ෂයක් තුළ ගෙවිය යුතු මුදල | එකතුව |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| බැංකු ණය | 27.1 | 7,260 | - | 7,260 | 24,038 | 7,260 | 31,298 |
| මූල්‍ය කල්බදු | | 5,157 | 12,378 | 17,535 | 3,565 | 11,197 | 14,762 |
| බැංකු අයිරාව | | 202,329 | - | 202,329 | - | 7,607 | 7,607 |
| | | **214,746** | **12,378** | **227,124** | **27,603** | **26,064** | **53,667** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්**

| | සටහන | 2016.01.01 දිනට (රු'000) | ලබා ගත් ණය (රු'000) | නැවත ගෙවීම් (රු'000) | 2016.12.31 දිනට (රු'000) |
|---|---|---|---|---|---|
| **26.1 බැංකු ණය** | | | | | |
| හැටන් නැෂනල් බැංකු පීඑල්සී | | 16,020 | - | 8,760 | 7,260 |
| ලංකා බැංකුව | | 15,278 | - | 15,278 | - |
| | | **31,298** | **-** | **24,038** | **7,260** |

**27 ප්‍රදාන හා සහනාධාර**

**ලංකා ලුණු සමාගම**

| | අයඩිනීක යන්ත්‍රය | ගොඩනැගිලි | පොම්පා ගාරය | සේවක වන්දි | යන්ත්‍රය සඳහා අයඩීන් | එකතුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **පිරිවැය** | | | | | | | |
| ජනවාරි 01 දිනට | 19,515 | 41,124 | 1,387 | 4,260 | 2,550 | 68,837 | 68,837 |
| **දෙසැම්බර් 31 දිනට** | **19,515** | **41,124** | **1,387** | **4,260** | **2,550** | **68,837** | **68,837** |
| **ක්‍රමක්ෂය** | | | | | | | |
| ජනවාරි 01 දිනට | 16,107 | 8,825 | 301 | - | 2,347 | 27,579 | 22,218 |
| වර්ෂයේ ප්‍රත්‍යාවර්ථනය | 1,952 | 1,028 | 35 | - | 203 | 3,217 | 5,361 |
| **දෙසැම්බර් 31 දිනට** | **18,058** | **9,853** | **335** | **-** | **2,550** | **30,796** | **27,579** |
| **කපාහල අගය** | | | | | | | |
| **දෙසැම්බර් 31 දිනට** | **1,457** | **31,272** | **1,052** | **4,260** | **-** | **38,041** | **41,258** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | සටහන් | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| | | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **28** | **නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | | | | | |
| | ජනවාරි 01 දිනට ආරම්භ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | | 356,924 | 300,119 | 193,085 | 146,459 |
| | පොළී වියදම් | | 79,648 | 38,250 | 21,239 | 16,110 |
| | ප්‍රවර්ථන සේවා ගාස්තු පිරිවැය | | 8,973 | 8,742 | 8,973 | 8,742 |
| | ප්‍රතිලාභ ගෙවීම් | | (43,337) | (19,982) | (20,195) | (8,020) |
| | බැඳියාව මත ආයුගණන ලාභ/ අලාභ | | (500) | 29,794 | (500) | 29,794 |
| | **දෙසැම්බර් 31 දිනට අවසන් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | | **401,707** | **356,924** | **202,603** | **193,085** |
| **29** | **අනෙකුත් බැරකම්** | | | | | |
| | ගෙවිය යුතු ගිණුම් හා විවිධ ණයගැතියෝ | 29.1 | 406,670 | 355,606 | 101,501 | 158,766 |
| | විලම්භිත බදු වගකීම් | 30.2 | 100,813 | - | - | - |
| | | | **507,483** | **355,606** | **101,501** | **158,766** |
| **29.1** | **ගෙවිය යුතු ගිණුම් හා විවිධ ණය ගැතියෝ** | | | | | |
| | ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම් මත රඳවාගත් බදු | | 15,214 | 12,730 | 15,214 | 12,730 |
| | වෙළඳ හා අනෙකුත් බැරකම් | 29.1.1 | 305,169 | 196,840 | - | - |
| | ප්‍රතිලාභ ගෙවීම් මත රඳවාගත් බදු | | 604 | 528 | 604 | 528 |
| | නොගෙවූ වේතන | | 6 | 142 | 6 | 142 |
| | වැටුප් ගෙවීම් මත ගෙවිය යුතු මුද්දර බදු | | 93 | 93 | 93 | 93 |
| | අධිකාරී සේවක අර්ථසාධක අරමුදල | | 11,796 | 11,775 | 11,796 | 11,775 |
| | විවිධ ණය හිමියෝ | | 38,772 | 96,196 | 38,772 | 96,196 |
| | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ | | 5,310 | 4,754 | 5,310 | 4,754 |
| | නොගෙවූ මරණ ප්‍රතිලාභ | | 9,992 | 9,914 | 9,992 | 9,914 |
| | ගෙවිය යුතු සේ නි භාර අරමුදල | | 1,415 | 1,412 | 1,415 | 1,412 |
| | උපයනවිට ගෙවියු යුතු බදු | | 2,498 | 2,957 | 2,498 | 2,957 |
| | එකතුකල අගය මත බදු | | 731 | 534 | 731 | 534 |
| | ජාතිය ගොඩනැගීමේ බදු | | 106 | 96 | 106 | 96 |
| | ඉල්ලුම් නොකළ ශිෂ්‍යත්ව අරමුදල් | | 2,113 | 2,258 | 2,113 | 2,258 |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | | 16,087 | 15,305 | 16,087 | 15,305 |
| | පුස්ථකාල අරමුදල | | 45 | - | 45 | - |
| | මණ්ඩලයේ සැමරුම් අරමුදල | | (3,376) | - | (3,376) | - |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | | 14 | - | 14 | - |
| | වැටුප් අවකරණ නිශ්කාශන | | 80 | 72 | 80 | 72 |
| | | | **406,670** | **355,606** | **101,501** | **158,766** |

| | | ලංකා ලුණු සමාගම | |
|---|---|---|---|
| | | 2016 දෙසැම්බර් 31 දිනට රු '000 | 2015 දෙසැම්බර් 31 දිනට රු '000 |
| **29.1.1** | **වෙළඳ හා අනෙකුත් බැරකම්** | | |
| | මූල්‍ය වගකීම් | 39,615 | 50,098 |
| | වෙළඳ බැරකම් | 9,890 | 8,212 |
| | ගෙවිය යුතු ලුණු ප්‍රවහන වියදම් | 16,785 | 32,823 |
| | ගෙවිය යුතු තැන්පතු | 18,952 | 905 |
| | ගෙවිය යුතු ලාභාංශ | - | 16,215 |
| | ගෙවිය යුතු ඉඩම් කුලී | | |
| | මූල්‍ය නොවන වගකීම් | 127,803 | 35,593 |
| | උපචිත වියදම් | 26,640 | 5,934 |
| | ගෙවිය යුතු - වෙනත් | 26,356 | 7,931 |
| | එකත කළ අගය මත බදු - ගෙවිය යුතු | 39,129 | 39,129 |
| | **ගෙවිය යුතු කොන්ත්‍රාත් වියදම්** | **305,169** | **196,840** |

| | ලංකා ලුණු සමාගම | | | | |
|---|---|---|---|---|---|
| | බදු කරයුතු සඳහා වූ ප්‍රාග්ධන දීමනා | නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් | ප්‍රදාන සහ සහනාධාර | බදු අලාභවලට ආරෝපනය කළ හැකි | එකතුව |
| **29.2 විලම්භිත බදු වගකීම** | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 | Rs. '000 |
| 2015 ජනවාරි 01 දිනට | 99,315 | (43,025) | (12,339) | (27,476) | 16,475 |
| වර්ෂයේ ලාභ/ අලාභට ගැලපීම | 5,595 | (2,850) | 787 | (58,926) | (55,394) |
| **2016 ජනවාරි 01 දිනට** | **104,910** | **(45,875)** | **(11,552)** | **(86,402)** | **(38,919)** |
| වර්ෂයේ ලාභ/ අලාභට ගැලපීම | 62,304 | (9,875) | 901 | 86,402 | 139,732 |
| **2016 දෙසැම්බර් 31 දිනට** | **167,213** | **(55,749)** | **(10,651)** | **-** | **100,813** |
| විලම්භිත බදු වගකීම | | | | (167,213) | (104,910) |
| විලම්භිත බදු වත්කම | | | | 66,401 | 57,427 |
| ඉදිරියට ගෙනා භාවිතා නොකල ව්‍යාපාර අලාභ | | | | - | 86,402 |
| **ශුද්ධ විලම්භිත බදු** | | | | **(100,813)** | **38,919** |

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
**මුල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | සමූහය | | සමාගම/මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට | 2016 ජනවාරි 31 දිනට | 2015 ජනවාරි 31 දිනට |
| | | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 | රු '000 | නැවත ප්‍රකාශ කිරීම රු '000 |
| **30** | **ප්‍රතිපාදන** | | | | |
| | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,990 | 3,300 | 1,990 | 3,300 |
| | දුරකථන ගාස්තු සඳහා  ප්‍රතිපාදන | 709 | 208 | 709 | 208 |
| | විදුලි ගාස්තු සඳහා ප්‍රතිපාදන | 90 | 59 | 90 | 59 |
| | ජල ගාස්තු සඳහා ප්‍රතිපාදන | 105 | 30 | 105 | 30 |
| | සේවක අනතුරු වන්දි යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන | 2,000 | 2,000 | 2,000 | 2,000 |
| | ප්‍රසාද දීමනා ප්‍රතිපාදන | 153 | 584 | 153 | 584 |
| | ලබා නොගත් නිවාඩු ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 10,488 | 10,804 | 10,488 | 10,804 |
| | තැපැල් ගාස්තු සඳහා ප්‍රතිපාදන | 779 | 718 | 779 | 718 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | 71,528 | 87,300 | 71,528 | 87,300 |
| | 5 වසර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | - | 108,750 | - | 108,750 |
| | | **87,841** | **213,754** | **87,841** | **213,754** |



# විගණකාධිපති වාර්තාව 2016

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. එල්ඊඩබ්/බී/ඊටීඑෆ්/එෆ්ඒ/2016
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2017 නොවැම්බර් 30 දින

සභාපති,
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය.

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයේ සාමාජිකයන් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.





### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සහ එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - මණ්ඩලය**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2016 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය**

පරිපාලිතයක් අත්පත් කර ගැනීමේදී උද්ගත වන කීර්තිනාමය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත යුතු අතර එම අස්පෘශ්‍ය වත්කම සම්බන්ධයෙන් හානිකරණයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව වාර්ෂිකව පරීක්ෂා කළ යුතුය. එසේ වුවද, මණ්ඩලය විසින් ලංකා ලුණු සමාගම අත්පත් කර ගැනීමේදී උද්ගත වූ රු. 378,926,440 ක් වූ කීර්තිනාමය, ප්‍රමිතයට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ලියාහැර තිබුණි.







**2.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - මණ්ඩලය**

**2.3.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

ප්‍රමිතයේ 49 වන වගන්තිය ප්‍රකාරව, ඉකුත් කාලපරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීමේදී, වරදේ ස්වාභාවය, නිවැරදිකරන ප්‍රමාණය හා නිවැරදි කිරීම් බලපානු ලබන අයිතමයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මණ්ඩලයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සාමාජික අරමුදලට 2015 හා 2016 වර්ෂවලදී සිදු කර තිබූ පිළිවෙලින් රු. 2,815,000 ක් හා රු. 16,607,000 ක් වූ පෙර වර්ෂ වල ගැලපීම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 51 වගන්තිය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කල යුතුය. එහෙත් මණ්ඩලය ඒ අනුව කටයුතු කිරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 441,853,000 ක් වූ ජංගම නොවන වත්කම් තුළ වර්ෂ 25 කට අධික කාලයක සිට හීනවන ශේෂ ක්‍රමය යටතේ තවදුරටත් ක්ෂය වෙමින් පවතින වත්කම් පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

(i) ප්‍රමිතයේ 58 වන වගන්තිය ප්‍රකාරව, ව්‍යවසාය විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම හානිකරණ අලාභයක් ඇති බවට සාධාරණ සාක්ෂි තිබේද යන්න පිළිබඳ තක්සේරුවක් කළ යුතු විය. එසේම, 61 වන වගන්තිය ප්‍රකාරව ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට වඩා අඩු බවට වැදගත් හා දිගුකාලීන පරිහානියක් තිබේ නම් එය සාධාරණ සාක්ෂියක් ලෙස හඳුනාගත යුතු විය. ඒ අනුව මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව සෑම මූල්‍ය වර්ෂයකදීම ඉහත ප්‍රමිතය ප්‍රකාරව

හානිකරණ අලාභයන් පිළිබඳ තක්සේරුවක් සිදු කළයුතු වුවත් මණ්ඩලය විසින් 2016 මූල්‍ය වර්ෂය සඳහා එවැනි තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන්ගේ සාධාරණ අගය එහි පිරිවැයට සාපේක්ෂව සියයට සියයට 30 සිට සියයට 67 දක්වා අඩු වූ අවස්ථා 9 ක් පැවති අතර ඊට අදාළ හානිකරණ අලාභ රු. 295,655,000 ක් විය. එහෙත් රු. 282,739 ක් වූ හානිකරණ අලාභයක් පමණක් 2016 වර්ෂයේදී ගැලපීම් කර තිබීම හේතුවෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කර නොතිබූ හානිකරණ අලාභය රු. 295,372,261 ක් විය.

### 2.3.2 පැහැදිලි නොකල වෙනස්කම්

මණ්ඩලයේ 2016/2017 තක්සේරු වර්ෂය සඳහා සකස් කරන ලද බදු වාර්තාව අනුව, 2016 දෙසැම්බර් 31 දිනට දළ බදු බැදියාව හා ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ බදු බැදියාව අතර රු. 107,093,775 ක වෙනසක් විය. එමෙන්ම ආදායම් බදු වාර්තාව අනුව හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු බදු බැදියාව අතර රු. 43,663,000 ක වෙනසක් විය. එසේ වුවද, මණ්ඩලය විසින් එම නොසැසඳුණු ශේෂ සම්බන්ධයෙන් වූ සැසඳුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

### 2.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| අයිතමය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (i) ආයෝජන වත්කම් ප්‍රත්‍යාගණන ලාභ | 200,000,000 | ප්‍රත්‍යාගණන වාර්තාව |
| (ii) භාණ්ඩාගාර බැඳුම්කර අගය කිරීමේ වරද නිවැරදි කිරීම | 74,995,000 | අදාල විස්තරාත්මක වාර්තා හා උපලේඛන |





## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයට පෙර වර්ෂවලට අදාළව උසස් පෙළ සමතුන්ට ගෙවියයුතු හිමිකම් නොපෑ ශිෂ්‍යත්ව මුදල් රු. 2,113,000 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට අඛණ්ඩව වැඩිවෙමින් පවතින හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ රු. 9,992,462 ක්ද, 2001 වර්ෂයේ සිට පැවත එන රඳවාගත් ප්‍රතිලාභ රු. 16,087,267 ක්ද හා ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ රු. 5,310,499 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. 31,390,228 ක් පැවති අතර 2017 මැයි 31 දින වනවිටරු. 2,800,844 ක් පමණක් අදාළ ප්‍රතිලාභීන් වෙත නිරවුල් කර තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත | (i) මණ්ඩලය සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන අතර ඒ අනුව සේවකයන්ට හිමි වාර්ෂික නිවාඩු සංඛ්‍යාව 14 ක් හා අනියම් නිවාඩු 07 ක් වශයෙන් උපරිම 21 ක් වුවද, ඊට පටහැනිව වාර්ෂික නිවාඩු 42 ක් ලබාදී තිබුණි. |
| | (ii) පනත ප්‍රකාරව, අතිකාල සඳහා ගෙවීම් කිරීමේදී සාමාන්‍ය පැයක වේතනය මෙන් එකහමාරක් ගෙවිය යුතු වුවද, ඊට පටහැනිව මණ්ඩලය අතිකාල පැයකට පැය එකහමාරක් සමග දිනක වැටුපක්ද එකතුකර අතිකාල ගෙවා තිබුණි. ඒ අනුව මණ්ඩලයේ 2016 වර්ෂයේ අතිකාල පිරිවැය රු. 16,312,000 ක ඉහල අගයක් ගෙන තිබුණි. |

(iii) අතිකාල සඳහා හිමිකම් ලැබීමට නම් සාමාන්‍ය උපරිම කාලය වන සතියකට පැය 45 ක්ට වඩා වැඩියෙන් සේවය කළ යුතුය. එසේ වුවද, මණ්ඩලය විසින් සතියකට පැය 45 උපරිමය සලකා බැලීමකින් තොරව දිනකට පැය 8 ඉක්මවන සෑම පැයකටම අතිකාල ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ ලාභය රු.මිලියන 14,349 ක් හා මණ්ඩලයේ ලාභය රු. මිලියන 13,651 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමූහයේ හා මණ්ඩලයේ ලාභ පිළිවෙලින් රු.මිලියන 11,873 ක් හා රු.මිලියන 11,990 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 2,476 කින් හා රු.මිලියන 1,661 කින් වර්ධනය වී තිබුණි. මණ්ඩලයේ පොලී ආදායම් රු.මිලියන 3,218 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. කෙසේ වුවද, මෙම වාර්තාවේ 2.3.1 (ඇ) (ii) ඡේදයෙහි දක්වා ඇති විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභය වූ රු. 295,372,261 ක් සැලකිල්ලට ගත්විට ලාභයේ සත්‍ය වර්ධනය එම ප්‍රමාණයෙන් අඩුවිය යුතුය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී මණ්ඩලයේ ලාභය අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර 2012 දී රු. 7,958,000,000 ක්වූ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු. 13,651,165,000 ක් වී තිබුණි. එසේම මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ආදායම් බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී දී රු.8,776,771,000 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.17,052,574,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2.3.1(ඇ) (ii) හි දැක්වෙන පරිදි හානිකරණ අලාභය ගැලපීමෙන් පසු හා සමාලෝචිත වර්ෂයේ ලාභයට පසුගිය වර්ෂයේ ලාභයෙන් එකතු කරන ලද රු. 3,317,869,000 ක

7



ප්‍රමාණය ඉවත් කළ විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ දී ගෙවිය යුතු වන සියයට 3 බැගින් වන අනිවාර්ය පොලී ගෙවීම් හා 14 වන වගන්තිය අනුව ප්‍රකාශ කරන ලද සියයට 6 බැගින් වන ලාභාංශ ප්‍රතිලාභ ගෙවූ පසු ඉදිරියට ගෙන යන ශුද්ධ අලාභය රු. 163,743,261 ක් විය. එය මණ්ඩලයේ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය කාර්යසාධනයට අවාසි සහගත බලපෑමක් ඇති නොකරනු ඇතැයි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) වර්ෂයේ මුළු ආදායම වර්ෂයේ ආරම්භක දිනට ඇති අරමුදලේ වටිනාකම සමග සැසඳීමේදී 2016 හා 2015 වර්ෂවල සියයට 11.24 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණු අතර වර්ෂයේ ලද ශුද්ධ දායක මුදල් හා ආරම්භක සාමාජික අරමුදලට සාපේක්ෂව සියයට 10.8 ක් විය.

(ඇ) මණ්ඩලයේ මෙහෙයුම් ලාභ අනුපාතය 2016 වර්ෂයේදී හා 2015 වර්ෂයේදී සියයට 89 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

(ඇ) 2015 ජනවාරි මාසයට සාපේක්ෂව 2016 ජනවාරි මාසය වනවිට මණ්ඩලයේ සාමාජික අරමුදලේ හා දළ ආදායමේ වර්ධනය පිළිවෙලින් සියයට 12.7 ක් හා සියයට 12.9 ක් වශයෙන් පැවතුණි.

**3.3 ආයතනය විසින් හෝ ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

මණ්ඩලය විසින් ගෙවා තිබූ රු. 21,900,000 ක වන්දි මුදලක් ආවරණය කර ගැනීම සඳහා සහ අයවීමට තිබූ රු. 1,902,318 ක බදු මුදලක් අයකර ගැනීම සඳහා බාහිර ආයතන 2 කට එරෙහිවද රු. 242,887,355 ක දායක මුදල් හා අධිභාර අයකර ගැනීම වෙනුවෙන් දිවයින පුරා අධිකරණවල නඩු 2,415 ක්ද ගොනුකර තිබුණි. එසේම බාහිර ආයතන විසින් රු. 16,292,987 ක අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව නඩු 18 ක් අධිකරණවල ගොනු කර තිබුණි. තවද ඒවායේ ස්වභාවය, වර්තමාන තත්ත්වය යනාදිය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

8

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1** **කාර්යසාධනය**

----------------------

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව, මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගිවීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම, ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවා තිබුණි.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 අංක 47 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනතේ 7 වන වගන්තියෙන් සංශෝධිත 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 20 (1) වගන්තිය ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ස්වයං රැකියාලාභීන් බඳවාගැනීමට ඉඩකඩ සලසා දී තිබුණි. එසේ වුවත්, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ ස්වයං රැකියාලාභීන් ලෙස වාර්තා වී ඇති සංඛ්‍යාව 2,511,568 ක් පමණ වුවත් මණ්ඩලයේ සාමාජිකයන් ලෙස ඉන් බඳවා ගැනීමට හැකිවී තිබුණේ සාමාජිකයන් 39,629 ක් හෙවත් මුළු සංඛ්‍යාවෙන් සියයට 1.58 ක් පමණක් විය. 2016 වර්ෂය තුළ ස්වයං රැකියාලාභීන්ගෙන් ලැබුණු දායක මුදල රු.43,716,657 ක් වන අතර, එය එම වර්ෂයේ මුළු දායක ලැබීම්වලින් සියයට 0.22 ක් පමණ විය. 1989 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ස්වයං රැකියාලාභීන්ගෙන් ලද මුළු දායක මුදල රු.277,457,066 ක් වන අතර, එය 2016 ආරම්භයට පැවති සාමාජික අරමුදලින් 0.13 ක් විය. අරමුදල් පනත මගින් විශේෂයෙන් නියම කර ඇති මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට මණ්ඩලය තුළ වෙනම අංශයක් ස්ථාපිත කර ක්‍රියාකාරී සැලැස්ම තුළ උපායමාර්ග දක්වා තිබුණද, ඉහත නිරීක්ෂණ අනුව 2016 වර්ෂයේ අවසන් වන විටත් ඒ සඳහා දක්වා තිබූ අවධානය අවම මට්ටමක පැවතුණි.

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වන වගන්තිය අනුව, ප්‍රකාශකළ යුතු අනිවාර්ය පොලිය සියයට 3 හා 14 වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශ කරන ලද සියයට 6 ක ලාභාංශ ප්‍රතිශතය සමග මුළු ප්‍රතිලාභය සහ





AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී එම ගෙවීම් මූල්‍යයනය කරගත් ආකාරය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 වර්ෂයේ දී සාමාජිකයන්ට පොලී හා ලාභාංශ වශයෙන් සියයට 12.5 ක් ප්‍රකාශ කර තිබූ අතර 2015 හා 2016 වන විට එම ප්‍රතිශතය සියයට 9 දක්වා වර්ෂ 5 ක් තුළදී සියයට 3.5 කින් අඩු වී තිබුණි.

(ii) මණ්ඩලයේ සාමාජික අරමුදල අඛණ්ඩව වර්ධනය වුවද, වර්ෂය තුළ උපයන ලාභය වර්ධනය නොවීම හේතුවෙන් සාමාජික ප්‍රතිලාභ ගෙවීම සඳහා දිගින් දිගටම රඳවා ගත් ලාභ හෝ සංචිත භාවිතා කිරීමට සිදුවී තිබුණි. ඒ අනුව පොලී හා ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් ලාභයක් ප්‍රවර්තන වර්ෂයේ දී උපයා නොමැති වීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට 2014 දක්වා කාලය තුළ ලාභාංශ සම කිරීමේ සංචිතයෙන් රු. 3,858,000,000 ක් ලබාගෙන තිබුණි. මේ හේතුවෙන් 2010 වර්ෂයේදී රු. 4,000,000,000 ක්ව පැවති ලාභාංශ සම කිරීමේ සංචිතය 2016 වනවිට රු. 142,000,000 ක් දක්වා පහත බැස තිබීමෙන් මණ්ඩලයේ සාමාජිකයන්ට අනාගතයේදී ප්‍රතිලාභ ගෙවීමේදී අවදානමකට මුහුණ දීමට සිදුනොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විණි. තවද, 2015 වර්ෂයට අදාළ සියයට 9 ක් වූ ප්‍රතිලාභ පියවීම සඳහා රඳවාගත් ලාභ වලින් රු. 37,550,000 ක් ද භාවිතා කර තිබුණි.

(iii) 2014 වර්ෂයේ රු. 17,624,426,000 ක් වූ පොලී හා ලාභාංශ මූල්‍යනය කිරීමට එම වර්ෂයේ උපයන ලද ලාභය යොදා ගත් පසු ලාභාංශ සම කිරීමේ සංචිතයෙන් ලබාගත යුතු වූයේ රු. 492,167,000 ක් වුවද, එම වර්ෂයේ දී ලාභාංශ සම කිරීමේ සංචිතයෙන් රු. 515,000,000 ක් ලබාගෙන තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සාමාජික සුබසාධන ප්‍රතිලාභ ක්‍රම දහයක් පමණ ක්‍රියාත්මක කරන අතර සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 3 ක තොරතුරු සැලකීමේදී සුබසාධන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබන සාමාජික සංඛ්‍යාව මුළු සාමාජික සංඛ්‍යාවෙන් 2015 වර්ෂයේදී හා 2016 වර්ෂයේදී පිළිවෙලින් සියයට 0.41 ක් හා සියයට 0.57 ක් වැනි සුළු ප්‍රතිශතයක් වුවද ඒ සඳහා දරා ඇති වියදම මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 22 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) සංයුක්ත සැලැස්මට අනුව, තොරතුරු තාක්ෂණ අංශය විසින් වර්තමානයේ පවතින සාමාජික ගිණුම් කළමනාකරණ පද්ධතිය හා අනෙකුත් මෘදුකාංග පද්ධති පිළිබඳව අධ්‍යනයකර නව මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය කිරීමටත්, ආපදා වළක්වා ගැනීමේ සැළසුම ක්‍රියාත්මක කිරීමටත් සැළසුම් සකස් කර තිබුණද එම කාර්යයන් 2016 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

## 4.3 අරමුදල් ආයෝජනය

------------------------

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්  මණ්ඩලය විසින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමේදී ආයෝජනය කළයුතු පරිනත කාලසීමාව (tenor), ඵලදා අනුපාතය හා මුදල සම්බන්ධ ආයෝජන උපදේශන කාර්යය සඳහා 2015 ජුලි මාසයේ සිට පෞද්ගලික අරමුදල් කළමනාකරණ ආයතනයක සහාය ලබාගෙන තිබුණද දෙපාර්ශවය අතර ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. 2016 වර්ෂය තුළ එම ආයතනයේ උපදේශන සහාය ඇතිව සිදුකළ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික හා ද්විතියික වෙළඳපොල මිලදී ගැනීම් වල මුහුණත වටිනාකම රු. 24,055,225,802 ක් විය. ලිඛිත ගිවිසුමක් රහිතව සහ ගාස්තු අයකිරීමකින් තොරව ලබාදෙන උපදෙස් වල නීතිමය වලංගුභාවය සහ මණ්ඩලයට අදාළ වැදගත් මූල්‍ය තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කරගැනීම  පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් මේ තුළින් මතු නොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකිවිණි.

ඉහත සඳහන් පෞද්ගලික අරමුදල් කළමනාකරණ ආයතනයේ උපදෙස් මත සිදුකර තිබූ ආයෝජන සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා මිල ගණන් කැඳවූ සාර්ථක අවස්ථා 22 ක් අතරින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ලංසු සියයට 100 ක්ම ප්‍රතික්ෂේප වූ අවස්ථා 13 ක් පැවතිණි. එම ප්‍රතික්ෂේප වූ බැඳුම්කර සඳහා වූ ද්විතියික වෙළඳපොළ ඵලදා අනුපාතයන් පිළිබඳව සලකා බැලීමේදී පවත්නා වෙළඳපොල තත්ත්වයන් පිළිබඳව නිසි අධ්‍යනයකින් තොරව ඉහල ඵලදා අනුපාතයන් යටතේ ලංසු ඉදිරිපත් කිරීම හේතුවෙන් ප්‍රාථමික වෙළඳපොළ තුළ ඉදිරිපත් කල මිල ගණන් ප්‍රතික්ෂේප වී තිබුණි. එබැවින් ප්‍රාථමික වෙළඳපොළ තුළ ආයෝජනය කිරීමෙන් ලබා ගැනීමට හැකිව තිබූ මූල්‍ය වාසි අහිමි කරගෙන තිබුණි.

11

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ආ) 2016 මැයි හා ජුනි මාසවලදී නිකුත් කරන ලද ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක LKB01226F014 න් මණ්ඩලය විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් රු.මිලියන 2,200 ක බැඳුම්කර සියයට 12.6 ත් සියයට 13.5 ත් අතර ඵලදා අනුපාතයකට මිලදී ගැනීමට අයදුම්කර තිබූ නමුත් එම සියළු ලංසු ප්‍රතික්ෂේප වී තිබුණි. කෙසේ නමුත්, එම අංක දරන බැඳුම්කරයම සියයට 11.8 ත් 12.8 ත් අතර වූ අඩු ඵලදා අනුපාත යටතේ 2016 මැයි, ජුනි හා ජුලි මාසවලදී රු.මිලියන 1,927 ක් වැයකර ද්විතියික වෙළඳපොළෙන් මිලට ගෙන තිබුණි. එසේම, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක LKB01025C157 න් රු.මිලියන  2,100 ක බැඳුම්කර 2016 ජුනි මාසයේදී ප්‍රාථමික වෙළඳපොලෙන් මිලදී ගැනීමට සියයට 12.7 ත්, සියයට 13.26 ත් අතර ඵලදා අනුපාතයක් යටතේ අයදුම්කර තිබූ නමුත් එම ලංසු ද ප්‍රතික්ෂේප වී තිබුණි. නමුත් එම අංක දරන බැඳුම්කරයම සියයට 12.25 ත්, සියයට 12.58 ත් අතර වඩා අඩු ඵලදා අනුපාතයක් යටතේ 2016 ජුලි මාසයේදී රු.මිලියන 416 ක් වැයකර  ද්විතියික වෙළඳපලෙන් මිලට ගෙන තිබුණි. මේ අනුව, මණ්ඩලය විසින් සාධාරණ මිල ගණන් ඉදිරිපත් කර ප්‍රාථමික වෙළඳපොලෙන් සෘජුව මිලදී ගැනීමට තිබූ අවස්ථාවන් අහිමි වී තිබූ අතර අඩු ඵලදාවක් සහිතව ද්විතියික වෙළඳපලෙන් එම බැඳුම්කරම මිලට ගැනීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසි මණ්ඩලයටත් සාමාජිකයින්ටත් අහිමි වී තිබුණි.

(ඇ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික වෙළඳපොලෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමට අයදුම් කිරීමේදී ඉදිරිපත් කරන ඵලදා අනුපාතයන් ඒ හා සමාන ක්ෂේත්‍රයක නියැලී සිටින අරමුදලක් විසින් ඉදිරිපත් කරන ඵලදා අනුපාතයන් සමග සැසඳීමේදී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ඉතා ඉහල ඵලදා අනුපාතයන් ඉදිරිපත් කිරීම හේතුවෙන් ආයෝජන අවස්ථා අහිමිකර ගෙන තිබූ අවස්ථා පහත දැක්වේ.

12

| මිලදී ගැනීමේ දිනය | ජාත්‍යන්තර සුරැකුම්පත් අංකය | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | | සමාන ක්ෂේත්‍රයේ නියැලී සිටින අරමුදල | |
|---|---|---|---|---|---|
| | | ප්‍රතික්ෂේප වූ වටිනාකම | ඵලදා අනුපාතය | පිළිගත් බැදුම්කර වටිනාකම | ඵලදා අනුපාතය |
| | | (රු.මිලියන) | (%) | (රු.මිලියන) | (%) |
| 11/01/2016 | LKB01025H016 | 1,300 | 11.13-11.49 | 1,000 | 11.10 |
| 01/03/2016 | LKB00821H019 | 605 | 11.6-12.2 | 1,000 | 11.4 |
| | | | | 2,000 | 11.45 |
| 16/05/2016 | LKB01024A014 | 440 | 12.2-12.5 | 1,000 | 12.10 |

(ඇ) මණ්ඩලය විසින් ප්‍රාථමික හා ද්විතියික වෙළඳපොළ හරහා මිලට ගනු ලබන භාණ්ඩාගාර බැදුම්කර "පරිණත වීම තෙක් රඳවාගන්නා බැදුම්කර" ලෙස වර්ගකර පවත්වා ගන්නා බැවින් ඒවා ද්විතියික වෙළඳපොළ තුළ විකිණීමෙන් ලබාගත හැකි මූල්‍ය වාසි අත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Dealership) මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අත්කර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් ද්විතියික වෙළඳපොළ හරහා භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම් පිළිබඳ පරීක්ෂාවේදී ප්‍රාථමික ගනුදෙනුකරුවන් 08 දෙනෙකු සමග එම ගනුදෙනු සිදුකර තිබූ අතර භාණ්ඩාගාර මිලදී ගැනීම්වලින් ඉහළම ප්‍රතිශතයක් එනම් සියයට 41 ක් මතභේදයකට තුඩු දී තිබූ එක් පෞද්ගලික ආයතනයක් සමග සිදු කර තිබුණි. තවත් සියයට 40 ක් වෙනත් පෞද්ගලික ආයතනයක් සමග සිදු කර තිබුණි. අනෙකුත් ප්‍රාථමික ගනුදෙනුකරුවන් හය දෙනෙකු සමග සිදුකර තිබූ සියලුම මිලදී ගැනීම් සියයට 19 ටත් වඩා අඩු මට්ටමක පැවතිණි.







(උ) 2016 සැප්තැම්බර් 13 වන දින පැවති භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේදී දින 364 කින් කල්පිරෙන බිල්පත් වල මණ්ඩලය රු.මිලියන 4,000 ක් සියයට 10.35 ක ඵලදා අනුපාතයකට ආයෝජනය කර තිබුණි. විකල්ප ආයෝජන අවස්ථා (ණයකර/ස්ථාවර තැන්පත්) පිළිබඳව නිසි අධ්‍යනයකින් තොරව අඩු පොලී අනුපාතයකට ඉහත ආයෝජනය සිදු කර තිබීමෙන් මණ්ඩලයට ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසි අහිමි කරගෙන නොතිබුණි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විණි.

2016 සැප්තැම්බර් 12 දින මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු නියෝගයක් මත ඉහත ආයෝජනය කිරීමට සිදුවූ බවත් එම ආයෝජනය පිළිබඳව පූර්ව අධ්‍යනයක් කිරීමේ අවස්ථාවක් නොමැති වූ බවත් මණ්ඩලයේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පලටුපාන ලේවාය සහිත භූමිය ලංකා ලුණු සමාගමට රජය විසින් පවරා දීමට අදාළ බදු ගිවිසුමේ අංක 09 දරන වගන්තිය අනුව, ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව අදාළ ඉඩම හෝ එහි ගොඩනැගිලි පරිපාලිත සමාගමේ කටයුතු සඳහා හැර වෙනත් කිසිදු කටයුත්තකට භාවිතා කිරීම නොකළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, පරිපාලිත සමාගම විසින් මණ්ඩලයේ ක්‍රීඩා සංගමයට නිවාඩු නිකේතනයක් ඉදිකිරීමට පර්චස් 80 ක් පවරා දී තිබුණි. ක්‍රීඩා සංගමයට එම ඉඩමේ නිවාඩු නිකේතනය ඉදිකිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් 2012 හා 2013 වර්ෂයන්හිදී රු. 3,000,000 ක ණය මුදලක් කිසිදු නීතිමය පදනමකින් තොරව සියයට 10 ක පොලී අනුපාතයකට වාරික 24 කින් පියවීමට ලබාදී තිබුණි.

(ආ) මණ්ඩලය විසින් රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක තැන්පත් කරන චෙක්පත් සඳහා පසු දිනම මුදල් බැර කිරීමේ පහසුකම ලබාදීම වෙනුවෙන් 2006 වර්ෂයේ දී දෙපාර්ශවය අතර ඇතිකරගත් එකඟතාවයකට අනුව මණ්ඩලය විසින් රු.500,000,000 ක මූලික තැන්පතුවක් අදාළ බැංකුවේ පවත්වාගෙන යනු ලැබේ. වාර්ෂිකව කල්පිරෙන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක් ලෙස පවත්වාගෙන යන එම තැන්පතුව සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණ අතර වාර්ෂික පොලී අනුපාතය තීරණය වන ආකාරය ද ගැටළුකාරී වී තිබුණි. අදාළ සේවාව සැපයීම වෙනුවෙන් බැංකුව විසින් මාසිකව රු.100,000 ක් බැගින් අමතර ගාස්තුවක් අයකර තිබූ

අතර දෛනිකව එම ගිණුමේ රු. 5,000,000 ක අවම ශේෂයක් ද පවත්වාගත යුතු විය. එම තැන්පතුවට අදාළ පොලී අනුපාතය 2015/2016 දී සියයට 6.5 ක්ද 2016/2017 දී සියයට 8.9 ක් හා 10.8 ක් ලෙස ලැබී තිබුණි. ඉහත එකඟතාවය හේතුවෙන් එම මුදල් වැඩි ප්‍රතිලාභ ප්‍රතිශතයක් සහිත ආයෝජනයක යෙදවීමෙන් මණ්ඩලයට ලබාගත හැකිව තිබූ මූල්‍ය වාසි අහිමි වී තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් සමාගම් තුනක ණයකරවල සිදු කර තිබූ ලද ආයෝජන වෙනුවෙන් 2006 වර්ෂය දක්වා ලැබිය යුතු රු. 27,497,905 ක පොලී ආදායම එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි. එය අයකර ගැනීමට ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව හෝ අයකරගැනීමට ඇති හැකියාවේ ස්වභාවය හෝ සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ප්‍රකාරව ප්‍රතිපාදනයක් හෝ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ සේවකයන්ට නවාතැන් ගැනීමට මණ්ඩලයේ වියදමින් පවත්වාගෙන යනු ලබන සංචාරක නිවාසවලින් 2016 වර්ෂයේ ලැබූ ශුද්ධ අලාභය රු.2,817,000 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී ලැබූ ශුද්ධ අලාභය රු. 2,938,000 ක් වී තිබීම මණ්ඩලයේ සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම සඳහා පවතින අරමුදල් අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

(ඇ) මණ්ඩලය ඒකක භාර අරමුදල් තුනක සිදුකර ඇති ආයෝජනවල 2014 දෙසැම්බර් 31 දිනට රු. 356,426,847 ක් වූ වෙළෙඳපොළ වටිනාකම 2015 දෙසැම්බර් 31 දින වන විට රු.21,696,000 කින්ද, 2016 දෙසැම්බර් 31 දින වන විට රු. 3,846,000 කින්ද පහත වැටීම නිසා එම ප්‍රමාණයෙන් අලාභයන් සිදුව තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් රු. 25,284,181 ක් ආයෝජනය කරන ලද සමාගම් 03 ක් අතුරින් සමාගම් දෙකක් ඈවරකර තිබූ අතර ඉතිරි සමාගම කඩවුණු පුවරුව (Default Board) යටතේ දක්වා තිබුණි. ඈවරකිරීමට ලක්ව ඇති ආයතන දෙක සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණද, ආයෝජනයන්ගේ වටිනාකම නැවත අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් නිශ්චිත තහවුරුවක් මණ්ඩලයට නොතිබුණි.





(ඉ) වනික් සමාගමේ පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබුණු රු.12,174,382 ක් හා ණයකරවල ආයෝජනය කර තිබුණු රු. 7,450,259 ක් පිළිවෙලින් 2002 හා 2007 වර්ෂවලදී උපලබ්ධි වියයුතුව තිබූ නමුත්, එම මුදල් උපලබ්ධි කර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් මණ්ඩලයට හැකි වී නොතිබුණි.

(ඊ) මණ්ඩලයේ සාමාන්‍ය කොටස්වල ආයෝජනයන්ගේ 2016 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය රු. 12,095,980,000 ක් වූ අතර, 2017 මාර්තු 31 දින වන විට ධාරණ අගය රු. 465,748,000 කින් හෙවත් සියයට 4 කින් පහත වැටී තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ප්‍රධාන විධායක තනතුරක් වන සාමාන්‍යාධිකාරී තනතුර 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුර පුරප්පාඩුව පැවතීම මණ්ඩලයේ පරිපාලන කටයුතුවලට හා ඉහළ කළමනාකරණ අධීක්ෂණයට සෘජු බලපෑමක් සිදු කර තිබුණි. එමෙන්ම මණ්ඩලයේ ආයෝජන කළඹ මෙහෙයවීම හා පාලනයට අවශ්‍ය උපදෙස් ලබාදීමට වරලත් මූල්‍ය උපදේශකයෙකු බඳවා නොගැනීම ප්‍රශස්ත ආයෝජන සම්බන්ධ තීරණ ගැනීමේදී බලපෑමක් ඇති නොවිණි යන්න විගණනයේදි බැහැර කළ නොහැකි විණි. මෙම තත්ත්වය 4.2 අරමුදල් ආයෝජන සම්බන්ධව වූ ඡේදයේ නිරීක්ෂණ වලින්ද වඩාත් තහවුරු වී තිබුණි.

## 4.7 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මණ්ඩලය විසින් සේවාදායක ආයතනවලින් අයකරගෙන තිබූ එකතුව රු. 1,764,995,612 ක් සහ 1996 සිට 2002 කාල පරිච්ඡේදයට අදාළ හඳුනා නොගත් රු.1,228,101 ක දායක මුදල්, අරමුදල් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන තිබුණි. මේ හේතුවෙන් අදාළ සාමාජිකයන්ට තම මුදල් අහිමි වීමේ අවදානමක් පැවතුණි. මෙම මුදල් අප්‍රමාදව සාමාජික ගිණුම්වලට බැර කිරීම සඳහා විශේෂ ඒකකයක් 2016 පෙබරවාරි 10 දින ස්ථාපිත කර තිබුණද 2017

මාර්තු 01 සිට 2017 ජූනි 30 දින දක්වා ඉන් රු. 137,000,000 ක් පමණක් නිරවුල් කර තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබානොගෙන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වන සේවායෝජකයින් වෙනුවෙන් මණ්ඩලය විසින් තාවකාලික ලියාපදිංචි අංක ලබාදී අනුව්‍යාජ (Dummy) සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර එම දායක මුදල් 'XX' නමින් ගිණුමක පවත්වාගෙන යනු ලැබේ. 1984 වර්ෂයේ සිට එලෙස ලියාපදිංචි කරගෙන තිබූ අනුව්‍යාජ සේවායෝජකයින් සංඛ්‍යාව 2017 මැයි 31 දින වනවිට 14,232 ක් වී තිබුණි. ඒ අනුව, අදාළ සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර 'XX' ගිණුමේ 2017 මැයි 31 දිනට පවතින ශේෂය රු. 140,265,923 ක් වන අතර 2016 වර්ෂය තුළදී පමණක් එම සේවායෝජකයින්ගෙන් අයකර ගත් දායක මුදල් හා අධිභාර මුදල් වල වටිනාකම රු. 45,189,980 ක් විය. මෙලෙස අනුව්‍යාජ සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගන්නා සේවායෝජකයින් මණ්ඩලයේ සත්‍ය සේවායෝජකයින් ලෙස ලියාපදිංචි කර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සේවක අර්ථසාධක අරමුදල සමග සම්බන්ධ වී සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව, අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයේ මාසික ගිණුම් පිළිබඳව මාසිකවද, වාර්ෂික ගිණුම, අයවැය, වාර්ෂික වාර්තාව, සංයුක්ත සැළැස්ම පිළිබඳ වාර්ෂිකවද, සභාපති විසින් පවරන ලද විමර්ශනයන් ද කළ යුතු වුවත්, ඒ සම්බන්ධව කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණනය මගින් අරමුදලේ ප්‍රධාන කාර්යභාරය වන අරමුදල් ආයෝජනය හා එම ප්‍රතිලාභ වැනි ක්ෂේත්‍ර ආවරණය කිරීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ ඍජුව විගණන කටයුතු හා සම්බන්ධ වන කාර්ය මණ්ඩලය 34 කට සීමා වී තිබූ අතර ඉන් උපාධි, පූර්ණ හෝ අර්ධ වෘත්තීය සුදුසුකම් ලත්





සංඛ්‍යාව 09 දෙනෙකු විය. 2016 දෙසැම්බර් 31 වන විට රු. 249,089,083,000 ක ශුද්ධ වත්කමක් පවතින ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට ප්‍රමාණවත් සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් නොසිටීම එහි විෂය පථය සීමා වීමට බලපා තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ 2016 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් සැසඳීමේදී ආදායම් ශීර්ෂ අතර සියයට 25 සිට 96 දක්වා වූ විචලනයන් පැවති අවස්ථා 06 ක් නිරීක්ෂණය විය. එහිදී මිල ප්‍රකාශිත කොටස් මත ලාභාංශ හා මුදල් වෙළඳපොල තැන්පත් පොලී පිළිවෙලින් සියයට 96 ක් හා 29 ක් වශයෙන් අයවැයගත ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේ අයවැයගත හා තත්‍ය වියදම් සැසඳීමේදී සියයට 25 ත් සියයට 50 ත් අතර විචලනයන් නිරීක්ෂණය වූ වියදම් අයිතම 16 ක් ද සියයට 50 ත් සියයට 202 ත් අතර විචලනයක් නිරීක්ෂණය වූ අයිතම 13 ක්ද පැවතුණි. එහිදී නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් පොලී පිරිවැය, කාර්යාලීය නඩත්තු හා අවශ්‍යතා, විවිධ වියදම් සහ ගොඩනැගිලි නඩත්තු වියදම් පිළිවෙලින් සියයට 66, සියයට 130, සියයට 71 සහ සියයට 53 බැගින් අයවැයගත ප්‍රමාණයට වඩා වැඩිවී තිබූ අතර මුළු සාමාජික වියදම සියයට 39 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැළකිය යුතු විචලනයන් පැවතීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

මණ්ඩලය විසින් 2016 වර්ෂය වෙනුවෙන් සිදුකර තිබූ රු. 16,252,053 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 5 ක් සම්බන්ධයෙන් විෂය පිළිබඳ විශේෂඥයකු හා රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයකු තාක්ෂණික ඇගයීම් කමිටුව නියෝජනය නොකිරීම, ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල නොකිරීම, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබීම, ලංසු වල වලංගු කාලය සඳහන් නොකිරීම හා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබීම ඇතුළු අඩුපාඩු හේතුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ), 2.8.4, 4.2.2 (අ), 4.3.1, 4.3.2, 5.2.1 (අ), 5.3.10 හා 8.9.1 යන වගන්ති උල්ලංඝණය කර තිබූ බව නිරීක්ෂණය විය.

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

**5.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක නොකිරීම**

මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයාම වන අතර එය මූල්‍ය කටයුතු සම්බන්ධ ආයතනයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිවරයාම විය යුතු බවටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තිය සංශෝධනය කල යුතු බවටත් 2016 අගෝස්තු 26 දිනැති පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී නිර්දේශ කර තිබුණි. එසේ වුවද, 2017 මැයි 31 වන විටත් ඊට අදාළ සංශෝධන සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවූ අවස්ථා පැවතීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | සේවාදායකයින්ගෙන් එකතු කරන මුදල් සාමාජිකයන්ගේ ගිණුම්වලට අප්‍රමාදව බැර නොකිරීම. |
| (ඇ) අරමුදල් කළමනාකරණය | (i) සේවාදායකයින්ගෙන් එකතු කර ගන්නා මුදල් ඉහල සුරක්ෂිතතාවයක් හා වැඩි ප්‍රතිලාභයක් ලැබෙන අයුරින් ආයෝජනය නොකිරීම.<br>(ii) ආයෝජිත අරමුදල් ඇගයීම කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | අයවැයගත ආදායම් හා වියදම් වලට අනුගතව කටයුතු නොකිරීම. |
| (ඉ) අභ්‍යන්තර විගණනය | සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

19

**විගණකාධිපති වාර්තාව 2016 සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම්**

## 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**(අ) ඉදිරි කටයුතු සඳහා සටහන් කර ගතිමි.**

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 16 හි 51 වන වගන්තිය ප්‍රකාරව වාර්ෂිකව වත්කම් ක්ෂය කිරීමේ ක්‍රමය හා අවශේෂ ජීව කාලය වෙනස් කල යුතු බව හැඟෙන්නේ නම් එකී ගැලපීම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 8 ප්‍රකාරව ගිණුම් කරන ඇස්තමේන්තුවේ වෙනසක් ලෙස ගිණුම්ගත කල හැකි බව සඳහන් වේ.

වත්කමක් වසර 25 ක් භාවිතා කිරීම හා එකී භාවිතා කරන වත්කමක් හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරීම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 16 හි 51 වන වගන්තිය අනුව පවත්නා ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීමට හේතුවක් නොවන බව අපගේ නිගමනයයි.

විගණන විමසුමෙහි සඳහන් පිරිවැය රු මිලියන 441 ක් වූ වත්කම් වල 2016/12/31 දිනට ශුද්ධ වටිනාකම රු මිලියන 176 ක් පමණක් වන අතර, එකී වත්කම් වලින් රු මිලියන 54 ක් ඉඩම් හා ගොඩනැගිලි නියෝජනය වන අතර, ශුද්ධ වත්කම් වටිනාකම රු මිලියන 122 ක් වන ඉතිරි වත්කම් මණ්ඩලය විසින් එදිනෙදා භාවිතයට ගන්නා මොටර් රථ, කාර්යාල උපකරණ, ලීබඩු, සවිකිරීම් හා පරිගණක උපාංග නියෝජනය වේ. මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීම සඳහා හීනවන ශේෂ ක්‍රම ප්‍රතිපත්තිය භාවිතා කරන අතර, වත්කමක් භාවිතයට නුසුදුසු යැයි තීරණය කර බැහැර කරන අවස්ථාව තෙක් හීනවන ශේෂය පොත්වල පෙන්නුම් කරයි. ඒ අනුව වත්කම් වල අවශේෂ ආයුකාලය හා වාර්ෂික ක්ෂය කිරීමේ ක්‍රමය වෙනස්කිරීම් අවශ්‍යතාවය මණ්ඩලයට මෙතෙක් පැන නැඟී නැත.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39**

(i) ඔබගේ නිරීක්ෂණ හා එකඟ නොවේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි 61 වන ඡේදය අනුව ආයෝජනයක පිරිවැය සාධාරන මිලට වඩා අඩු අගයක් ගැනීම ආයෝජනයේ ස්ථාවර හානිකරණයක් වුවායැයි (Permanent Impairment) සනාථ කිරීමට එක් සාධකයන් වියහැකි මුත් (May be considered) එය එකම සාධකය නොවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි 61 ඡේදය ප්‍රකාරව, සලකා බලන ආයෝජන වල ඉදිරි ප්‍රතිඵල සඳහා බලපාන තාක්ෂණික කරුණු, වෙළඳපොල තත්වයත්, ආර්ථිකමය සාධකයන්ගේ හා නීතිමය පරිසරයන් ආදි සාධක ඉතා ගැඹුරින් අධ්‍යනය කල යුතුවේ.

මණ්ඩලයේ ආයෝජන විශ්ලේශකයන් විසින් අඛණ්ඩව ආයෝජන සංයුතියේ ඇති සියළු ආයෝජන සම්බන්ධව විස්තරාත්මක අධ්‍යනයක් සිදුකරන අතර වෙළඳපොළ මිල වෙනස්වීම් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම්ද සිදුකරනු ලබයි. 2016 වර්ෂයට අදාලව එසේ ස්ථිර හානිකරනයක් වූවා සේ සලකා ලාභාලාභ ගිණුමට ලියා හැරීමට කිසිඳු ආයෝජනයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කර නොමැත.

එසේ වුවද 2017 වර්ෂයේ ආයෝජන කිහිපයක් එසේ ස්ථාවරව හානිකරණය වුවාසේ සලකා ලාභාලාභ ගිණුමට දැනටමත් ලියාහැර ඇති අතර, 2017 වර්ෂ අවසානයේදී තවත් ආයෝජන කිහිපයක් එසේ ලියාහැරීමට බලාපොරොත්තු වේ. එබැවින් එසේ විධිමත් අධ්‍යනයකින් පසුව ස්ථාවරව හානිකරණය වූවාසේ කළමනාකරණය තීරණය කරන ලැයිස්තුගත ආයෝජන ගිණුම්කරන ප්‍රමිතවල ප්‍රතිපාදන වලට අනුකූලව ගිණුම්ගත කිරීම කරනු ලැබේ.

(ii) ඔබගේ නිරීක්ෂණය හා එකඟවිය නොහැක.

ආයෝජනයන් ස්ථාවර ලෙස හානිකරණය (Permanent Loss of Capital) සැලකීමට අවධානය යොමුකල යුතු අතිවිශාල කරුණු ප්‍රමාණයක් අතුරින් කෙටිකාලිනව කොටසක වෙළඳපොල මිල 20% හෝ 30% ක ප්‍රමාණයක් අතර පහළ යාම සැලැකිල්ලට ගතයුතු එක් කරුණක් වියහැකි මුත් (May be Considered) කොටසක සාධාරණ අගය පහළ යාම මත පමණක් පිහිටා ලැයිස්තුගත කොටස් ආයෝජන ස්ථිර ලෙස හානිකරණය වූවාසේ සැලකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි 59 ඡේදය ප්‍රකාරව නිවැරදි නොවන ප්‍රකාශයකි.

කොළඹ කොටස් හුවමාරුවේ මෑතකාලීන වෙළඳපොළ හැසිරීම දෙස බැලීමේදී බොහෝමයක් ආයෝජන සඳහා සැලකිය යුතු හා දිගුකාලීන වශයෙන් සලකා බැලියයුතු මට්ටමක පවතින ආයෝජන ලෙස නිර්වචනය කල හැකි තත්වයක් දක්නට ලැබේ. එසේ වුවද මෙම කිසිම ආයෝජනයක් මුල්‍ය ආයෝජන ඇගයීම සහ හඳුනාගැනීම සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි 59 වන වගන්තියෙහි සඳහන් පරිදි ආයෝජන ස්ථාවර ලෙස හානිකරණය සඳහා වාසිදායක ලෙස දායක වන ලාභ අඩුවීමක්, කොටසක ඉපයීමේ අඩුවීමක්, ශුද්ධ වත්කම් වල අඩුවීමක් ආදී මෙවැනි වෙනත් කිසිම අරමුණු සහගත සාක්ෂියක් පෙන්නුම් කර නොමැත.

තවද, විගණන විමසුම සිදුකරන අවස්ථාවේදි ලැයිස්තුගත ආයෝජනවල වෙළඳපොල මිල ගණන් පහළ යාමක් පෙන්නුම්කලද මේ වනවිට එම සමහර ආයෝජන පිරිවැය ඉක්මවා ප්‍රාග්ධන ලාභ ලබන තත්වයට පත්වී ඇති අතර, සමහර ආයෝජන වල එම වෙනස්වීමේ ප්‍රතිශතය සෑහෙන දුරට සුභදායි ලෙස වර්ධනය වී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 ඡේද අංක 59 ප්‍රකාරව වත්කමක් හෝ වත්කම් කාණ්ඩයක් හානිකරණය වූවාසේ සැලකීමට පහත සඳහන් කරුණු කෙරෙහි විස්තරාත්මක අධ්‍යනයක් හා විශ්ලේෂණයක් කලයුතු වේ.

මුල්‍ය වත්කමක මූලික හඳුනාගැනීමෙන් පසුව ඇතිවන සිදුවීම් එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස හානිකරනයට ලක්විය හැකි අරමුණුගත සාක්ෂි ඇතිනම් පමණක් එම අලාභදායක සිදුවීම් වලින් විශ්වාසනීය ලෙස ඇස්තමේන්තුගත කරන ලද මූලය වත්කමේ හෝ මුල්‍ය වත්කම් කාණ්ඩයක ඇස්තමේන්තුගත ආනාගත මුදල් ප්‍රවාහ වලට බලපෑමක් ඇත්නම්, එම මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය හානිකරණය කිරීමට සහ හානිකරණ අලාභ දැරීමට හැකිය. හානිකරණයට හේතු විය හැකි තනි, වෙන්වූ සිදුවීම් හඳුනාගැනීමට නොහැකි විය හැකිය. සාමුහික සිදුවීමක් (Combined Event) හෝ විවිධ සිදුවීම් හානිකරණයට හේතු විය හැකිය. අනාගතයේදී ඇතිවන සිදුවීමක පූර්ව ප්‍රතිඵලයක් ලෙස බලාපොරොත්තුවන අලාභ එය ඇතිවීමට ඇති හැකියාව කොතරම් ආසන්න වුවද හඳුනා නොගනී.

මූල්‍ය වත්කමක් හෝ සමූහ මූල්‍ය වත්කම් හානිකරණයට භාවිත කරගන්නා අරමුණුගත සාක්ෂි වල ඇතුලත් නිරීක්ෂණ දත්ත පහත සඳහන් අලාභ සහගත සිදුවීම් වලදී වත්කම් දරන්නාගේ අවධානයට යොමු විය යුතුය.

(අ) නිකුත් කරන්නාගේ හෝ වගකීම දරන්නාගේ සැලැකිය යුතු මූල්‍ය දුෂ්කරතාවයක්

(ආ) මූලික මුදල හෝ පොළිය ගෙවීම පැහැර හැරීම වැනි ගිවිසුමක් කඩ කිරීම

(ඇ) දීමනාකරු විසින් වෙනත් ආකාරයකින් සලකා බලනු නොබලන ආර්ථික හා නීතිමය හේතුමත ණය ගැණුම්කරුට ඇතිවන මූල්‍ය දුෂ්කරතා මත ප්‍රදානය කරනු ලබන සහන

(ඈ) ණය ගැණුම්කරු බුන්වත් වීමට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීමට ඇති හැකියාව

(ඉ) මූල්‍ය දුෂ්කරතා නිසා මූල්‍ය වත්කම් සඳහා ක්‍රියාකාරී වෙළඳපොලක් දැකගත නොහැකිවීම

(ඊ) සමූහය තුළ ඇතුලත් එක් එක් මූල්‍ය වත්කම් වල අඩුවීම මෙතෙක් හඳුනාගත නොහැකි වුවද, පහත දේ ඇතුලත්ව නිරීක්ෂණය කල හැකි දත්ත මත පෙන්නුම් කරන සමූහ මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ගණනය කල හැකි අඩුවීමක්,

(i) සමූහය තුළ සිටින ණය ගැණුම්කරුවන්ගේ ගෙවීම් තත්වයේ ඇතිවන අහිතකර වෙනස්වීම්ක් (උදා:
ප්‍රමාදවී ගෙවීම් ඉහළ යාම හෝ නියමිත ණය සීමාවට ලඟාවී ඇති මාසික අවම ගාස්තුව ගෙවමින් සිටින පවතින ණය කාඩ්පත් හිමියන්)

(ii) සමූහය තුළ ඇති වත්කම් මත පැහැර හැරීමට ජාතික හෝ පලාත් ආර්ථික තත්වයේ සහ සම්බන්ධතාවය
(උදා: ණයගැණුම්කරුගේ භූගෝලිය ප්‍රදේශය තුල සිදුවන සේවා වියුක්ත අනුපාතයේ ඇතිවන වැඩිවීම, එම ප්‍රදේශ වල උකස් දේපල වල මිල ගණන් වල අඩුවීම, තෙල් නිශ්පාදකයන්ගේ ණය දේපල සඳහා වන තෙල් මිළ ගණන් වල අඩුවීම හෝ සමූහය තුල

සිටින ණය ගැනුම්කරුවන්ට බලාපාන කර්මාන්තය තුල සිදුවන අහිතකර වෙනස්කම්)

තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි 61 ඡේදයෙහි පරිදි පරිච්ඡේද 59 සඳහන් අවස්ථා වලට අමතරව කොටස් ආයෝජන වල පිරිවැය නැවත අයකර ගතහැකි නොවන මට්ටමේ අහිතකර බලපෑමක් ඇතිවන ලෙස තාක්ෂණික වෙළඳපොල ආර්ථික හෝ නීතිමය පරිසරය තුල සිදුවන සැලකිය යුතු වෙනස්කම් සහිත තොරතුරු වෙළඳපොල ආයෝජන හානිකරණය සඳහා වන අරමුණුගත සාක්ෂි ලෙස දැක්විය හැකිය.

කෙසේ වුවත්, ආයෝජන සංයුතියේ ඇති ඉහත සඳහන් කරන ලද බොහෝමයක් සාධක සනාථ වන පහත සඳහන් ආයෝජන ඉවත්කිරීමට 2017 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදි.

| ආයතනය | කොටස් ගණන | මුදල රු. | විකුණුම් මිල රු. | අලාභය රු. |
|---|---|---|---|---|
| පී සී හවුස් | 188,500 | 113,280 | 18,668 | 94,611 |
| ද ෆිනෑන්ස් | 30,600 | 306,000 | 156,385 | 149,614 |
| බ්‍රවුන්ස් ඉන්වෙස්මන්ට් ඉන්වෙස්මන්ට්ස් | 59,400 | 142,560 | 105,722 | 36,837 |
| බිලූ ඩයමන්ඩ් | 52 | 182 | 71 | 110 |
| පාම් ගාර්ඩන් | 49 | 3,062 | 1,497 | 1,565 |
| **මුළු අලාභය** | | | | **282,738** |

ඉහත සඳහන් ස්ථිර ලෙස හානිකරණය ලක්වූ කොටස් නිසා ලාභයට සිදුවිය හැකිව තිබූ උපරිම අවාසිදායක බලපෑම රු 282,738 ක් පමණ වේ.

එබැවින් විගණන විමසුමෙහි සඳහන් ආයෝජන වලින් ඉහත සඳහන් ආයතන 5 හි ආයෝජන, ස්ථාවර ලෙස හානිකරණය වුවාසේ සලකා ලාභාලාභ ගිණුමට කපා හැරීමටද, ඉතිරි ආයෝජන වල මිල වෙනස්වීම විස්තීරණ ලාභාලාභ ගිණුමෙහි මිළ වෙනස් වීමක් ලෙස දක්වා ඇත.

### 2.3.2 පැහැදිලි නොකල වෙනස්කම්

මණ්ඩලයේ 2016/2017 තක්සේරු වර්ෂය සඳහා සකස්කරනලද බදු වාර්තාවට අනුව 2016 දෙසැම්බර් 31 දිනට දළ බදුබැදියාව රු2,287,404,225 ක් වුවත් එය අදායම් ප්‍රකාශනයේ රු2,394,498,000 ක් ලෙස දක්වා තිබූ අගය තුළ වෙළඳපොල ආදායම් ලැබීමේදි අඩු කරන ලද රඳවාගත් බදුවල පිරිවැය අන්තර්ගත වේ. එම අගය රු107,093,775 කි. ආදායම් බදු වාර්තාව අනුව බදු බැඳියාව හා මූල්‍ය තත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු බදු බැඳියාව අතර, වෙනස වන රු43,663,000 ක් අන්තර් ගතවන්නේ 2016 ට අදාලව 2017 වර්ෂයේ ලැබෙන මිල ප්‍රකාශිත ණයකර පොළියෙන් හා ස්ථාවර තැන්පත් පොළියෙන් ප්‍රභවයේදී අඩුකරනු ලබන බදුවලට අදාල උපචිත බදුවේ.

### 2.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(i) මණ්ඩලය සතු නවම් මාවතෙහි පිහිටි ඉඩම රජයේ තක්සේරුකරු විසින් ප්‍රත්‍යාගණනය කල අතර, එකී තක්සේරු වාර්තාව ලබාදිම සඳහා රජයේ තක්සේරුකරු විසින් අයකල ගාස්තුව ඉතා ඉහළ අගයක් බැවින්, එම ගාස්තුව අඩුකර දෙනමෙන් අදාල ආයතන වලින් ඉල්ලීමක් කර ඇත. එකී වාර්තාව ලබාගැනීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදුකරමින් පවතී.

තවද, ආයෝජන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මෙම ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවූ ලාභය AFS හි සංචිතයක් ලෙස ගිණුම්ගත කර තිබුණද, 2016 වර්ෂයේ සිට නවම් මාවත ඉඩමෙහි ප්‍රත්‍යාගණන ලාභය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 ප්‍රකාරව ලාභාලාභ ගිණුමට මාරු කරන ලදි.

(ii) භාණ්ඩාගාර බැඳුම්කර වල ධාරණ අගය (Carrying Cost) ගණනය කිරීමේදි සිදුවී ඇති ගණිතමය දෝෂයකි. එය නිවැරදි කර ඇත. එකී නිවැරදි කිරිම සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 4.4.1 (2) යටතේ හෙලිදරව් කිරීමක්ද සිදුකර ඇත. තවද, සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර වලින් උපලබ්ධිවූ ආදායම නිවැරදිව ගණනය කර තිබීමට මෙකී ගැලපීම නිවැරදි බව සනාථ කිරීමට හොඳම සාක්ෂියක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2011 වර්ෂයට පෙර වර්ෂවලට අදාල පහ වසර සමතුන්ට ගෙවිය යුතු ලෙස සංශෝධනය විය යුතුය.

2009 වර්ෂය දක්වා පහ වසර ශිෂ්‍යත්ව මුදල් ගෙවනු ලැබුවේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගිනි. ඒ අනුව බැංකුවට අදාල ශිෂ්‍යත්ව මුදල් ලබාගැනිමට ඉදිරිපත් වී නැති ශිෂ්‍යත්ව ලාභින්ගේ මුදල් නැවත බැංකුව විසින් අප වෙත එවා ඇත. එම ශිෂ්‍යත්ව ලාභින් හඳුනාගෙන 2017.11.30 දිනට 16 දෙනෙකු සඳහා රුපියල් 263,324.42 ක මුදලක් ගෙවා ඇත. තවද දරු දැරියන් 25 දෙනෙකු හඳුනාගෙන ඒ සඳහා රුපියල් 404,953.75 ක මුදලක් ගෙවීම් සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. ඒ අනුව ඉතිරි දරුවන් 83 දෙනා සඳහා ලියාපදිංචි තෑපැලෙන් සොයාගන්නා ලදි. නව ලිපිනයන් වෙත ලිපි තැපැල් කර යවා ඇත. ඔවුන් ඉතිරිපත්වූ විගස අදාල මුදල් ඔවුන් වෙත ගෙවිමට පියවර ගනු ඇත.

(ආ) හිමිකම් නොපාන මරණ ප්‍රතිලාභ ගිණුමේ 2016.12.31 දිනට පැවති ශේෂය රු.9,992,461.53 කි. (ප්‍රතිලාභ අයදුම්කරුවන් - 842) සාමාජිකයින්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම් ලාභීන් සිටින බවට තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම් ලාභීන් සියළු දෙනාම එකවර ඉදිරිපත් නොවීම සහ ඇතැම් අයට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු (සහතිකපත් කඩිනමින් ඉදිරිපත් නොකිරීම) ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවයන් නිසා, ඔවුන්ගේ කොටස් , මණ්ඩල ගිණුමේ රඳවාගෙන, ලේඛණ ඉදිරිපත් කර ඇති අයගේ හිමිකම් කොටස් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කිරීම වර්ථමානයේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය වේ. ඒ අනුව 2017 ජනවාරි සිට 2017 ඔක්තෝම්බර් මස දක්වා මරණ ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා රු.680,749.93 ක මුදලක් හිමිකරුවන් 31 දෙනෙකු වෙත ගෙවා ඇති අතර, 2017.10.31 දිනට හිමිකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම රු. 9,311,711.60 ක් වේ. (මරණ ප්‍රතිලාභ අයදුම්පත් 811)

ආපසු එවන ලද ප්‍රතිලාභ (Returned Benefits – Slips) ගිණුමේ 2016.12.31 දිනට ශේෂය රු.16,087,267.34 කි. (ප්‍රතිලාභීන් 1274) මෙම සාමාජිකයින්ට හිමි ප්‍රතිලාභ මුදල් අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත යවා ඇතත්, එම ඉල්ලුම්කරුවන්ගේ බැංකු ගිණුම් විස්තර පැවති දෝෂ සහිත භාවය නිසා අදාල බැංකු විසින් හරවා එවා ඇති මුදල මෙම ගිණුමට ගිණුම්ගතවී ඉහත මුදල සැකසී ඇත.

මෙම ප්‍රතිලාභ අයදුම්කරුවන් අතුරින්, 2017 ජනවාරි මස සිට 2017 ඔක්තෝම්බර් මාසය දක්වා ප්‍රතිලාභ හිමිකරුවන් 34 දෙනෙකු විසින් ඉල්ලුම් කර ඇති රු. 5,026,562.89 ක මුදල් ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති අතර, 2017.10.31 දිනට ගෙවිමට ඇති වගකීමේ වටිනාකම රු.11,060,704.45 ක් වේ. (ප්‍රතිලාභීන් 960)

ඉල්ලුම් නොකල ප්‍රතිලාභ ගිණුමේ 2016.12.31 දිනට ශේෂය රු. 5,310,499.29 කි. (ප්‍රතිලාභීන් 1026) අන්තර් බැංකු ගෙවිම් ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවිම් කිරීමට ගිණුම් විස්තර නොමැති ප්‍රතිලාභ අයදුම්කරුවන් 1026 දෙනෙකුවෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකල චෙක්පත්, එම ප්‍රතිලාභ, අයදුම්කරුවන් බැංකුගත නොකිරීම හේතුවෙන් ඉල්ලුම් නොකල ප්‍රතිලාභ ගිණුමේ ශේෂයෙන් පෙන්නුම් කෙරේ.

මෙම ප්‍රතිලාභ අයදුම්කරුවන් 1026 දෙනා අතරින් ප්‍රතිලාභීන් 68 දෙනෙකුට 2017 ජනවාරි මස සිට 2017 ඔක්තෝම්බර් මාසය දක්වා රු259,650.53 ක් මුදලක් නැවත ගෙවිම් කර ඇති අතර නොගෙවූ ප්‍රතිලාභීන්ට තවදුරටත් 2017.10.31 දිනට ගෙවිමට ඇති වටිනාකම රු5,050,848.76 ක් වේ. (ප්‍රතිලාභීන් 958)

2015.12.09 දින පැවති කළමණාකරන කමිටු රැස්වීමේදී එළඹි තීරණයකට අනුව 2001 සිට 2005 දක්වා මෙම ලෙජර්වල පවතින ගිණුම් ශේෂයන් අදාල සාමාජිකයන්ගේ සාමාජික ගිණුම් සක්‍රිය කර ඒ ඒ ගිණුම් යාවත්කාලීන කිරීමට ක්‍රියාකර එම වටිනාකම් ලෙජරයේ ඇති සාමාජික ගිණුමට මාරුකිරීමට පියවර ගනු ඇත.

## 2.5. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(i) සාප්පු හා කාර්යාල සේවක පමන මණ්ඩලයට අදාල වූවත් සේවකයින්ට මණ්ඩලය ආරම්භයේ සිටම නිවාඩු ලබාදී ඇත්තේ ආයතන සංග්‍රහය සහ සාප්පු හා කාර්යාල සේවක පනත යන දෙකම පදනම් කරගෙන වේ. මේ සම්බන්ධයෙන් ලංකා හාම්පුතුන්ගේ සංගමයේ නිර්දේශයක් අප විසින් ලබාගත් අතර ඔවුන්ගේ නිර්දේශය වී තිබුනේ එසේ භුක්තිවිඳි වරප්‍රසාදයන් අඩුකිරීමට යාමෙන් සේවකයන් තුළ කාර්මික සාමය බිඳවැටීමට හැකි බවය. ඔවුන්ගේ නිර්දේශයේ පිටපතක් මීට අමුණා ඇත.

(ii) අතිකාල ගෙවීම් සිදුකරනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතෙහි විධි විධාන අනුව වේ.

(iii) මණ්ඩලයේ සේවකයින්ට අතිකාල සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතෙහි විධි විධාන අනුව සහ කර්මාන්තයේ පවතින පරිචය අනුවය.

# 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

2.3.1 (ඇ) (ii) යටතේ විස්තරාත්මකව දක්වා ඇති පරිදි මුල්‍ය වත්කම් වල ස්ථාවර හානිකරනයන්ගේ (Permanent Imparement) සිදුවී ඇති බවට නිගමනයන් කිරීම සිදුකර නොමැති නිසා 2016 වර්ෂයේ ගිණුම්වල සඳහන් කර ඇති මුල්‍ය ප්‍රතිඵල නිවැරදි වේ.

## 3.2 විග්‍රහාත්මක මුල්‍ය සමාලෝචනය

(අ) ඉහත 2.3.1 ඇ (ii) යටතේ සවිස්තරාත්මකව පෙන්වාදී ඇති පරිදි දිගුකාලින ආයෝජන වල හානිකරණ අගය රු. 282,738 ක් පමණක් බැගින් හා 9% ප්‍රමාණයක් පොළි හා ලාභාංශ ගැලපීමෙන් පසු ද්‍රවශීල සමුච්චිත වල (Revenue Reserve) ඉදිරියට ගෙන ගිය අගය රු. 3,449,498,000 බැවින් 2016 වර්ෂය සඳහා 9% ක් පොළි හා ලාභාංශ ප්‍රකාශ කිරීම මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි අවාසි සහගත තත්වයක් පැන නොනඟී.

(ආ) ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ.

(ඇ) ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ.

(ඈ) ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. එසේ වුවද, අරමුදලේ වර්ධනය වැඩිවීමේ වේගයෙන්ම, මණ්ඩලයේ ආදායම් වර්ධනය විය යුතු යැයි නිගමනයට එළැඹිය නොහැක. මන්දයත් අරමුදලේ ආදායම් වර්ධනය තීරණය වනුයේ දැනටමත් සිදුකර ඇති ආයෝජනවල ඵලදාව නිසා වන අතර, වර්ෂයක් ඇතුලත වර්ධනවූ සාමාජික අරමුදලේ කොටසින් පමණක් ආදායමට සැලකිය යුතු බලපෑමක් සිදුකල නොහැක.

## 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. අදාල නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය සියලු කටයුතු මණ්ඩලයේ නීති අංශය මගින් සිදුකරමින් පවතී.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

(අ) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොලෙහි 62% ක් පමණ අසංවිධිත අංශය නියෝජනය කරන අතර, ඔවුන් වැඩි දෙනා ගෘහස්ථ, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබයි. තවද, ජාතික ශිල්ප සභාව ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩ සටහන යටතේද ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් පොළි රහිතව කුඩා ව්‍යාපාර සඳහා ණය ලබාදීමට තෝරා ගනු ලබන කණ්ඩායම් එක් එක් ග්‍රාම නිලධාරි වසමකින් දැනුවත් කිරීමටද, ඒ තුළින් බඳවා ගැනිමට දැනටමත් විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. සේවායෝජකයකු යටතේ නොවන මෙම කණ්ඩායම් දායක මුදල් ගෙවීම් කලයුතු වන්නේ ඔවුන් විසින්ම බැවින් සාමාජිකත්වය ලබා ගැනිමට අඩු ප්‍රවණතාවයක් දක්වයි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට සාපේක්ෂව වැඩි ප්‍රතිලාභයන් ගෙවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඔවුන් විසින් 94% ක් පමණ වන ස්ථාවර ආදායම් ආයෝජනයෙන් (Fixed Income Secrurities) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට වඩා, වාර්ෂිකව ඉපයීමක් ලබන බැවිනි.

(i) සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවනු ලබනුයේ විශේෂ අවස්ථා හැරුණුවිට කාන්තාවන්ට වයස අවුරුදු 50 සම්පූර්ණ වු විට හා පිරිමි පාර්ශවයට වයස අවුරුදු 55 සම්පූර්ණ වූ විටය. ඒ අනුව සේවක අර්ථසාධක අරමුදලේ අරමුදල් දිගුකාලීන ආයෝජන වෙත යොමුකල හැක. නමුත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයන්ට වර්ෂ 5 න් 5 ට ප්‍රතිලාභ ලබාගැනිමේ හැකියාව ඇති නිසා ආයෝජන තීරණ ගැනිමේදි කෙටිකාලීන ද්‍රවශීලතාවය පිළිබඳ වඩා සැලකිල්ලට ගතයුතු වේ. ඔබ දන්නා පරිදි දේශිය මුල්‍ය වෙළඳපොලේ දිගුකාලීන ආයෝජන සඳහා වැඩි පොළි අනුපාතයක් ලබාදෙන අතර, මධ්‍යකාලීන ආයෝජන සඳහා පොළි අනුපාතයට සාපේක්ෂව පහළ අගයක් ගනී. එකී දිගුකාලීන අයෝජන නිසා ලැබෙන වාසිදායක පොළි අනුපාතයන්ගේ බලපෑම සේවක අර්ථසාධක අරමුදලට ලැබී ඇත.

තවද, 2015 ආරම්භය වනතෙක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ද්වීතීක වෙළඳපොලේ භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනිමට අවස්ථාවන් නොතිබුනු අතර, භාණ්ඩාගාර බැඳුම්කර ද්වීතික වෙළඳපොලේ විකිණිමටද මේ වන තෙක් සිදුකිරීමට අනුමැතිය නොමැත. එකී කරුණු නිසා මුල්‍ය වෙළඳපොල පවතින අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගැනිමේ හැකියාව සීමාවී ඇත.

තවද, දැනට මණ්ඩලය විසින් අරමුදලේ සාමාජිකයන්ට ප්‍රතිලාභ ක්‍රම 10 ක් හඳුන්වාදී ඇති අතර, මේ සඳහා වාර්ෂිකව රු මිලයන 600 ක් පමණ පිරිවැයක්ද දරණු ලැබේ. මෙවැනි ප්‍රතිලාභ ක්‍රමවේදයන් සේවක අර්ථසාධක අරමුදලට නොමැති නිසා එය සෘජුවම ඔවුන්ගේ ලාභයට වාසිදායක ලෙස බලපායි.

ඉහත දක්වා ඇති මූලික කරුණු නිසා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට සාපේක්ෂව සේවක අර්ථසාධක අරමුදල 2016 වර්ෂයේදී 10.5% ක ප්‍රතිලාභයක් ලබාදී ඇත. නුදුරු අනාගතයේදී ආයෝජන වලට උපරිම ප්‍රතිලාභයක් ලබාගෙන සාමාජිකයන්හට ඉහළ ප්‍රතිලාභයක් ලබාදීමට බලාපොරොත්තු වේ.

(ii) මෙම නිරීක්ෂණය හා එකඟවිය නොහැක. ලාභාංශ සමාකාර සංචිතයක් පවත්වාගෙන යාමේ පරම අරමුණ වනුයේ ආයතනයේ ලාභ අඩු කාල වලදී ගෙවනු ලබන ලාභාංශ ප්‍රතිශතය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ආයතනයේ අනිකුත් මෙහෙයුම් කටයුතු වලට බාධා නොවන ආකාරයෙන් අරමුදල් සම්පාදනය කර ගැනීමයි. ඒ අනුව අවශ්‍ය අවස්ථා වලදී සාමාජිකයන්ට සාධාරන ලාභාංශ ප්‍රතිශතයක් ලබාදීම සඳහා මෙම අරමුදල් භාවිතා කර ඇත.

එසේම ලාභාංශ ප්‍රකාශ කිරීම සඳහා රඳවා ගත් ලාභාංශ හෝ ලාභාංශ සමාකාර සංචිතය යොදා ගැනීමට 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතෙන් හෝ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් වලින් කිසිඳු බාධාවත් නොමැති බවද දැන්වීමට කැමැත්තෙමි.

එසේම පසුගිය වර්ෂ 02 හිදි සාමාජිකයන් සඳහා ගෙවූ පොළි හා ලාභාංශ වලට සාපේක්ෂව ලාභාංශ සමකිරීමේ සංචිතයේ සහ රඳවාගත් ලාභ උපයෝගි කරගත් ප්‍රමාණයන්ගේ ප්‍රතිශතයන් පහත දක්වා ඇත.

| වර්ෂය | ගෙවූ ලාභාංශය හා පොළී | පොළී හා ලාභාංශ සඳහා අරමුදල් සොයාගැනීම | | ප්‍රතිශතය (උපයාගත් ලාභ වලින්) | ප්‍රතිශතය (සංචිතය) |
|---|---|---|---|---|---|
| | | වර්ෂයේ උපයාගන්නා ලද ලාභ වලින් (රු. මිලියන) | සංචිතයෙන් (රු. මිලියන) | | |
| 2013 | 15,841 | 15,498 | 343 | 9.783 | 0.217 |
| 2014 | 17,624 | 17,109 | 515 | 9.708 | 0.292 |

මේ අනුව පෙනී යන්නේ ගෙවූ ලාභාංශ වලට සාපේක්ෂව ලාභාංශ සමාකාර සංචිතයෙන් පසුගිය වර්ෂ දෙකෙහිදීම ලබාගෙන ඇත්තේ ඉතාමත් සුළු ප්‍රතිශතයන් බැවින් ඔබගේ නිරීක්ෂණයේ සඳහන් පරිදි ලාභාංශ ගෙවීම සඳහා කිසිම විටක අහිතකර බලපෑමක් ඇති නොකරන බවයි.

ඒ අනුව සමාලෝචිත වර්ෂවලදී ලාභාංශ ගෙවීම සඳහා, ඒ සඳහාම පෙර වර්ෂවල ඉපයූ ලාභයෙන් ඇතිකරන ලද ලාභාංශ සමාකාර සංචිතයෙන් 0.2% ක් පමණවන ප්‍රමාණාත්මක නොවන (Immaterial) ප්‍රමාණයක් ලබාගැනීම සාමාජිකයන්ගේ අනාගත ඉපයීම් වලට කිසිඳු බලපෑමක් ඇති නොවේ.

(iii) 2014 වර්ෂයේ පොලී හා ලාභාංශ මූල්‍යනය කිරීමට අවශ්‍ය ප්‍රශස්ථ අරමුදල් ප්‍රමාණයක් ලාභාංශ සමකිරීමේ සංචිතයෙන් මාරු කරන ලදි.

(ඈ) සක්‍රිය සාමාජිකයන්ට මණ්ඩලයෙන් දෙනු ලබන සුභසාධන ප්‍රතිලාභ මෙහෙයුම් වියදම් සමඟ ගැලපුම් කිරීම යෝග්‍ය නොවේ. මෙම වටිනාකම සාමාජිකයන්ට දෙනු ලබන ප්‍රතිලාභයකි.

(ඇ) 2016 වර්ෂයේ ෂක්ෂ් ආයතනයේ මූල්‍ය හා තාක්ෂණ ආධාරයෙන් වර්තමානයට ගැලපෙන පරිදි පරිගණක පද්ධතියක් ලබාදීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට එළැඹ ඇති අතර, ඒ අනුව පරිගණක පද්ධතිය නැවත නිර්මාණය කිරීමේ (Re-engineering) ක්‍රියාවලියේ කටයුතු ආරම්භ කරන ලදි. අවුරුදු 10 ක් පමණ පැරණි දැනට පවතින පරිගණක පද්ධතිය කුමන ආකාරයෙන් වෙනස් කලයුතුද යන්න ICTA ආයතනය සිදුකරන ව්‍යාපාර ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමේ අධ්‍යනයෙන් (Business Process Improvement Study) පසුව සිදු කිරීමට කළමනාකාරිත්වය තීරණය කරන ලදි. එබැවින්, පරිගණක පද්ධතියේ ප්‍රතිව්‍යුහගත කිරීම හා වැඩිදියුණු කිරීම 2016 වර්ෂයේදී සිදුකිරීමට නොහැකි විය.

එසේ වුවද, 2017/2018 වර්ෂවලදී නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සියළුම පාර්ශවකරුවන්ට (Stake Holders) පහසුව සැලසෙන පරිදි රජයේ පූර්ණ අනුග්‍රහය ඇති පරිගණක පද්ධතියක් හඳුන්වාදීමට වැඩකටයුතු සුදානම්කර ඇත.

තවද ආපදා වලක්වා ගැනීමේ සැලසුම 2016 වර්ෂය තුලදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූවත් 2018 වර්ෂයේදී නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි එම ආපදා වලක්වා ගැනීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩකටයුතු 2017 දී ආරම්භ කර ඇත.

## 4.2 අරමුදල් ආයෝජනය

2015-05-20 දින එවකට සිටි මුදල් නියෝජ්‍ය ඇමති ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා මණ්ඩලයට පැමිණි අවස්ථාවේ රුපියල් බිලියන 200කට වඩා ආයෝජනයන් ඇති ආයතනයක් වන අප මණ්ඩලයට උපදෙස් ගැනීම සදහා CFA සුදුසුකම් සහිත නිලධාරියකු නොමැති වීම අඩුපාඩුවක් බවත්, ඒ සදහා වහාම ඝත් සුදුසුකම් සහිත පුද්ගලයකුගේ සේවය ලබා ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී.

ඒ අනුව මූලික පියවරක් වශයෙන් NDB Wealth Management ආයතනයේ ඝත් සුදුසුකම් සහිත උපදේශකයකුගේ සේවය ලබා ගැනීමට තීරණය කරන ලද අතර ඒ සදහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි.

මාසිකව රු 25,000/- ක මුදලකට ඔවුන්ගේ සේවය ලබාදීමට ඔවුන් විසින් යෝජනා කරන ලදි. එසේ වුවද ගිවිසුමේ සමහර කරුණු සදහා දෙපාර්ශවයට එකගවීමට නොහැකි වූ බැවින් ගිවිසුම අත්සන් කිරීමට නොහැකි විය.

ආයෝජක උපදේශකයන්ගේ සේවය ලබා ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබූ පසු ඔවුන්ගේ සේවය ලබා ගැනීම 2015-07-27 දින සිට ආරම්භ කරන ලදි. පසුව සකස් කරන ලද ගිවිසුමෙන් ඔවුන්ගේ මාසික ගාස්තුව රු 75,000/- ක් ලෙසට ඔවුන් විසින් ම වෙනස් කර තිබූ නමුත් එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු නොකරන ලදී.

රජයේ සුරැකුම්පත් මිළදී ගැනීම සම්බන්ධව ආයෝජන අංශයේ අත්දැකීම් හා පළපුරුදු සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇති එබැවින් උපදේශකයන්ගෙන් ලැබුණු උපදෙස් ද යොදා ගනිමින් මෙම කාලය තුළ රජයේ සුරැකුම්පත් මිළදී ගන්නා ලදී.

තවද Secondary Market හි කටයුතු කිරීම පිළිබදව උපදේශකයන්ගේ අත්දැකීම් හා දැනුම මණ්ඩලයේ නිලධාරීන් විසින් ප්‍රයෝජනයට ගන්නා ලදී. ආයෝජන උපදේශකයන් වෙත ලබා දෙන ලද. මණ්ඩලය සම්බන්ධ එකම තොරතුර වූයේ ආයෝජනය කිරීමට ඇති මුදල් ප්‍රමාණය පමණක් වන අතර, වෙනත් කිසිම තොරතුරක් ඔවුන් වෙත ලබා නොදුනි.

ප්‍රාථමික වෙළුදුන් විසින් දෙනු ලබන පොලි අනුපාතයන් අප මණ්ඩලයට පමණක් දෙනු ලබන විශේෂ වූ රහස් පොලී අනුපාත නොවේ. තවද, ආයෝජන උපදේශකයන්ගේ උපදෙස් ඒ ආකාරයෙන්ම පිළිගැනීමට අප බැදී නොමැති අතර, මෙම අංශයේ නිලධාරීන්ගේ අත්දැකීම් හා මතය අනුව සංකලනය වූ තීරණ ගන්නා අවස්ථාද ඇත. වර්තමානයේදි ද්වීතියික වෙළඳපොලෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී නොගන්නා බැවින් ආයෝජන උපදේශකයන්ගේ සේවය ලබා නොගනී.

(අ) (ආ) සහ (ඇ)

ඉහත සදහන් 4.2 (අ) 4.2 (ආ) සහ 4.2 (ඇ) විගණන විමසුම් වලින් ප්‍රධාන වශයෙන් විමසා ඇත්තේ යම් යම් දිනවලදී ඉදිරිපත් කරන ලද ලංසු වලට අදාල පොලී අනුපාත ඉහළ බැවින් මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථා සහ ඉන් පසු එම මුදල් යොදවා ද්වීතියික වෙළදපොලෙන් බැදුම්කර මිළදී ගැනීමේදී අලාභ සිදු වී ඇති බවයි සෑම වෙන්දේසියකදීම ඉතා සාර්ථකව ඉහළ පොලී අනුපාතයන්ට ආයෝජනය කිරීම ප්‍රායෝගිකව කල නොහැකි සමහර අවස්ථා වලදී අසාර්ථකවීම් සිදු වුවද සමස්තයක් ලෙස වසර තුල සාමාන්‍යයෙන් බරතබන ලද සාමාන්‍ය ඉපැයුම් අනුපාතයට (W.A.Y) වඩා වැඩි අනුපාතයකට ආයෝජනය කිරීම සාර්ථක තත්වයයි. ඒ අනුව අප විසින් ඉදිරිපත් කරන ලද ලංසු (W.A.Y) එකට වෙන්දේසියෙන් මිලදී ගත්තේ නම් එම මුදල්වලට ලැබෙන පොලී අනුපාතය 11.75% කී. නමුත් සමස්ථයක් ලෙස ගත් විට 12ග02ක පොලී අනුපාතයක් අප රදවාගෙන ඇති බව (ඇමුණුම ෂ) මගින් පැහැදිලි වේ.

තවද 4.2 (ඇ) හි සදහන් කර ඇති වෙළදපොල අනුපාතයන්ට අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය හා සේවක අර්ථසාධක අරමුදල යන ආයතන දෙකම වෙළදපොල අනුපාතයට වඩා වැඩියෙන් ලංසු ඉදිරිපත් කර ඇති අතර සමහර අවස්ථාවලදි සේවක අර්ථසාධක අරමුදලට වඩා වැඩියෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ලංසු ඉදිරිපත් කර සාර්ථක වූ අවස්ථා ද ඇත. සේවක අර්ථසාධක අරමුදල අපට වඩා යම් ප්‍රතිශතයක් අඩුවෙන් ලංසු ඉදිරිපත් කර ඇත්තේ ඔවුන් සතුව අපට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් එම අවස්ථාවේ ආයෝජනය කිරීමට තිබුණු බැවින් යැයි හැඟේ. සේවක අර්ථසාධක අරමුදල විසින් ඉදිරිපත් කරන ලංසු සම්බන්ධයෙන් අප හට පූර්ව දැනුමක් නැත.

සමස්තයක් වශයෙන් ගත්කල අපගේ භාණ්ඩාගාර බැදුම්කරවල ආයෝජනය 12ග02% මට්ටමක පවත්වා ගෙන ඇත. සමහර අවස්ථාවලදී අඩු කාලපරිච්ඡේදයක් ඇත. භාණ්ඩාගාර බැදුම්කර දිගුකාලීන බැදුම්කරවලට සාපේක්ෂව අඩු පොලී අනුපාතයන්ට අප විසින් මිලදී ගෙන ඇති එය සාමාන්‍ය වෙළදපොල තත්වයකි.

(ඈ) ආයෝජන ප්‍රතිපත්තියට අනුව දැනට ද්වීතියික වෙළදපොලේ රජයේ සුරැකුම්පත් විකිණීමට අවසර නැත. තවද ප්‍රාග්ධන ලාභ ලබා ගැනීම සදහා වෙළඳපොලෙහි අඩු පොලී අනුපාතයන් පවතින අවස්ථාවල අප සතුව ඇති ඉහළ පොළී අනුපාතයන් සහිත රජයේ සුරැකුම්පත් විකිණිය යුතුය. නමුත් එම විකුණා ලැබෙන මුළු මුදල නැවත ආයෝජනය කල යුත්තේ එවකට පවතින අඩු පොලී අනුපාතයන්වලටයි එම තත්වය අනාගතයේ අඩු පොලී අනුපාතයන් සහිත රජයේ සුරැකුම්පත් පමණක් ඉතිරි වීමට ඉඩ ඇති බැවින් දැනට ද්වීතියික වෙළදපොලේ රජයේ සුරැකුම්පත් විකිණීමට අධ්‍යක්ෂක මණ්ඩලය අවසර දී නැත. ආයතනයේ ප්‍රතිපත්තිය අනුව වැඩි ප්‍රතිශතයක් ආයෝජනය කල යුත්තේ භාණ්ඩාගාර බිල්පත්වල හා භාණ්ඩාගාර බැදුම්කරවලය. කෙසේ වෙතත් කල්පිරෙන තෙක් රදවා නොගෙන ද්විතියික වෙළදපොලේ විකිණීම පිළිබදව ඉදිරියේදී සලකා බැලීමට යෝජිතය.

(ඉ) අපගේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික වෙළඳ නියෝජිතයකු වීමට අවශ්‍ය නැත. ඒ සඳහා සෘජු ලංසු තැබීමේ පහසුකම (direct bidding facility) ලබා ගැනීම ප්‍රමාණවත්යි  එම පහසුකම ලබා ගැනීමට ප්‍රාථමික වෙළඳ නියෝජිතයකු වීමද අවශ්‍ය නොවේ. තවද ප්‍රාථමික වෙළඳ නියෝජිතයකු හට සම්පූර්ණ කලයුතු වගකීම් රාශියක් ඇති  උදාහරණ වශයෙන් එක් වෙන්දේසියකදී ඉදිරිපත් කරනු ලබන සුරැකුම්පත් වටිනාකමින් 1/10 සදහා ලංසු ඉදිරිපත් කල යුතුය. එවැනි කාර්යයන් ඉටුකිරීම සදහා වෙනත් පාර්ශවයන් සමග විවිධ ගණුදෙනු කල යුතුය.  වෙනත් භාහිර පාර්ශවයන්ගෙන් (Repo) මුදල් ලබා ගන්නා ක්‍රම ඇති කල යුතුය.  ඒ සඳහා නීතිමය අවකාශ නැත. සේවක අර්ථසාධක අරමුදලද තවම ප්‍රාථමික වෙළඳ නියෝජිතයකු නොවේ.  එහෙත් සෘජු ලංසු තැබීමේ පහසුකම (direct bidding facility) පමණක් ලබා ගැනීම සදහා 2016-11-22 දින මහ බැංකුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර 2017-03-08 දින සිහිකැඳවීමක් කර ඇත. මේ දක්වා මේ පිළිබදව ප්‍රතිචාරයක් ලැබී නොමැත.

(ඊ) අප මණ්ඩලය ද්විතීයික වෙළඳපොලෙන් බැදුම්කර මිලදී ගැනීමේදී අනුගමනය කරනු ලබන පිළිවෙත පහත පරිදි වේ.

I සියළුම ප්‍රාථමික වෙළඳුන්ගෙන් මිළ ගණන් කැදවීම
II ලැබුණු මිළ ගණන් සාරාංශ කිරීම
III එසේ ලංසු එවන ලද ප්‍රාථමික වෙළඳුන්ට අප බලාපොරොත්තු වන පොලී අනුපාත කාලය හා ආයෝජනය කිරීමට ඇති මුදල දැනුම් දීම
IV අප මණ්ඩලයට අවශ්‍ය පොලී අනුපාතයට හා කාලයට අදාල බැඳුම්කර ලබාදිය හැකි ප්‍රාථමික වෙළඳුන්ගෙන් මිළදී ගැනීම

ප්‍රාථමික වෙළඳපොලේ සිටින සියළුම ප්‍රාථමික වෙළඳුන්ගෙන් ලංසු ඉල්ලා ෆැක්ස් යවනු ලබයි. එහෙත් අපගේ ෆැක්ස් වලට ප්‍රතිචාර දක්වන්නේ සීමිත ප්‍රාථමික වෙළඳුන් සංඛ්‍යාවකී. තවද එම ප්‍රතිචාර දක්වන සීමිත සංඛ්‍යාවට අප මිලදී ගැනීමට අපේක්ෂිත පොලී අනුපාත සහ කාලයන් දැන්වුවද එම අවශ්‍යතාවයන් සපුරාලිය හැකි ප්‍රාථමික වෙළඳුන්ගෙන් පමණක් මිළදී ගැනීම් කරනු ලබයි. අප විසින් සියළුම ප්‍රාථමික වෙළඳුන්ගෙන් මිල ගණන් කැඳවුවද එයට ප්‍රතිචාර දැකවීම හෝ මිලදී ගැනීම ප්‍රාථමික වෙළඳුන්ගේ හැකියාව මත රදා පවතී.

ප්‍රාථමික වෙළඳුන්ගෙන් දෙදෙනෙක් පමණක් බොහෝ අවස්ථාවල ඉහළ පොලී අනුපාතයන් ඉදිරිපත් කරන බව 2016-06-20 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අධ්‍යක්ෂක මණ්ඩලය ද දැනුවත් කර ඇත.

කෙසේ වුවද,  මණ්ඩලයට Treasury Bond මිළදී ගත හැකි වන්නේ ඉහළ පොලී අනුපාතය ඉදිරිපත් කරන පාර්ශවයෙනි.

(උ) ආයෝජනය කිරීමට සිදු වූ මුදල් ප්‍රමාණය 2016-09-01 දිනට කල් පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර හා කූපන් පොලිය වන අතර, 2016-09-12 දින මහා භාණ්ඩාගාරයෙන් සභාපතිතුමා වෙත ලැබුණු නියෝගයක් මත මෙම ආයෝජනය කිරීමට සිදු වූ අතරල මේ ආයෝජනය පිළිබද පූර්ව අධ්‍යනයක් කිරීමේ අවස්ථාවක් නොමැති විය.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් සාමාජිකත්වය තුලින් ගොඩනගන ලද ක්‍රීඩා සමාජය සඳැහා වාර්ෂිකව 10% පොළී පදනම මත රු.3,000,000/-ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රදානය කර තිබූ අතර, අදාල වාරික නිසි පරිදි මණ්ඩලය වෙත ගෙවා තිබේ.

මණ්ඩලයේ ක්‍රීඩා සංගමය විසින් සේවකයින් සඳහා දෛනිකව තේපැන් සැපයීම වෙනුවෙන් සහ මණ්ඩලයේ කාර්යාල පිරිසිදු කිරීම වෙනුවෙන් සිදුකරන ගෙවීම් වලින් ඔවුන් වෙත ලබාදීඇති ඉහත ණය මුදල් වල වාරික අඩුකරනු ලැබේ.

(ආ) 2006 වර්ෂයේදි ලංකා බැංකුව විසින් අපහට ලබාදෙන සේවාවන් වෙනුවෙන් අප  මණ්ඩලය විසින් ලබාදෙනු ලබන පහසුකම් වැඩකළ යුතු බවට යෝජනා විය. මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් 2006 අප්‍රේල් මස 28 වන දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ ලේකම් ආචාර්ය පි බී ජයසුන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් මුදල් අමාත්‍යාංශයේදි එවකට අප මණ්ඩලයේ සභාපතිව සිටි ඩබ්ලිව් කරුණාජීව මහතා සමඟ සිදුවී ඇති අතර, ඒ සම්බන්ධයෙන් සභාපතිතුමා විසින් කරුණු පැහැදිලි කර ලිපියක් 2006 05 05 දින ලංකා බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි.

ඉන්පසු දෙපාර්ශවය අතර කරුණු සාකච්ඡා වි ඇති අතර 2006.06.27 දින ලංකා බැංකුව විසින් තම සේවාවන් හා පහසුකම් ලබා දීමට ඒ වන විටත් පවත්වාගෙන ගිය තැන්පතු මුදල වන රුපියල් මිලියන 10, රුපියල් මිලියන 500 ක් දක්වා වැඩිකරන ලෙස හෝ පැවති මාසික ගාස්තුව වන රුපියල් ලක්ෂය, රුපියල් ලක්ෂ 04 දක්වා වැඩි කරන ලෙස හෝ ඉල්ලීමක් කර ඇත.  ඒ අනුව රුපියල් මිලියන 500 දක්වා තැන්පතුව වැඩි කිරිමට මණ්ඩලයේ එකඟත්වය 2006 අගෝස්තු 01 දින දරණ ලිපිය මගින් සභාපතිතුමා විසින් ලංකා බැංකුව වෙත දන්වා ඇත.

මේ අනුව අප මණ්ඩලය විසින් ඒ වන විටත් පවත්වාගෙන යන ලද රුපියල් මිලියන 10 ක තැන්පතුව රුපියල් මිලියන 500 දක්වා වැඩිකිරිමට තැන්පත් කල යුතුව තිබූ රුපියල් මිලියන 490 ක මුදල (REPO) ප්‍රතිමිලදී ගැනිම් තැන්පතුවකට මාරු කිරිම සඳහා 2006.08.17 දින සභාපතිතුමාගෙන් අනුමැතිය ලබාගෙන ඇත.

මෙම රුපියල් මිලියන 500 ක්වූ මුදල ලංකා බැංකුවේ තැන්පතු ලෙස පවත්වාගෙන යනු ලබන්නේ හුදෙක් සාමාන්‍ය ආයෝජනයක් ලෙස නොවේ.  එය බැංකුව විසින් අප මණ්ඩලයේ ගිණුමට චෙක්පත් රැස්කිරිම පසුදිනය විශ්කාෂණ ලබාදීමේ සේවාව සහ සපයනු ලබන අනෙකුත් පහසුකම් වෙනුවෙන් බැංකුවේ ඉල්ලීම මත මණ්ඩලය සිදුකරන ලබන තැන්පතුවකි.  එමෙන්ම රුපියල් මිලියන 500 ක මුදල බැංකුව විසින් ඒ ඒ කාලපරිච්ඡේදයන්ට ලබාදෙන පොළි අනුපාතයන් මත එකඟවූ පරිදි  නැවත නැවත වාර්ෂිකව ආයෝජනය කරනු ලබයි.  එම ආයෝජන සඳහා වාර්ෂිකව සභාපතිතුමාගේ අනුමැතිය ලබාගෙන ඇත.

ඉහත සඳහන් තැනපතුවල ආයෝජනය නොකොට බැංකුව විසින් සිදුකරන ලද අනෙක් යෝජනාව පරිදි රුපියල් ලක්ෂ 04 දක්වා මාසිකව ගෙවන ප්‍රමාණය වැඩි කලේ නම් සෑම මසකම රුපියල් ලක්ෂ 03 බැගින් වාර්ෂිකව අමතර මිලියන 3.6 ක වියදමක් මණ්ඩලයට දැරීමට සිදුවේ  ආයෝජන ඇගයීම අනුව එය මණ්ඩලයට අවාසි සහගතය.

බැංකුව විසින් ලබාදෙන සේවාවන්ට අමතරව පහත සඳහන් වාසි සහගත තත්වයන් බැංකුව සමඟ ගණුදෙනු කිරීමේදි අප මණ්ඩලයට ලැබේ.

1. චෙක්පත් සඳහා පසුදින නිශ්කාෂණය වන මුදල දන්නා බැවින් දිනයක් කලින් ආයෝජනය කිරිමට හැකියාව ලැබීම නිසා අමතර පොළි ආදායමක් ලබාගැනීමට හැකියාවක් ලැබී ඇත.
2. ඉහත සඳහන් රුපියල් මිලියන 500 ආයෝජනය කිරිමෙන් මණ්ඩලය විසින් මේ වනවිට විශාල පොළි ආදායමක් උපයාගෙන ඇත.
3. ලංකා බැංකුව විසින් ලබාදෙන සේවාවක් වන චෙක්පත් රැගෙන යාම සඳහා අප මණ්ඩලයේ සම්පත් (සේවක මහතකු හා ප්‍රවාහන පහසුකම්) යෙදවුයේ නම් එහි ආවස්ථික පිරිවැය ඉතිරිවීම.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

(අ) අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 1994 දී රුපියල් මිලියන 15 ක් වටිනා ණයකර ඇල්කඩුව සමාගමේ ආයෝජනය කෙරුණි. එම රුපියල් මිලියන 15 ක ණයකර සදහා ලැබිය යුතු පොළි මුදල රු12,291,556.16 කි.

මෙම හිඟ මුදල සම්බන්ධයෙන් අදාල පර්ශවයන් සමඟ සාකච්ඡා කල අතර රුපියල් ලක්ෂ 5  බැගින් මාසිකව ගෙවා නිදහස් කරන බවට පොරොන්දු විය.  ඒ අනුව, 2011 නොවැම්බර් මස තෙක් වාරික 11 ක් ගෙවා ඉතිරිය හිඟව පවතී.  එමෙන්ම 2014.06.16 දින දරණ ලිපිය මගින් මහා භාණ්ඩාගාරය වෙතද යොමුකර ඇති අතර 2015.07.07 වන දින ඇල්කඩුව වැවිලි සමාගම විසින් නැවතත් ඔවුන්ගේ මුල්‍ය දුෂ්කරතාව සහ මේ සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සමග කටයුතු කරන බව දන්වා එවා ඇත.

ඇල්කඩුව සමාගම වෙතින් අයකර ගැනීමට ඇති මෙම පොළී ආදායම සම්බන්ධයෙන් 2015.11.17 දින දරණ ලිපියක් මගින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වත මණ්ඩලය විසින් ලිපියක් යොමු කර ඇත. එහි පිටපතක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද යොමුකර ඇත. අපගේ ලිපියට පිළිතුරු ලෙස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ඇල්කඩුව වැවිලි සමාගමේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂවරයාට මෙම මුදල් ගෙවන ආකාරය ඉල්ලා ලිපියක් යවා ඇති අතර, අප මණ්ඩලයට එහි පිටපතක් එවා ඇති සමාගමේ මූල්‍ය දුෂ්කරතා මේ වනතුරුත් පවතින බව 2016.08.10 දින දරණ ලිපියෙන් දැනුම්දී ඇත.

මෙයට අමතරව වණික් සමාගමෙන්ද ණයකරවල කර ඇති ආයෝජනයෙන් මුදල් ලැබිය යුතුව ඇත. එම විස්තර 4.5 (ඉ) පිළිතුරෙන් සපයා ඇත.

(ආ) මණ්ඩලයේ සේවය කරන සමස්ථ සේවකයන්ගේ සුභසාධන කටයුත්තක් ලෙස පවත්වාගෙන යන අනුරාධපුර පිහිටි නිවාඩු නිකේතනය ලාභ ලැබීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන උපායශීලි ව්‍යාපාර ඒකකයක් (Strategies Business Unit) නොවේ. නිවාඩු නිකේතනයේ නවාතැන් ගන්නා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එහි මෙහෙයුම් පිරිවැය (Operational Cost) ආවරණය කරගැනිම සඳහා පමණක් සාමාන්‍ය මුදලක් අයකර ගනී. ගිණුම්වල පෙන්වන ශුද්ධ අලාභයට හේතුවී ඇත්තේ වාර්ෂිකව කරනු ලබන ක්ෂවීම් හා එහි සේවය සඳහා යොදවා ඇති සේවකයන්ගේ වැටුප් වියදමයි.

(ඇ) 2016 වර්ෂයේදි වෙළඳපොල තුල පැවති අවාසිදායක තත්වය මත මෙම ඒකකභාර වල මිල ගණන් මෙසේ පහළ යාමක් සිදුවුවද, 2017.06. 30 දින වන විට එම ඒකකභාර වල අගය 2016.12.31 වන දිනට සාපේක්ෂව රු34,063,575 කින් වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

(ඈ) ඈවරකරණයට ලක්ව ඇති මෙම සමාගම් 02 සම්බන්ධයෙන් මේ දක්වා අවසන් තීන්දුවකට එළැඹ නැති බැවින් එම ආයෝජනයන් නැවත අයකර ගැනිමේ හැකියාව පිළිබඳව නිශ්චිත තහවුරුවක් කල නොහැක.

(ඉ) වණික් ඉන්කෝපරේෂන් ආයතනයේ පොරොන්දු නෝට්ටුවල ආයෝජිත වටිනාකම රු12ල174ල382ග19 කී. එය පහත සදහන් පරිදි සැකසී ඇත.

| | |
|---|---|
| ► රුපියල් මිලියන 15ක් වටිනා ණයකර පොළී වෙනුවෙන් නිකුත් කල පොරොන්දු නෝට්ටුවල ඉතිරි නොගෙවූ මුදල | රු. 11,262,382.19 |
| ► 1997-12-10 දින නිකුත් කරන ලද ණයකර සදහා 2001 වසරට අදාල පොළිය වෙනුවෙන් නිකුත් කල පොරොන්දු නෝට්ටුවල අගය | රු. 912,000.00 |
| ► පොරොන්දු නෝට්ටු බවට පත් වූ මුළු වටිනාකම | රු. 12,174,382.19 |

**රු. 11,262,382.19**

2002 ජනවාරි 01 දින සිට ආරම්භ කරන ලද මෙම රුපියල් මිලියන 15ට අදාල පොරොන්දු නෝට්ටු සදහා පොළී අනුපාතය 15.50% මාසිකව පොරොන්දු නෝට්ටුවලට අදාල පොලියත්, මූලික මුදලත් කොටස් වශයෙන් ගෙවිමට නියමිත වූ අතර එම පොළී සහ මූලික මුදල් ගෙවීම 2002 ජූලි මාසය දක්වා සිදුකරන ලදි. ඉන්පසු කිසිඳු ගෙවීමක් නොකල අතර ඉතිරි ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවල වටිනාකම රු 11,262,382.19 කී.

**රු. 912,000.00**

වණික් ඉන්කෝපරේෂන් ආයතනයේ අප විසින් ණයකර වල ආයෝජනය කල මූලික මුදල රු 7,450,259.00 කී. (Par Value Rs. 6,080,000.00) පොලී අනුපාතය 15.75% කි. ආයෝජන දිනය 1997-12-10 දිනය වේ ඒ වෙනුවෙන් වසර 2000 දක්වා පොළී ගෙවන ලදී. 2001 වර්ෂයට අදාල පොලී මුදල වන රු. 912,000.00 නොගෙවූ අතර එය පොරොන්දු නෝට්ටුවක් බවට පරිවර්තනය කරන ලදී. එහෙත් එම පොරොන්දු නෝට්ටු මුදලද තවම ගෙවා නැත.

වණික් ඉන්කෝපරේෂන් ආයතනයේ ණයකර වල ආයෝජනය කර ඇති වටිනාකම රු.7,450,259.00

1997 වර්ෂයේදී ආයෝජනය කර ඇති අතර ප්‍රතිව්‍යුහගත (Restructure) කිරිමෙන් පසුව 2007 සිට 2011 දක්වා ගෙවිය යුතු නමුත් එයද ගෙවා නැත.



මේ වනවිට වණික් ඉන්කෝපරේෂන් ආයතනයට එරෙහිව නඩුවක් පවතින අතර ඉදිරි නඩු දිනය 2018-01-18 වේ.

(ඊ) මණ්ඩලයේ 2016.12.31 වන දිනට පැවති සාමාන්‍ය කොටස් ආයෝජනයේ සාධාරණ අගයට සාපේක්ෂව 2017.03.31 දිනට එම ආයෝජනයන්ගේ සාධාරන අගය රු465,748,000 කින් පහත වැටුනද එම කොටස් ආයෝජනයන්ගේ සාමාන්‍ය අගය 2016.12.31 වන දිනට සාපේක්ෂව 2017.06.30 දිනට රු920,376,000 කින් වැඩිවී ඇත.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සාමාන්‍යාධිකාරි තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා අවස්ථා කිහිපයකදීම බාහිර අයදුම්කරුවන්ගෙන් අයඳුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ නමුත් සුදුසු අපේක්ෂකයෙකු තෝරා ගැනීමට නොහැකි විය. එමනිසා එම පුරප්පාඩුව පිරවීමට වෙනත් උපක්‍රමයක් අනුගමනය කිරීමට තීරණය කර ඇත.

## 4.6 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ

(අ) 2016.02.10 දින ස්ථාපිත කරන ලද විශේෂ ඒකකය මගින් 2017 ජූලි මස සිට 2017 නොවැම්බර් දක්වා රුපියල් 305,497,327 ක මුදලක් ගිණුම්වලට බැර කිරිමට පියවර ගෙන ඇති අතර, 2017/11/30 දිනට ශේෂය රු1,459,498,285 කි.

(ආ) මෙම මණ්ඩලයේ සභාපතිතුමා විසින් කම්කරු කොමසාරිස් තුමා වෙත කරන ලද ඉල්ලීම පරිදි මණ්ඩලය විසින් තාවකාලික අංක ලබාදී ඇති සේවායෝජකයින් වෙත කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති සේවක අර්ථසාධක අරමුදල් අංක ඇතුලත් සංයුක්ත තැටියක් අපවෙත ලබාදී ඇත. ඒ අනුව තාවකාලික අංක යටතේ ඇති දායක මුදල් ස්ථිර සේවක අර්ථසාධක අංක වෙත මාරු කිරිමට කටයුතු කරගෙන යනු ලැබේ.

අර්ථසාධක අරමුදල් අංක ලබාගෙන නොමැති එහෙත් තාවකාලික අංක යටතේ දායක මුදල් ගෙවන සේවායෝජකයින්ගේ ගිණුම්වල ඇති මුදල් අදාල සාමාජිකයන්ගේ ගිණුම් වලට බැර කිරිම සිදු කරනු ලැබේ.

# 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

අ) සහ (ආ)

මණ්ඩලයේ කළමනාකාරිත්වයේ අවශ්‍යතාවය මත පහත දැක්වෙන පූර්ව විගණනයක් 2016 වර්ෂයේදි සිදුකරන ලදි.

(i) ප්‍රතිලාභ අයදුම්පත් පරීක්ෂාව

| | පරීක්ෂාකර ගෙවීම සඳහා යොමු කළ අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍ය ප්‍රතිලාභ අයදුම්පත් පරීක්ෂාව | 87,544 |
| මරණ ප්‍රතිලාභ අයදුම්පත් පරීක්ෂාව | 1,114 |
| අක්ෂිකාච බද්ධ කිරීම | 541 |
| හෘදසැත්කම් | 817 |
| ස්ථිර දුබලතාවයට පත්වීම් | 73 |
| ශ්‍රමසුව | 1,540 |
| වකුගඩු බද්ද කිරීම | 23 |
| උසස්පෙළ හා 5 වසර ශිෂ්‍යත්ව | 218 |

| | |
|---|---|
| කාර්ය මණ්ඩල වෛද්‍ය බිල්පත් | 12,829 |
| **එකතුව** | **104,699** |

(ii) කාර්ය මණ්ඩල සේවය අවසන් කිරීමේදී ගෙවියයුතු හා අයවිය යුතු මුදල් පිළිබඳ පරීක්ෂාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව 26කි.

(iii) මාසික කාර්ය මණ්ඩල දිරිදීමනා ප්‍රතිශතය පරීක්ෂාකිරීම.

(iv) නිවාසණය ප්‍රතිපූර්ණය සඳහා මුදල් නිදහස් කිරීම.

(v) කාර්ය මණ්ඩලයේ වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීම් කිරීම - 2016.

(vi) ඉතිරි වාර්ෂික නිවාඩුගෙවීම් කිරීම සඳහා කාර්ය මණ්ඩල නිවාඩු පරීක්ෂාව - 2015.

ඉහත පූර්ව විගණනයට අමතරව පහත දැක්වෙන පශ්චාත් විගණන වාර්තාද ඉදිරිපත් කර තිබේ.

1. දායකත්ව හා අධිභාර මුදල් පිළිබඳ පරීක්ෂාව - 2015
2. ආයෝජන මත ප්‍රතිලාභ
3. නවම් මාවත රථගාල ආදායම් පිළිබඳ විගණනය
4. මහනුවර ප්‍රාදේශිය කාර්යාලය පිළිබඳ විගණනය
5. ස්වයං රැකියා අංශයේ උපලබ්ධි නොවූ මුදල් ඇණවුම් පිළිබඳ පරීක්ෂාව
6. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2015
7. පූර්ව විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති පාලන හා වෙනත් කරුණු සම්බන්ධයෙන් එක් එක් අවස්ථාවිදි වෙන් වෙන් වශයෙන් වාර්තා යොමු කර තිබේ

මීට අමතරව මණ්ඩලයේ සභාපතිවරයා විසින් නියම කරන ලද සියලුම විමර්ෂණ වාර්තා (ආයෝජන ප්‍රසම්පාදන ඇතුළුව) මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කර තිබේ.

(ඈ) 2016 වර්ෂයේ විගණන කටයුතු සඳහා සුදුසුකම් ලැබූ පළපුරුදු කාර්ය මණ්ඩලයට 03 කට සීමාවූ අතර, රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු කමිටුව (COPE) විසින් ලබාදුන් නිර්දේශ ප්‍රකාරව 2017 ජුනි මාසය වන විටදී සුදුසුකම්ලත් සහකාර අභ්‍යන්තර විගණකවරුන් 04 දෙනෙකු බඳවා ගන්නා ලදි

මේ අනුව බඳවාගන්නා ලද නවක නිලධාරින්ගෙන් දෙදෙනෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන) ගේ සෘජු අධික්ෂණය යටතේ පූර්ණකාලීනව ආයෝජන හා මූල්‍ය කටයුතු විගණනය සඳහා යොදවා තිබෙන අතර, අනෙකුත් දෙදෙනා ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් විගණන කටයුතු ආරම්භ කර තිබේ. තවද සහකාර සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන) හා කළමනාකරු (අභ්‍යන්තර විගණන) නව තනතුරු ඇති කිරිමටද කටයුතු කරමින් සිටින අතර, අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරින්ට නියමිත උසස්වීම්ද ලබාදෙමින් පූර්ව විගණනය හා ආයෝජන ඇතුළු පශ්චාත් විගණන කටයුතු වඩා ක්‍රමවත්ව පවත්වාගෙන යෑමටත් අභ්‍යන්තර විගණන කොට්ඨාශය ශක්තිමත් කිරිමටත් අවශ්‍ය සියළුම පියවර ගෙන තිබේ.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

(අ) සහ (ආ)

මණ්ඩලයේ අයවැයගත ආදායම 94% ක් පමණම රඳා පවතින්නේ අවදානම් රහිත රජයේසුරැකුම්පත් වල ආයෝජනය හා අනෙකුත් ස්ථාවර පොළී ආදායම් සහිත ආයෝජන උපලබ්ධි වන දිනට මූල්‍ය වෙළඳපොලේ පවතින මුල්‍ය අනුපාතයන් හා වෙළඳපොල ලැයිස්තුගත සමාගම් වලින් ලැබෙන ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ නිසාය. ඒ අනුව, එක් එක් ආයොජන අයිතමයන්ගේ ලැබෙන ආදයම් අයවැයට වඩා තත්‍ය අගය වෙනස් විය හැකි වූවත් ආයෝජන සංයුතියක් ලෙස සලකා (ෂබඩ්ඊචපැබච ඡදරචදෙකසද* අයවැය ගත ආදායමට ලඟාවීම මණ්ඩලයේ උපක්‍රමයයි ිඃචර්චැරටහ*. ඒ අනුව, 2016 වර්ෂයේදී අයවැයගත මුළු දළ ආදායම හා තත්‍ය මුළු දල ආදායම අතර වෙනස 2.2% වාසිදායක ලෙස පවත්වා ගැනීමට මණ්ඩලයට හැකිවිය.

විගණන විමසුමෙහි සඳහන් පරිදි වියදමෙහි විචලනය සලකා බැලිමේදි මණ්ඩලයට පාලනය කලහැකි සියළු වියදම් ඉතා දැඩි පාලනයක් (Tight Control) යටතේ කළමනාකරණය කරන අතර, සාමාජික ප්‍රතිලාභ වැනි සමහර වියදම් මණ්ඩලයට කිසිසේත් පාලනයකල නොහැක. වාර්ෂික අයවැය පිළියෙල කිරිමේදි සාමාජික ප්‍රතිලාභ මණ්ඩලයට ඉදිරි වර්ෂයේ වියදම් කිරිමට අපේක්ෂිත අගයන් සඳහන් කරන මුත්, තත්‍ය වියදම තීරණය කරනුයේ සාමාජිකයන් විසින් එකී ප්‍රතිලාභ ඉල්ලුම් කරනු ලැබුනහොත් පමණි. සාමාජික ප්‍රතිලාභ සම්බන්ධයේ අයවැය ගත වියදම හා තත්‍ය වියදම සසඳා බලා අයවැය කළමනාකරණ පාලන උපක්‍රමයක් ලෙස භාවිතා නොවන බව ප්‍රකාශ කිරිම ප්‍රායෝගික නොවේ.

කෙසේ වුවත්, වර්ෂයේ අයවැය ආදායම සහ වියදම හා තත්‍ය ආදායම සහ වියදම අතර වෙනස, පිලිවෙලින් 2.2% හා 2.3% අතර පවත්වාගෙන යාමෙන් සනාථ වනුයේ ඉතා හොඳ අයවැය පාලනයක් මණ්ඩලය සතු බවයි.

## 5.3 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

2016 වර්ෂයට අදාලව සියළුම ප්‍රසම්පාදනයන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා මණ්ඩලයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූළව සිදුකර ඇත. ඒ අනුව, සියළු ප්‍රසම්පාදනයන් සිදුකිරිමේදි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තාක්ෂණ ඇගයිම් කමිටු පත් කිරිම හා ටෙන්ඩර් කමිටු පත්කර සිදුකර ඇති අතර, රු500,000 ක් දක්වාවූ සියළු ටෙන්ඩර, ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශයෙන් පසු සභාපතිතුමා විසින් අනුමත කර ඇති අතර රු500,000 ට වැඩි සියළු ටෙන්ඩර, ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

## 5.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක නොකිරිම

මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා මණ්ඩලයේ සභාපතිවරයා වන බවට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තියේ ඇති ප්‍රතිපාදන සංශෝධනය කළයුතු බවට 2016 අගෝස්තු 26 පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදි යෝජනා විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධන කිරිම 2009 වර්ෂයේදි ආරම්භවී මහත් පරිශ්‍රමයකින් පසුව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා දැනටමත් යොමුකර ඇත. මෙකී නව සංශෝධනය කෝප් කමිටුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත යෝජනා කරන විටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට කලයුතු සංශෝධන යොමුකර තිබිණි. එබැවින් දැනට පනතට යෝජිත සංශෝධනය සිදුකිරිමෙන් පසුව නැවත සංශෝධනයක් ලෙස කෝප් කමිටුව යෝජිත, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 5 (2) වගන්තියට සිදුකල යුතු වෙනස්කම් සිදුකිරිමට බලාපොරොත්තු වේ.

# 6 පද්ධති හා පාලන

(අ) ගිණුම්කරණය

මණ්ඩලය මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත වලට අනුකූලව :ඛණී සහ් ඛපඍී* සිදුකර ඇත.

(ආ) මෙහෙයුම් පාලනය

1981 වර්ෂයේ සිට 2014.12.31 දින දක්වා කාලය තුල දායක මුදල් ලෙස රු.මිලියන 135,779 ලැබී ඇති අතර, 2017.12.26 දිනට එක් එක් සාමාජිකයාගේ ගිණුම් වලට බැර නොකර සේවායෝජක ගිණුම් වල රඳවාගෙන ඇති සාමාජික මුදල් වල වටිනාකම රුපියල් මිලියන 1,519 කි. මෙම වටිනාකම ලැබී ඇති සාමාජික මුදල් වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1.12% වේ. (වර්ෂ අනුව එක් එක් සාමාජික ගිණුම් වලට බැරකර නොමැති සේවායෝජක ගිණුම් වල රඳවාගෙන ඇති වටිනාකම් දැක්වෙන ලේඛනයක් මේ සමග ඉදිරිපත් කරමි)

මෙම මුදල් සඳහා නිවැරදි සාමාජික විස්තර සේවායෝජක ආයතන වලින් සහ සේවක අර්ථසාධක අරමුදලෙන් ලබාගෙන සාමාජික ගිණුම් වලට ගැලපුම් කිරීම සඳහා වෙනම විශේෂ ඒකකයක් 2016.02.10 දින ආරම්භ කර අවශ්‍ය පියවර ගෙන ඇත.

ඊට අමතරව පහත සඳහන් නොවැලැක්විය හැකි හේතු මත සාමාජික ගිණුම් වලට සාමාජික මුදල්

බැරකිරීම ප්‍රමාද වී ඇති බව දැන්වීමට කැමැත්තෙමු.

1 සේවායෝජකයින් සාමාජික මුදල් ගෙවා ඇතත්, එම මුදල් බැර කිරීමට අවශ්‍ය සේවක විස්තර ලබානොදීම.

2 ආයතන කිහිපයක් සඳහා එක් චෙක්පතක් මගින් සාමාජික මුදල් ගෙවා ඇති අවස්ථා වලදී, එම මුදල් වෙන් වෙන් වශයෙන් ආයතන සඳහා විභජනය කළයුතු ආකාරය පැහැදිලි කරගැනීමට අපහසුවීමග (අදාල සේවායෝජක ආයතන දැනට අක්‍රිය තත්ත්වයේ පැවතීම).

3 ආයතන විසින් ලබාදෙනු ලබන අර්ධ වාර්ෂික වාර්තා වල ඇතුලත් දත්ත අපැහැදිලි වීමග (අදාල සේවායෝජක ආයතන දැනට අක්‍රිය තත්ත්වයේ පැවතීම).

4 ආයතන වල කළමනාකාරීත්වය වෙනස්වීම නිසා, ඊට පෙර කාලවලට අදාල තොරතුරු ලබාග ැනීමට නොහැකිවීම සහ එම කාලවල පැන නැගී ඇති ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා නව කළමනාකාරීත්වය සහයෝගය ලබා නොදීම.

5 විශේෂයෙන් වතු ආශ්‍රිත ආයතන වල සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් නොමැතිවීම නිසා සහ නම් වල කොටස් පමණක් සේවායෝජකයින් ලබාදීම හේතුවෙන් හඳුනාගැනීමේ ගැටළු පැවතීම.

(ඇ) අරමුදල් ආයෝජනය

I, ii සේවාදායකයන්ගෙන් එකතුකර ගන්නා මුදල් වල උපරිම ආරක්ෂිතභාවය රැකෙන පරිදි අරමුදලින් 94% ක් අවධානම් රහිත හා ස්ථාවර පොළී අනුපාත සහිත ආයෝජන කර ඇති අතර, 6% ක් පමණ අවදානම් සහිත ආයෝජන වල යොදවා ඇත. 2016 වර්ෂයේ දල ආයෝජන ආදායම ලෙස 10.51% ක් උපයා ගැනිම මණ්ඩලය සමත්වී ඇත.

(ඈ) අයවැය පාලනය

වර්ෂයේ අයවැය ආදායම සහ වියදම හා සත්‍ය ආදායම සහ වියදම අතර වෙනස, පිලිවෙලින් 2.2% හා 2.3% අතර පවත්වාගෙන යාමෙන් සනාථ වනුයේ ඉතා හොඳ අයවැය පාලනයක් මණ්ඩලය සතු බවයි.

(ඉ) අභ්‍යන්තර විගණනය


2016 වර්ෂයේ විගණන කටයුතු සඳහා සුදුසුකම් ලැබූ පළපුරුදු කාර්ය මණ්ඩලයට 03 කට සීමාවූ අතර, රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් වූ පාර්ලිමේන්තු කමිටුව (කෝප්) විසින් ලබාදුන් නිර්දේශ ප්‍රකාරව 2017 ජුනි මාසය වන විටදී සුදුසුකම්ලත් සහකාර අභ්‍යන්තර විගණකවරුන් 04 දෙනෙකු බඳවා ගන්නා ලදි.


මේ අනුව බඳවාගන්නා ලද නවක නිලධාරින්ගෙන් දෙදෙනෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ගේ සෘජු අධීක්ෂණය යටතේ පූර්ණකාලීනව ආයෝජන හා මූල්‍ය කටයුතු විගණනය සඳහා යොදවා තිබෙන අතර, අනෙකුත් දෙදෙනා ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් විගණන කටයුතු ආරම්භ කර තිබේ. තවද, සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) හා කළමනාකරු (අභ්‍යන්තර විගණන) නව තනතුරු ඇති කිරීමටද කටයුතු කරමින් සිටින අතර, අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරින්ට නියමිත උසස්වීම්ද ලබාදෙමින් පූර්ව විගණනය හා ආයෝජන ඇතුළු පශ්චාත් විගණන කටයුතු වඩා ක්‍රමවත්ව පවත්වාගෙන යෑමටත්, අභ්‍යන්තර විගණන කොට්ඨාශය ශක්තිමත් කිරීමටත් අවශ්‍ය සියළුම පියවර ගෙන තිබේ.





**මහින්ද මඩිහහේවා**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය


# STATISTICAL ANNEXURE












| | (Rs:000) | (Rs:000) | (Rs:000) | (Rs:000) | (Rs:000) | % |
|---|---|---|---|---|---|---|
| Income | | | | | | |
| | 23,492,350 | 20,274,204 | 19,056,836 | 17,331,497 | 14,663,189 | 10% |
| | (6,759,768) | (6,013,817) | (5,287,328) | (4,752,333) | (4,189,948) | 10% |
| | 486,194 | 360,582 | 309,256 | 318,660 | 208,701 | 18% |
| | 68,592 | 833,850 | 894,917 | 68,178 | (304,378) | - |
| | 331,650 | 320,139 | 317,455 | 286,047 | 258,892 | 5% |
| Total Income | 17,619,018 | 15,774,958 | 15,291,136 | 13,252,049 | 10,636,456 | 11% |
| Expense | | | | | | |
| | 985,963 | 994,389 | 813,000 | 720,022 | 632,244 | 9% |
| | 140,819 | 132,608 | 134,786 | 125,307 | 110,702 | 5% |
| | 2,904 | 1,988 | 3,041 | 2,657 | 2,485 | 3% |
| | 454,466 | 429,610 | 380,512 | 314,372 | 289,908 | 9% |
| | 15,290 | 16,896 | 18,605 | 18,863 | 20,878 | -6% |
| | 173,630 | 148,737 | 209,073 | 128,958 | 118,220 | 8% |
| Total Operating Expenses | 1,773,072 | 1,724,228 | 1,559,017 | 1,310,179 | 1,174,437 | 9% |
| | 15,845,946 | 14,050,730 | 13,732,119 | 11,941,870 | 9,462,019 | 11% |
| | 2,394,498 | 2,060,646 | 1,947,132 | 1,781,100 | 1,504,018 | 10% |
| Profit after Taxation | 13,451,448 | 11,990,084 | 11,784,987 | 10,160,770 | 7,958,001 | 11% |





| | (Rs:000) | (Rs:000) | (Rs:000) | (Rs:000) | (Rs:000) | % |
|---|---|---|---|---|---|---|
| Assets | | | | | | |
| | 614,332 | 841,949 | 2,653,133 | 1,043,164 | 414,831 | 8% |
| | 2,286,723 | 1,829,018 | 733,167 | 7,550,428 | 6,871,632 | -20% |
| | 10,140,142 | 8,973,928 | 8,592,784 | 485,835 | 485,835 | 84% |
| | 222,454,509 | 198,320,192 | 169,651,791 | 153,137,676 | 135,407,687 | 10% |
| | 1,343,876 | 1,336,538 | 7,535,296 | 7,418,615 | 7,234,690 | -29% |
| | 9,145,957 | 7,865,283 | 6,512,779 | 5,478,972 | 4,451,654 | 15% |
| | 176,378 | 173,144 | 187,008 | 183,067 | 18,824 | 56% |
| | 192 | 266 | 369 | 514 | 717 | -23% |
| | 3,200,000 | 3,200,000 | 3,200,000 | 3,200,000 | 3,200,000 | 0% |
| Total Assets | 249,362,110 | 222,540,319 | 199,066,327 | 178,498,271 | 158,085,870 | 10% |
| | 81,082 | 33,582 | 68,330 | 122,359 | 109,797 | -6% |
| | 304,104 | 351,851 | 267,841 | 235,917 | 156,894 | 14% |
| | 87,841 | 213,754 | 76,923 | 41,482 | 37,497 | 19% |
| Total Liabilities | 473,027 | 599,187 | 413,094 | 399,758 | 304,188 | 9% |
| | 248,889,083 | 221,941,132 | 198,653,233 | 178,098,513 | 157,951,099 | 10% |
| Total Liabilities and Equity | 249,362,110 | 222,540,319 | 199,066,327 | 178,498,271 | 158,255,287 | 10% |



# Other Annexures

# BRANCH NETWORK




01 No.70, Martyn Road,
Jaffna
+94 21-2220010

02 No. 27, Sri Lanka Red Cross Building,
Kachchiri Road, Kurunegala
+94 37-2228194

03 No: 247, Main Street,
Kegalle
+94 35-2222991

04 No: 23, Wijayarama Rd, Queen Mary's
Mawatha, Gampaha
+94 33-2234520

05 No: 122, Nawala Road, Narahenpita,
Colombo 05
+94 11 2369698

06 No: 92 A, Kirula Road, Narahenpita,
Colombo 05
+94 11 2368616

07 No: 44/5, Narahenpita Road,
Nawala
+94 11 2806834

08 No: 294, Galle Rd,
Kalutara North
+94 34-2237722

09 No: 90/1/1, Main, Street,
Ratnapura
+94 45-2222529

10 No: 80/C1, Havelock Place,
Galle
+94 91-2245814

11 No: 63/2, Kalidasa road,
Matara
+94 41-2222625

12 No: 114, Gonnoruwa Road,
Hambantota
+94 47-2220655

13 No: 9A, Main Road, Hatton
+94 51-2223840

14 No.693, Malwatta Road,
Ampara
+94 63-2222845

15 No. 230, Keppitipola Mawatha,
Badulla
+94 55-2224482

16 No; 79, Housing Secretariat,
Yatinuwara Veediya, Kandy
+94 81-2233793

17 No: 87/25, 1st Lane, Dharmapala Mw,
Anuradhapura
+94 25-2222185

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
1 වන මහළ, කම්කරු මහ ලේකම් කාර්යාලය,
කොළඹ 05.
දුරකථන : 011-2581704
ෆැක්ස් : 011-2806832
ඊ මේල් : finance@etfb.lk
වෙබ් : www.etfb.lk